*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -7/2022- (1), ගරු ගයන්ත කරුණාතිලක මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා (කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஷஷீந்திர ராஜபக்ஷ - சேதனப் பசளை உற்பத்தி மேம்பாடு மற்றும் விநியோக ஒழுங்குறுத்துகை மற்றும் நெல், தானிய வகைகள், சேதன உணவுகள், மரக்கறிகள், பழவகைகள், மிளகாய், வெங்காயம் மற்றும் உருளைக்கிழங்குச் செய்கை மேம்பாடு, விதை உற்பத்திகள் மற்றும் உயர் தொழில்நுட்ப கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Shasheendra Rajapaksa - State Minister of Promoting the Production and Regulating the Supply of Organic Fertilizer and Paddy and Grains, Organic Foods, Vegetables, Fruits, Chillies, Onion and Potato Cultivation Promoting, Seed Production and Advanced Technology Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 2 -36/2022- (1), ගරු බුද්ධික පතිරණ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## බලන්ගොඩ සිට ගුරුබැවිල, මැද්දෙකන්ද සහ හෙළවත්ත දක්වා බස් සේවය : ගමන් වාර සංඛ්‍යාව
## பலாங்கொடையிலிருந்து குருபெவில, மெத்தேகந்த மற்றும் ஹெலவத்த வரையான பேருந்துச் சேவை: பயணத் தடவைகள்
## BUS SERVICE FROM BALANGODA TO GURUBEWILA, MEDDEKANDA AND HELAWATTA: NUMBER OF JOURNEYS

246/2022

**3. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බලන්ගොඩ සිට ගුරුබැවිල, මැද්දෙකන්ද සහ හෙළවත්ත යන ගම්වලට දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස් රථ ගමන් වාර සංඛ්‍යාව මෑතක සිට අඩු කර තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දැඩි අපහසුතාවකට ලක් වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත ගම්මාන සඳහා දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස් රථ ගමන් වාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බස් රථ ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பலாங்கொடையிலிருந்து குருபெவில, மெத் தேகந்த, ஹெலவத்த ஆகிய கிராமங்களுக்கு ஒரு நாளில் பயணிகள் பேருந்துகள் செயற்படுத் தப்படும் தடவைகளின் எண்ணிக்கை அண்மைக் காலமாக குறைக்கப்பட்டுள்ளதாகவும்;

(ii) இதனால் அப்பிரதேச மக்கள் பாரிய சிரமத்திற்கு உள்ளாகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கிராமத்திற்கு நாளொன்றுக்குச் செயற் படும் பயணிகள் பேருந்துகளின் பயணத் தடவைகளின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) அப்பேருந்து பயணத் தடவைகளின் எண்ணிக் கையை அதிகரிப்பதற்கு அமைச்சினால் மேற் கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Is he aware that -

(i) the number of passenger bus journeys conducted daily from Balangoda to Gurubewila, Meddekanda and Helawatta villages have been reduced recently; and

(ii) the people living in the aforesaid villages are facing immense difficulties as a result of it?

(b) Will he inform this House -

(i) the number of passenger bus journeys conducted daily to aforesaid villages, separately; and

(ii) the measures that will be taken by the Ministry to increase the number of passenger bus journeys conducted to aforesaid villages?

(c) If not, why?

**ගරු දිලුම් අමුණුගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலும் அமுனுகம - போக்குவரத்து அமைச்சர் )
(The Hon. Dilum Amunugama - Minister of Transport)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i), (ii) නැත.

මේ සම්බන්ධව මගී පැමිණිලි ඉදිරිපත්ව නොමැත.

(ආ) (i)

| ගමන් මාර්ගය | දැනට ධාවනය වන ගමන් වාර ගණන |
|---|---|
| බලන්ගොඩ - මැද්දෙකන්ද | 10 |
| බලන්ගොඩ - ගුරුබැවිල | 08 |
| බලන්ගොඩ - හෙළවත්ත | දැනට ධාවනය නොවේ. |

(ii) ඔව්. මේ දිනවල බලන්ගොඩ හෙළවත්ත මාර්ගයේ අලුත්වැඩියා කටයුතු සිදුවේ. එම කටයුතු නිම වූ පසු නියමිත ගමන් වාර 3 ධාවනයට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරෙහි සවිස්තරාත්මකව කරුණු සඳහන් නොවුණත්, එමඟින් යම් උත්තරයක් ලැබුණා. ගරු ඇමතිතුමනි, මම මේ වෙලාවේ ඔබතුමාට පැහැදිලි කරන්න උත්සාහ කරන, ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වන කාරණය මෙකයි. මේ වනකොට ඔබතුමන්ලා SLTB එකේ පෙට්‍රල් ෂෙඩ් ටික භාවිත කරමින් පෞද්ගලික අංශයටත් ඉන්ධන නිකුත් කරන්න පටන්ගෙන තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක රට පුරා ක්‍රියාත්මක වනවාද කියලා. ඔබතුමා ඒ ගැන සඳහන් කරන්න. ඒකත් එක හේතුවක් වෙලා තිබෙනවා, කෙටි ගමන් වාර යන සමහර SLTB බස් රථ නතර කරලා ඒවා අත්‍යවශ්‍ය ගමන් වාර පමණක් යන තත්ත්වය ඇති වීමට. පාසල් දරුවන් රැගෙන යන ගමන් වාරවලදී බස් රථ ධාවනය වන බව ඇත්ත. නමුත්, අනෙක් ගමන් වාර ගණන අඩු කරනවා. ඒ කියන්නේ, පාසල් විවෘත කරන වෙලාවට ඒ බස් රථ ගමන් වාරය යනවා; නැවත පාසල් අවසන් වන වෙලාවටත් ගමන් වාරය යනවා. ගරු ඇමතිතුමනි, බලන්ගොඩ මැතිවරණ කොට්ඨාසයේ තිබෙන ගුරුබැවිල, රාවණාකන්ද ආදී අතිදුෂ්කර ප්‍රදේශ රාශියක පැවැති ගමනාන්ත බස් රථ ධාවනය අද නතර වෙලා තිබෙනවා. SLTB එකේ නිලධාරින්ගෙන් ඇහුවාම ඒ අයත් ඒ බව තහවුරු කරනවා. ගරු ඇමතිතුමනි, එය රට පුරා තිබෙන තත්ත්වයක්. ඇඹිලිපිටියේත් එය සිද්ධ වෙනවා. ඔබතුමා ඒකට විකල්පයක් යෝජනා කරනවාද? පෞද්ගලික බස් රථවලට බලපා තිබෙන ප්‍රශ්නයත් රජයේ ප්‍රශ්නයක්. නමුත් ගරු ඇමතිතුමනි, ධාවනය වෙච්ච SLTB බස් රථ ධාවනය නතර කිරීම වළක්වන්න ඔබතුමා ගන්නා පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු පළමුවැනි කාරණයට උත්තරය මෙකයි. ඔබතුමා කියපු විධියට, පෞද්ගලික බස් රථවලට ඉන්ධන සැපයීම නිසා ශ්‍රී ලංගම බස් ගමන් වාර නතර වීම සිදු වන්නේ නැහැ. මොකද, අප පහුවදාට ශ්‍රී ලංගම බස්රථවලට ප්‍රමාණවත් පරිදි ඉන්ධන අනිවාර්යයෙන් තියාගෙන අමතර ඉන්ධන ටික තමයි පෞද්ගලික බස් රථවලට සපයන්නේ. අපි ඒ දෙකටම ඇණවුම් කරනවා. වැඩිපුර ඉන්ධන ආවොත් විතරයි අපි පෞද්ගලික අංශයට ඉන්ධන සපයන්නේ. එහෙම ආවේ නැත්නම්, SLTB එකේ රථවලට ලැබෙන ඉන්ධන පෞද්ගලික බස් රථවලට සපයන්නේ නැහැ. පෞද්ගලික බස් රථවලට ඉන්ධන සැපයීම නිසා ශ්‍රී ලංගම බස් ගමන් වාර නතර වෙලා නැහැ. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියූ කාරණය සම්බන්ධයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා අපි ශ්‍රී ලංගම සේවකයන්ටත් යම්තාක් දුරකට ඉලක්ක ලබා දී තිබෙන බව.

අපට අය වැයෙන් වෙන් වෙන මුදල ගැන බැලුවත්, මේ පවතින ආර්ථික තත්ත්වය නිසා ඒකෙන් රුපියල් මිලියන 4,000ක පමණ මුදලක් අඩු කර තිබෙනවා. ඒ එක්කම, අනාර්ථික මාර්ගවලට ගෙවන මුදල් ප්‍රමාණයෙනුත් යම් කොටසක් අඩු වෙලා තිබෙනවා. අපි විශේෂයෙන්ම ඩිපෝවලට ඉලක්කයක් දී තිබෙනවා, ඒ අය ලාභ ලබන්න ඕනෑ කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ පාසල් ගමන් වාර, රාජකාරි ගමන් වාර, අන්තිම බස් රථය වාගේ ඒවා අපි අනිවාර්ය කර තිබෙනවා. නමුත් සමහර වෙලාවට ගමන් වාර අත්‍යවශ්‍ය නොවන අවස්ථාවල, -දැන් ආදායම ඉතාම අඩු වෙලාවේ- බස් රථ ධාවනය කළ යුතු ද, නැද්ද කියන කාරණය සොයා බලන්න, ඒ පිළිබඳ නැවත සිතා බලන්න අපි සුළු අවසරයක් දී තිබෙනවා. ඔබතුමා කියපු කාරණය සමහර මාර්ගවලට අදාළ වෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. උදේ ඉඳන් රෑ වනකල් SLTB බස් රථ දුවන එක නේ, අපි දැකලා පුරුදු වෙලා තිබෙන්නේ. එක් මඟියෙකු සිටියත්, මඟීන් කිසිවකු නොසිටියත් එම බස් රථ ධාවනය කරවනවා. ඒක හැම දාම කරගෙන යන්න අමාරු තත්ත්වයක් තිබෙනවා. එහෙමයි කියලා අපි දුෂ්කර මාර්ගවල බස් රථ ධාවනය නතර කරන්නේ නැහැ. නමුත්, යම් විධියක පාලනයක් කරන්න අපට සිද්ධ වෙනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු හේෂා විතානගේ මහතා]

අප ශ්‍රීලංගම බස් රථ මඟින් ලබා දෙන සේවාව ලාභ ලබන තැනකට ගේන්න බැහැ; ඉතිහාසයේ කවදාවත් එහෙම වෙලාත් නැහැ. මොකද, ඒක සේවාවක් නේ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියන විධියට, ගම්මානවලට ශ්‍රීලංගම ලබා දෙන බස් රථ සේවාවෙන් ලාභයක් ලබන්න බැහැ. නමුත්, ඒක අප මහ ජනතාවට ලබා දෙන සේවාවක්.

ගරු ඇමතිතුමනි, මට දැනගන්න අවශ්‍ය මේකයි. ඉන්ධන මිල වැඩි වීම නිසා බස් ගාස්තු විශාල වශයෙන් වැඩි කරන්න ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමා දක්ෂයෙකු විධියට ගැමුණු විජේරත්න මහත්මයා එහෙම හිමින් සැරේ සාක්කුවට දාගෙන, ඒ ගැටලුව පොඩ්ඩක් කළමනාකරණය කරගෙන තිබෙන බව මම දකිනවා. කෙසේ හෝ මේ ප්‍රශ්නය නිසා ඔය කියන ප්‍රදේශවල, අපේ ප්‍රදේශවල අහිංසක ජනතාවට, තේ දලු කඩලා එදා වේල සොයා ගන්නා මිනිසුන්ට තමන්ගේ දරුවන් ඉස්කෝලෙට යවන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ තිබෙන අර්බුදය ඉවර වෙන්නේ නැති බව. විෂයය භාර ඇමතිතුමා මාස ගණනක් තිස්සේ දින වකවානු කිව්වා, "තෙල් අර්බුදය හෙට ඉවරයි. අනිද්දා ඉවරයි" කියලා.

නමුත්, වැඩක් වුණාද? හැම දාම තෙල් ප්‍රශ්න. මන්ත්‍රීලා වෙච්ච වරද නිසා අපටත් තෙල් ටිකක් ගහගන්න විධියක් නැහැ. අපි පෝලිමේ ගිහිල්ලා හිටියත් අපට "හූ" කියනවා, ඔබතුමන්ලා කරන වැඩ නිසා. අපිට ඇමතිතුමන්ලාගේ driversලාට, ලේකම්වරුන්ට කියලා තෙල් ගෙන්වා ගන්නත් බැහැ. ඒ නිසා තෙල් ටික ගහන්න ගිහිල්ලා අපිත් දුක් විඳිනවා. ඔය කියන අසත්‍ය කථාවලින් නම් වැඩක් නැහැ. මේ අහිංසක මිනිසුන්ට සහනයක් සලසන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි. අඩු ගණනේ අපේ දරුවන් ගමන් කරන පාසල් බස් රථ ටික සම්බන්ධයෙන් හෝ යම්කිසි සහනයක් ලබා දෙන වැඩසටහනක් තිබෙනවාද, ගරු ඇමතිතුමනි?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ඔබතුමා කියන්නේ බස් රථ ධාවනය කරවන්න කියන එක ද, එහෙම නැත්නම් බස් ගාස්තුව සම්බන්ධයෙන් සහනයක් දෙන්න කියන එක ද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே)
(The Hon. Hesha Withanage)
මම කියන්නේ ගාස්තු පිළිබඳව, ගරු ඇමතිතුමනි. බස් ගාස්තු වැඩි වුණාට පසුව එය ගෙවා ගන්න බැරි වෙනවා නේ. ඒ නිසා සාමාන්‍ය ජනතාවට සහනයක් ලබා දෙන්න පුළුවන් ක්‍රමවේදයක් ආණ්ඩුවට නැද්ද?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
අපි දැන් "සිසු සැරිය" බස් සේවාව ක්‍රියාත්මක කරනවා. ඔබතුමා දන්නවා, සිසු සැරිය බස් ධාවනය කරන්නේත් percentage එක අඩුවෙන් බව. ඩීසල් මිලට සාපේක්ෂව බස් ගාස්තු වැඩි කළා නම්, විශාල ගණනකින් බස් ගාස්තු වැඩි කරන්න අපිට සිදු වෙනවා. නමුත් අපි අවම ගණනකින් තමයි බස් ගාස්තු වැඩි කරලා තිබෙන්නේ. කෙසේ වෙතත්, සීසන් ටිකට් එක ලබා දෙන එක, ඒ වගේම සිසු සැරිය ආදිය ක්‍රියාත්මකයි. එහෙම සිසු සැරිය බස් ධාවනය නොවන මාර්ගයක් කොහේ හරි තිබෙනවා නම්, ඔබතුමා අපව දැනුවත් කරන්න. මොකද, අපි කොච්චර බැලුවත් අපටත් පෙනෙන්නේ නැතුව පාසල් වේලාවේ බස් ධාවනය නොවන මාර්ගයක් කොහේ හෝ තිබෙන්න පුළුවන්. එහෙම තත්ත්වයක් කොහේ හරි තිබෙනවා නම්, අපට ඒ ගැන කිව්වොත් අපි ඒක නිවැරදි කරන්නම්.

පාසල් ගමන් වාර, රාජකාරි වේලාවන් සහ අවසාන ගමන් වාර ලාභ හෝ පාඩු පිට අනිවාර්යයෙන්ම ධාවනය කරන්න අවශ්‍යයි කියලා අපි උපදෙස් දීලා තිබෙනවා. අපට දැනට දිය හැක්කේ මෙවැනි සහනයක් තමයි. ඊට එහා සහනයක් ලබා දීමට දැනට පුළුවන්කමක් නැහැ. නමුත් ඉදිරියේ දී ඉන්ධන මිලෙහි යම් වෙනසක් ඇති වුණොත්, මොකක් හරි සහනයක් ලබා දෙන්න පුළුවන්.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමා කැමති නම් පමණක් ඔබතුමා ඉතාම කෙටියෙන් අහන්න. මොකද, අතුරු ප්‍රශ්න දෙකම අහලා ඉවරයි.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, අනාර්ථික මාර්ග බස් රථ ධාවනය සඳහා රජයෙන් මුදල් ලබා දෙනවා. ඒ කියන්නේ, "නිසි සැරිය", "සිසු සැරිය" සඳහා බිලියන 11ක් සෑම වර්ෂයකම ලබා දෙනවා. එහෙම ලබා දෙන්නේ, ඔබතුමා කිව්වා වාගේ එක්කෙනෙක් ගියත් ඒ බස් රථය ධාවනය වෙන්න ඕනෑ නිසා. ආණ්ඩුවෙන් ඒ මුදල් මෙවර දීලා නැද්ද? ඒ නිසාද මේ විධියට බස් රථ ධාවනයෙන් ඉවත් වෙලා තිබෙන්නේ?

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ගරු මන්ත්‍රීතුමනි, හිටපු රාජ්‍ය ඇමතිවරයා හැටියට ඒ ගැන ඔබතුමා දන්නවා. අය වැයෙන් හැම අමාත්‍යාංශයකම යම් මුදල් කප්පාදුවක් සිදු කරලා තිබෙනවා. ඒක රහසක් නොවෙයි. ඒක ඔබතුමන්ලාත් දැක්කා නේ. ඒ වාගේම, ප්‍රවාහන අමාත්‍යාංශයෙනුත් යම් මුදල් කප්පාදුවක් සිද්ධ වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, භාණ්ඩාගාරයෙන් ලංගමට මුදල් ගෙවන්නේ මේවාට කියලා. අනාර්ථික මාර්ගවලට තමයි ගෙවන්නේ. එතකොට කැපෙනවා නම් කැපෙන්නෙත් ඒකෙන්. හැබැයි, අපි ඒ වෙනුවෙන් විකල්ප ක්‍රියා මාර්ග අරගෙන තිබෙනවා. හැබැයි, ඔබතුමා කියන ආකාරයටවත්, ඒ වාගේම ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කියපු විධියටවත් නොවෙයි අපි ඒ සඳහා කටයුතු කර තිබෙන්නේ. මේ අනාර්ථික මාර්ගවලට ලබා දෙන මුදල් කැපෙනකොට, කොහෙන් හෝ ලාභ ලබන එක ගැනත් වැඩි අවධානයක් යොමු කරන්න අපට සිදු වෙනවා. ඒක තමයි සිදු විය යුත්තේ. හැබැයි අපි ඒක කරන්නේ ඔබතුමන්ලා කියූ පරිදි ඒ දේවල් නතර කරලා නොවෙයි.

## ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 85,000ක් අළෙවි කිරීම: විස්තර

85,000 மெட்ரிக் டொன் கனிம மணல் விற்பனை: விபரம்

SALE OF 85,000 METRIC TONNES OF MINERAL SAND: DETAILS

570/2022

**4.** ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 85,000ක් අළෙවි කරන ලද දිනය කවරේද;

(ii) එම ඛනිජ වැලි මිලදී ගැනීම සඳහා අයදුම් කරන ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඛනිජ වැලි ලබා ගන්නා ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගනුදෙනුවේදී මූල්‍යමය අලාභයක් සිදුවී ඇති බවට ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "லங்கா மினரல் சேன்ட்ஸ் லிமிடட்" நிறுவனத்தினால் 85,000 மெட்ரிக் டொன் கனிம மணல் விற்பனை செய்யப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி கனிம மணலைக் கொள்வனவு செய்வதற்காக விண்ணப்பித்த ஒவ்வொரு கம்பனியினதும் பெயர், முகவரி மற்றும் முன்வைக்கப்பட்ட விலைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) அவ்வாறு கனிம மணலைக் கொள்வனவு செய்த ஒவ்வொரு கம்பனியினதும் பெயர், முகவரி மற்றும் விலைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மேற்படி கொடுக்கல்வாங்கலின்போது நிதி ரீதியான நட்டம் ஏற்பட்டுள்ளதாக முன்வைக்கப்பட்டுள்ள குற்றச்சாட்டுக்கள் தொடர்பில் அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the date on which the Lanka Mineral Sands Limited sold 85,000 metric tonnes of mineral sand;

(ii) the name and the address of each company that had applied for purchasing the mineral sand concerned and the price quoted by each of them, separately;

(iii) the name and the address of each company which obtained the mineral sand concerned and the price quoted by each such company; and

(iv) the measures that will be taken by the Ministry regarding the allegations levelled to the effect that a financial loss has occurred during the transaction concerned?

(b) If not, why?

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් දැනුම් දී ඇති පරිදි ඛනිජ වැලි මෙට්‍රික්ටොන් 85,000ක් අළෙවි කළ දිනය පහත පරිදි වේ.

ටෙන්ඩරය ප්‍රසිද්ධ කළ දිනය - 2020.06.13

ටෙන්ඩරය විවෘත කළ දිනය - 2020.07.28

ඛනිජ වැලි අළෙවි කළ දිනය (ටෙන්ඩරය ප්‍රදානය කළ දිනය: 2020.10.28)

(ii) එම ඛනිජ වැලි මිලදී ගැනීම සඳහා අයදුම් කරන ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් පහත පරිදි වන බව ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් දැනුම් දී ඇත.

| නම | ලිපිනය | ඉදිරිපත් කරන ලද මිල ගණන් (ඉල්මනයිට් මෙට්‍රික්ටොන් 1ක් සඳහා) |
|---|---|---|
| රක්ෂානා ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් | අංක 181, මෝදර වීදිය, කොළඹ 15. | ඇමෙරිකන් ඩොලර් 165.2 |
| ඔස්මෝසිස් ප්‍රයිවට් ලිමිටඩ් | අංක 107/22, බලගල පාර, හැදල, වත්තල. | ඇමෙරිකන් ඩොලර් 163 |
| OSC මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් | අංක 107/22, බලගල පාර, හැදල, වත්තල. | ඇමෙරිකන් ඩොලර් 146 |
| සෙරන්ඩිබ් ලොජිස්ටික් වල්ඩ්වයිඩ් ප්‍රයිවට් ලිමිටඩ් | අංක 51, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07. | ඇමෙරිකන් ඩොලර් 130.5 |

(iii) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් වාර්තා කර ඇති පරිදි ටෙන්ඩර් කරන ලද මුළු ඛනිජ වැලි (ඉල්මනයිට්) මෙට්‍රික් ටොන් 85,000ක ප්‍රමාණය ප්‍රදානය කරන ලද්දේ OSC Management (Pvt.) Limited ආයතනය වන අතර, ඔවුන්ගේ විස්තර පහත පරිදි වේ.

[ගරු මහින්ද අමරවීර මහතා]

| නම | ලිපිනය | ප්‍රදානය කළ මිල (මෙ. ටො. 1ක් සඳහා) |
|---|---|---|
| OSC Management (Pvt.) Limited | අංක 107/22, බලගල පාර, හැඳල, වත්තල | මෙම සමාගම ඉදිරිපත් කරන ලද මිල ගණන ඇ. ඩො. 146ක් වුවත් පසුව ටෙන්ඩර් කමිටුව විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම මිල ඇ. ඩො. 147 දක්වා වැඩි කර ඇත. |

(iv) ටෙන්ඩරය ප්‍රදානය කිරීමේ දී ලැබුණු මිල ගණන්, ලංසු ඇගයීම් කමිටුව විසින් ලබා දෙන නිර්දේශය සලකා බලා අමාත්‍ය මණ්ඩලය පත් කළ ටෙන්ඩර් කමිටුව (CATC) මඟින් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නිගමනය අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දී ඇති බවත්, ලංසු සම්බන්ධයෙන් පැන නැඟුණු කරුණු මත ප්‍රසම්පාදන අභියාචනා කමිටුව මඟින් ද නිර්දේශ ලබා දී ඇති අතර, මේ සියලු නිර්දේශ සැලකිල්ලට ගෙන කැබිනට් මණ්ඩලය විසින් ඛනිජ වැලි (ඉල්මනයිට්) මෙට්‍රික් ටොන් 85,000ක්, මෙට්‍රික් ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 147 බැගින් OSC Management (Pvt.) Limited ආයතනයට අළෙවි කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති බවත් ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් වාර්තා කර ඇත.

මෙම ටෙන්ඩරයේ දී ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 1ක් සඳහා ඇමෙරිකානු ඩොලර් 165.2ක ලංසුවක් ලබා දුන් රක්ෂානා ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ ලංසු ඇපකරය වගකීමෙන් තොර ඇපකරයක් බවට ටෙන්ඩර් මණ්ඩලය මඟින් නිගමනය කරන ලද නිසා එම ලංසුව ප්‍රතික්ෂේප කර ඇති බව ද ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් වාර්තා කර ඇත.

එසේම, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් වාර්තා කර ඇති පරිදි, ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 1ක් සඳහා ඇමෙරිකානු ඩොලර් 163ක ලංසුවක් ලබා දුන් ඔස්මෝසිස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 5,000කට පමණක් ලංසු ඉදිරිපත් කර තිබූ බැවින්, ටෙන්ඩර් නීති-රීතිවලට අනුව එම ලංසුව ප්‍රතික්ෂේප කර ඇති බවද වාර්තා කර ඇත.

සෙරන්ඩිබ් ලොජිස්ටික්ස් වර්ල්ඩ්වයිඩ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මුලදී ඉල්මනයිට් මෙට්‍රික්ටොන් 1ක් සඳහා ඇමෙරිකානු ඩොලර් 130.50ක ලංසුවක් ඉදිරිපත් කිරීමෙන් පසුව එම ලංසුව අනෙකුත් ලංසු හා සැසඳීමේදී තරගකාරිත්වයෙන් තොරවූ නිසා ඔවුන් විසින්ම එම ලංසුව ඉවත් කර ගන්නා ලද බවත්, පසුව මෙම ආයතනය ඉල්මනයිට් මෙට්‍රික්ටොන් 1ක් ඇමෙරිකානු ඩොලර් 150කට මිලදී ගත හැකි බව ටෙන්ඩර් මණ්ඩලයට දන්වා ඇති නමුත්, ටෙන්ඩර් නීති-රීතිවලට අනුව ටෙන්ඩර් මණ්ඩලය විසින් මෙම ලංසුව ප්‍රතික්ෂේප කර ඇති බවත් ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් වාර්තා කර ඇත.

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් විසින් වාර්තා කරන ලද ඉහත කරුණු අනුව, එම ගනුදෙනුවේදී මූල්‍යමය අලාභයක් සිදු වී ඇති බවට නිරීක්ෂණය නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, සවිස්තර පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා කියන මේ ආයතන ගණනාව විශේෂයෙන්ම ඛනිජ වැලි මිලදී අරගෙන මේ අපනයන කටයුතු සිද්ධ කරනවා, ගරු ඇමතිතුමනි. අපට දැනගන්න ඕනෑ කාරණය මේකයි. මේ සියලු කටයුතු සඳහාම වගකිව යුතු ආයතනය හැටියට පරිසර අමාත්‍යාංශය මේ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී පරිසර වාර්තා අගයමින් මේ කටයුතු සිද්ධ කිරීම සඳහා අවසර ලබා දෙනවා ඇති කියලා අපි හිතනවා. මේ පරිසර අවසරය ලබා දීම සම්බන්ධයෙන් අද තිබෙන චෝදනාව තමයි, ඔබතුමාගේ අමාත්‍යාංශය විශාල මුදලක් ගන්නවා කියන එක. ගරු ඇමතිතුමනි, උදාහරණයක් වශයෙන් කිව්වොත්, මාධ්‍ය තුළිනුත් අපි දැක්කා කෘෂිකර්ම ඇමතිවරයාම කියනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය පරිසර වාර්තාව සඳහා රුපියල් ලක්ෂ 300ක් ඉල්ලන නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් කරන්න යන ව්‍යාපෘතිය අඩපණ වෙලා තිබෙනවා, මේ නිසා රට බංකොලොත් වෙලා තිබෙනවා, ඒ තත්ත්වයට වගකිව යුත්තේ පරිසර අමාත්‍යාංශයයි කියලා. ඒ චෝදනාව තමයි අද තිබෙන්නේ. මොකද, අද ආයෝජන නොඑන්නේ, ආයෝජන කළ නොහැකි නිසා. නමුත් අපට දැනෙනවා, මේ ආයතන ගණනාව දිගින් දිගටම මේ කටයුත්ත කරලා තිබෙන බව. එම ආයතන මේ කියන මුදල් දීලා, ඒ අවසරය අරගෙන එම කටයුතු කරනවා ඇති. එතකොට අපට එක දෙයක් තේරෙනවා. කෘෂිකර්ම ඇමතිතුමා කියනවා වාගේ, එතකොට රටට එලදායී, අත්‍යවශ්‍ය කාරණා පසුපසට යනවා. ගරු ඇමතිතුමනි, පෞද්ගලික ආයතන හරහා කෙරෙන සිදුවීම් ටික කරන්න යම් දායකත්වයක් දෙනවා කියන කාරණය තමයි ඔබතුමාගේ පිළිතුරෙනුත් ලැබෙන්නේ. මොකද, මේ ආයතන මේ කටයුත්ත නිරන්තරයෙන් කරගෙන යනවා. ඒ වාගේම මේ කටයුතු හොඳට කර ගෙන යනවා. හැබැයි, සමහර කර්මාන්ත වෙන්නේ නැහැ, රටේ. විශේෂයෙන්ම රටේ කිරි ප්‍රශ්නය විසඳන්න තවම බැරි වෙලා තිබෙනවා, ඔබතුමාගේ අවසරය නොදීම තුළ. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 300 නොදීම තුළ. ගරු ඇමතිතුමනි, මේ පරස්පර වැඩ පිළිවෙළ මොකක්ද කියන එක මේ ගරු සභාවට පැහැදිලි කරන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අහපු ප්‍රශ්නයට තමයි මම පිළිතුරු ලබා දුන්නේ.

මොකද, මේ ආයතනය මට අලුතෙන් තමයි ලැබුණේ. මම ඊයේ තමයි එතැනට ගියෙත්. මට ලබා දුන් පිළිතුර තමයි මම ඒ කියෙව්වේ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා සඳහන් කළ කාරණයක් ගැන ඔබතුමා කිව්වා. මම ඒ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි පිළිතුරක් ලබා දුන්නා. පරිසර අමාත්‍යාංශයෙන් මේ කටයුතුවලට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ මුදල් අය කිරීමක් සිදු වෙන්නේ නැහැ. මධ්‍යම පරිසර අධිකාරිය තමයි මේ කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන්නේ.

නමුත්, මධ්‍යම පරිසර අධිකාරිය අපට වාර්තා කර තිබෙන ආකාරයට මේ වාගේ කිසිදු මුදලක් අය කරලා නැහැ; අපේ අමාත්‍යාංශයට හෝ ඒ ආයතනයට, මේ වාගේ මුදලක් ඉල්ලූ බවට පැමිණිල්ලක්වත් ලිඛිතව හෝ වාචිකව ඉදිරිපත් වෙලාත් නැහැ. කෘෂිකර්ම ඇමතිතුමාත් මේ අවස්ථාවේදී ගරු සභාවේ සිටිනවා. අදාළ සියලුම කණ්ඩායම් ගෙන්වලා, එතුමා එක්ක පසුගිය සතියේ අපි සාකච්ඡාවක් පැවැත්වූවා. මගේ මතකයේ හැටියට අක්කර 700ක පමණ ගොවි පොළකට තමයි එතුමන්ලා මේ වාර්තාව ඉල්ලා තිබුණේ. කෘෂිකර්ම ඇමතිතුමා ඒ වෙලාවේදී කිව්වා, ඒ අක්කර 700න් අක්කර 25ක වාගේ ප්‍රමාණයක ගව ගාල් ඉදිවන බව. මධ්‍යම පරිසර අධිකාරිය තුළ ලියාපදිංචි වූ ආයතන 69ක් තිබෙනවා. ඒ ආයතන හැටනවයෙන් ඕනෑම ආයතනයකින් දෙන වාර්තාවක් තමයි මේ ගොල්ලන්ට දෙන්න ඕනෑ. ඒ ආයතන හැටනවයෙන් එක ආයතනයක් එහෙම ඉල්ලුවා කියන එකයි කියන්නේ. නමුත් අද වනතුරු -මම අදත් කිව්වා.- ඒ පිළිබඳව කිසිම පැමිණිල්ලක් ඒ ආයතනයෙන් ඉදිරිපත් වෙලා නැහැ. ඒ ආයතනය අපි කැඳවනවා. අපට දැනට දැන ගන්න තිබෙන්නේ රජයේ විශ්වවිද්‍යාලයකින් ඒ වාගේ මුදලක් ඉල්ලුවා කියලා. එහෙම මුදලක් ඉල්ලා තිබෙනවා කියලා ඒ අය තහවුරු කළොත්, අනිවාර්යයෙන්ම අපි ඒ අය අසාදු ලේඛනයට ඇතුළත් කරනවා; blacklist කරනවා. මධ්‍යම පරිසර අධිකාරිය ඒ වාගේ මුදල් අය කිරීමක් කරන්නේ නැහැ. ඉතාම සුළු මුදලක් තමයි මධ්‍යම පරිසර අධිකාරිය අය කරන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිවරු දෙදෙනාගේ ගැටලුව සහ අසත්‍ය කීම නොවෙයි මේ සඳහා අදාළ වෙන්නේ. මොකද, රටේ දැන් තිබෙන්නේ බරපතළ ප්‍රශ්නයක්. දියර කිරි ප්‍රශ්නය විසඳීම සඳහා බාධාව තිබෙන්නේ මධ්‍යම පරිසර අධිකාරියෙන්. කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා වාගේ, මධ්‍යම පරිසර අධිකාරිය තිබෙන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ. ඒ වගකීම ඔබතුමාට දරන්න වෙනවා, ගරු ඇමතිතුමනි. මොකද, මධ්‍යම පරිසර අධිකාරිය ඒ සඳහා කටයුතු කරලා තිබෙනවාය කියන කාරණය ඔබතුමාට බැහැර කරන්න බැහැ. ඉතා වගකිව යුතු ඇමතිවරයෙක් මේ ප්‍රකාශය කරන්නේ. එතුමා දැන් පාර්ලිමේන්තුවේ ඉන්නවා. එතුමා දෙවැනි වරට පවත්වපු මාධ්‍ය සාකච්ඡාවේදීත් කිව්වා, -ඔබතුමාත් ඒ සාකච්ඡාව තුළ වාඩි වෙලා සිටියා.- ඔබතුමා මේ සම්බන්ධයෙන් නොදන්නවා නොවෙයි කියලා. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් මේ ඩොලර් අර්බුදය නිසා දරුවන්ට අවශ්‍යා කිරි පිටි ටික ගන්න විධියක් නැහැ. ඒ සඳහා කරන්න යන ඔබතුමන්ලාගේ විකල්ප වැඩ පිළිවෙළත් අසාර්ථකයි, මේ කඹ ඇදීම තුළ. මේ කඹ ඇදීමේ අවසාන ප්‍රතිඵලය වශයෙන් එහි පීඩනය එන්නේ දුක් විඳින ජනතාව මතටයි. ජනතාව මහ පාරේදී ගහලා එළවන එක සාධාරණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දැක්කා, ආණ්ඩු පක්ෂයේ රාජ්‍ය ඇමතිවරයෙකුටත් ගෑස් සිලින්ඩරයකින් ගහලා තිබුණා. මේ පීඩනය පිට වෙන්නේ, එක පැත්තකින් ආණ්ඩුව ලබා ගැනීම සහ බලය ලබා ගැනීම වෙනුවෙන් ආණ්ඩුව ඇතුළේ තිබෙන බෙදීම නිසායි. ඒක නිවැරදි කරලා දෙන්න. ඒ බෙදීම පාවිච්චි කරලා, රටේ ජනතාවට දුක් විඳින්න දෙන්න එපා. විදුලිබල අමාත්‍යාංශයත් ඒක කළා; බලශක්ති අර්බුදයේදීත් ඒක කළා. ආණ්ඩුවේ තිබෙන ප්‍රශ්න නිසා රටේ ජනතාව දුක් විඳිනවා. ඔබතුමන්ලා එක මේසයක ඉඳගෙන කථා කරලා, මේ සඳහා විසඳුමක් ලබා දෙන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය විසඳලා තිබෙන්නේ. ගිය සතියේ කෘෂිකර්ම ඇමතිතුමා එක්ක මේ ගැන සාකච්ඡා එතුමා ඒක තහවුරු කරයි කියලා මම විශ්වාස කරනවා. අපේ අමාත්‍යාංශය හෝ මධ්‍යම පරිසර අධිකාරිය මේ විධියට මුදල් අය කරන්නේ නැහැ. මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි වූ ආයතන 69ක් තිබෙනවා. අපට පරිසර වාර්තා හදන්න බැහැ. මම ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය ගැන සතුටු වෙනවා. පරිසර වාර්තාවක් නැතිව මේවාට අනුමැතිය දෙන්න කියලා ඔබතුමා අපට කියනවා නම්, ඒකට මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරලා දෙනවා නම් මම හෙටම මේ අවසරය දෙන්න කැමතියි. එතකොට සත පහක්වත් අය කරන්න ඕනෑ නැහැ. නමුත් ඔබතුමන්ලාම තමයි ඊළඟ දවසේ අහන්නේ, මේකට පරිසර වාර්තාවක් තිබෙනවා ද කියලා. පරිසර වාර්තාව හදන්නේ අපි නොවෙයි. බලපත්‍රය දෙන ආයතනය විධියට පරිසර වාර්තාවක් හදන්න අපට බැහැ. පරිසර වාර්තාවක් ඒ ඉල්ලුම්කරු විසින් කැමති ආයතනයකට දීලා තමයි හදවන්න ඕනෑ. ඒ සඳහා අපි අපේ format එකක් දෙන එක විතරයි කරන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Agriculture)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු පරිසර ඇමතිතුමාගේ අවසරය මතයි මම මේ කථා කරන්නේ. ඊයේ මට එතුමා උපාධියකුත් දුන්නා. ඒ නිසා මම මේ ගැන පැහැදිලි කරන එක හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අමාත්‍යාංශය යටතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව තිබෙනවා. ඒ දෙපාර්තමේන්තුව යටතේ කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීමේ ජාතික වැඩසටහනට මහාපරිමාණ ගොවිපොළවල් පහක් සඳහා ටෙන්ඩර් කැඳෙව්වා. එතැන දී රුපියල් බිලියන දෙක, තුන වියදම් කරලා සත්තු ගෙන ඒම සඳහා දේශීය ආයෝජකයන්ට අපි අනුමැතිය දුන්නා. මේ ව්‍යාපෘති කිරීමට කලින් පරිසර අධිකාරියේ අනුමැතියත්, පරිසර වාර්තාවත් ගන්න ඕනෑ. එවැනි වාර්තා බණ්ඩ දෙකක් තිබෙනවා. මේ ආයෝජකයන් පරිසර අධිකාරියට ගිහිල්ලා මේ වාර්තා ඉල්ලා තිබෙනවා. ඒ ඉල්ලීමේදී ඒ වාර්තාව ලබා දීම සඳහා ඒ ආයෝජකයකුගෙන් ලක්ෂ 300ක මුදලක් ඉල්ලා තිබුණා. ඒ වාගේම මහවැලි අධිකාරියේ පරිසර වාර්තා ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ 120ක්. මහවැලි අධිකාරියේ පරිසර වාර්තා සඳහා පමණක් දැනට රුපියල් ලක්ෂ 370ක් ගෙවලා තිබෙනවා. අවුරුදු දෙකහමාරක් ගියත් මේ පරිසර වාර්තා ඇවිල්ලා නැහැ. මම මේ ගැන කිව්වාම ගරු ඇමතිතුමා මට පැහැදිලි කරන්න අවස්ථාවක් දුන්නා. අපි අමාත්‍යාංශයට ගියා. අමාත්‍යාංශයට ගිහිල්ලා පරිසර අධිකාරියේ සභාපතිතුමාට ඇමතිතුමා ඉදිරියේ දී මම මේ ගැන කිව්වා. ඇමතිතුමාත්, සභාපතිතුමාත් ඒ කරුණු පිළිගත්තා. පරිසර අධිකාරිය විසින් නම් කරලා තිබෙනවා ආයතන පනස් ගණනක්. ඒ ගොල්ලන් තමයි මේ සල්ලි ගන්නේ. ඉතින් මම ඇමතිතුමාට කිව්වේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ඒවා තිබෙන නිසා මේවා නිවැරදි කරන්න කියලායි. ආයෝජකයන්ගෙන් එවැනි මුදල් ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර වාර්තාවක් ගන්න ලක්ෂ 300ක් ඉල්ලුවොත් ලංකාවට ආයෝජකයෙක් එන්නේ නැහැ. ඒ ඉඩමේ බිම් කුලියට රුපියල් ලක්ෂ 300ක් සහ පරිසර වාර්තාවට රුපියල් ලක්ෂ 300ක් ගෙවන්න ඕනෑ. ආයෝජකයා වැඩේ කරන්න කලින් රුපියල් ලක්ෂ 600ක් ගෙවන්න වෙනවා. මේ ප්‍රායෝගික ගැටලුව තමයි මම කිව්වේ. එහෙම නැතිව මේවාට ඇමතිතුමාගේ ඇති සම්බන්ධතාවක් ගැන නොවෙයි. ඇමතිතුමාට කවුරු හෝ කෙනෙක් මේ ගැන වැරදි විධියට කියපු නිසා එතුමා මට උපාධියක් දුන්නා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

හැබැයි, ඊයේ කැබිනට් මණ්ඩලයේදී එතුමා කනගාටුව ප්‍රකාශ කළා, එතුමා කියපු දේ නොවෙයි ඒ සිද්ධ වුණේ කියලා. ඒ නිසා මේක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. පරිසර අධිකාරිය මේ කරන දේ නිවැරදි කරන බවට ගරු ඇමතිතුමා අපට පොරොන්දු වුණා. මම එතුමාගෙන් ඉල්ලා සිටින්නේ සාධාරණ මුදලක් අය කරගෙන ආයෝජකයන්ට කඩිනමින් මේ පරිසර වාර්තා ලබාදෙන ලෙසයි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම කෙටියෙන් අවසන් කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පරිසර වාර්තා සම්බන්ධව උසාවි ගිහිල්ලා තිබෙනවා අවස්ථා ගණනාවකදී. මේ කාරණයට සම්බන්ධ නිවැරදි පරිසර වාර්තාවක් නොලැබුණොත්, IEE එකක් හෝ EIA එකක් හෝ කළ යුතු වෙනවා. එය කරන්න අපේ අමාත්‍යාංශයට අවසරයක් නැහැ. අපට කරන්න තිබෙන්නේ ආයෝජකයාට ඉල්ලුම්පත්‍රය ලබාදෙන එකයි. ලියාපදිංචි වී තිබෙන ඕනෑම ආයතනයකට ඒක දෙන්න ආයෝජකයාට පුළුවන්. ඒ හුඟක් අය ඒ වාර්තා ලබා ගැනීම සඳහා ගිහිල්ලා තිබුණේ විශ්වවිද්‍යාලවලට. රජයේ විශ්වවිද්‍යාලවලින් තමයි ඒ ගොල්ලන් ඉල්ලීම් කරලා තිබුණේ. ඒ අය තමයි මෙසේ විවිධ මිල ගණන් ඉල්ලා තිබෙන්නේ. මම ගරු ඇමතිතුමාටත් කිව්වා, ඒ ලක්ෂ 300ක් ඉල්ලුවාය කියන ආයතනය ගැන අඩු ගණනේ අපට පැමිණිල්ලක් එවන්න කියලා. එතකොට අපි අනිවාර්යයෙන් ඒ අය blacklist කරනවා. කිසිම රාජ්‍ය ආයතනයක වැඩ පිළිවෙළක් බකල් කරන්න අපට ඕනෑ නැහැ. අපටත් ඕනෑ මේවා ඉක්මනින් ක්‍රියාත්මක කරන්නයි. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුවම තමයි නැවත අහන්නේ, කෝ, පරිසර වාර්තාවක් අරගෙන ද මේක කළේ කියලා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔය ගැටලුව මෙතැනින් අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ එකම ප්‍රශ්නය මෙයයි. අක්කර 100ක් තුළ ගව ගාලක් ඉදිකරන්න ආයෝජකයෙකුට අනුමැතිය ලබා ගන්න අවුරුදු 3ක් ගත වෙනවා නම්, ඒකට ලක්ෂ 300ක් ගෙවන්න වෙනවා නම් වැඩක් තිබෙනවාද? මේ නීති හදලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන්. ගරු ඇමතිතුමනි, ඒකයි මම කියන්නේ අපි මේවා වෙනස් කරන්න ඕනෑ කියලා. අක්කර 100ක හරක් මඩුවක් හදන්න පරිසර වාර්තාව ලබා දෙන්න ලක්ෂ 300ක් ගන්නවා නම්, ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න අවුරුදු 3ක් ගත වෙනවා නම් මේ රටට ආයෝජකයෝ එයිද? අපි මේ නීති හදලා තිබෙන්නේ හරියට නවසීලන්තයට ඕනෑ විධියට වාගෙයි, එහෙන් වැඩියෙන් කිරි පිටි ගෙනෙන්න. අපේ මේ ව්‍යාපෘති ඉක්මනින් සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා මම කියන්නේ අපි එක්කාසු වෙලා මේවා හදාගමු කියලා. අපි මේ තත්ත්වය වෙනස් කරමු, ගරු ඇමතිතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් ලැබුණා නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, මම ඉල්ලුවේ මේ ගැන පාර්ලිමේන්තුවට නිවේදනයක් කරන්න කියලා. ඔබතුමා නිරන්තරයෙන් කියනවා ඒ ලක්ෂ 300 ඉල්ලුවේ කවුද කියලා කියන්න කියලා. හැබැයි, කෘෂිකර්ම ඇමතිතුමා ඒක කියන්නේ නැහැ. එහෙම නම්, මේ අල්ලසක් පිළිබඳවයි කියන්නේ; මේ කියන්නේ ගනුදෙනුවක් පිළිබඳව. පරිසර බලපත්‍රයක් ලබා ගැනීම ගැන නොවෙයි මේ කියන්නේ. අල්ලසක් පිළිබඳවයි දැන් කියන්නේ. ඒ ආයතනයේ නම ඇමතිතුමා කියන්නේ නැත්නම්, ඒ ලක්ෂ 300ක අල්ලසෙහි,-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේක විවාදයක් කර ගන්න එපා, ගරු ඇමතිතුමනි. අවසන් කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මා මේ කාරණය විවාදයක් කර ගන්නේ නැහැ. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කියපු ආකාරයටත්, කෘෂිකර්ම ඇමතිතුමා කියපු ආකාරයටත්, ජාතික පරිසර පනතේ අඩුපාඩුවක් නේ මේ තිබෙන්නේ. ඒක මා හදපු පනතක් නොවෙයි. මා ජාතික පරිසර පනතට සංශෝධනයක් ගෙනෙනවා. ඔබතුමන්ලාත් එයට සහයෝගය ලබා දෙන්න, ඉතාම කෙටි කාලයකින් ඒ කටයුත්ත නිම කරන්න. ඊට පස්සේ මේ පාර්ලිමේන්තුවේදී කියන්න එපා, නිවැරැදි විධියට වාර්තා දුන්නේ නැහැයි කියලා. අපිත් කැමැතියි, මේ වාර්තා ඉතාම කඩිනමින්, සතියකින් හෝ දෙන්න. මේවා ප්‍රමාද කරන්නේ මධ්‍යම පරිසර අධිකාරිය හෝ අමාත්‍යාංශය නොවෙයි, ඒ අනුමැතිය ඇති ආයතනවලින්. එහෙම නැත්නම්, අපි නිකම් ම වුණත් ඒ වාර්තා දෙන්න කැමැත්තක් තිබෙනවා, රජයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 5 -1023/2022- (1), ගරු ශාන්ත බණ්ඩාර මහතා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -1179/2022- (1), ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා.

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පුත්තලම සිමෙන්ති කම්හල සතු ඉඩම්: අනවසරයෙන් අත්පත් කර ගැනීම
## புத்தளம் சீமெந்துத் தொழிற்சாலைக் காணிகள்: சட்டவிரோதமாகக் கையகப்படுத்தல்
## LANDS OF PUTTALAM CEMENT FACTORY: ILLEGAL ACQUISITION

1193/2022

**7. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම සිමෙන්ති කම්හල සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් විවිධ පුද්ගලයන් හා ආයතන විසින් මේ වනවිට අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් නිරවුල් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் சீமெந்துத் தொழிற்சாலைக்குச் சொந்தமான காணிகளின் மொத்த விஸ்தீரணம் யாது என்பதையும்;

(ii) மேற்படி காணிகளில் பல்வேறு ஆட்கள் மற்றும் நிறுவனங்களினால் இன்றளவில் சட்டவிரோதமாகக் கையகப்படுத்தப்பட்டுள்ள காணிகளின் விஸ்தீரணம் யாது என்பதையும்;

(iii) மேற்படி காணிகள் தொடர்பில் காணப்படுகின்ற சிக்கல்களைத் தீர்த்துக்கொள்வதற்காக அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industries:

(a) Will he inform this House -

(i) the total extent of land owned by the Puttalam Cement Factory;

(ii) out of the aforesaid lands, of the extent of lands that have been illegally acquired by various individuals and institutions at present; and

(iii) the measures that will be taken by the Ministry to settle those lands?

(b) If not, why?

**ගරු එස්.බී. දිසානායක මහතා (කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - கைத்தொழில் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Industries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| ඉඩමේ නම | බදු ගිවිසුමේ / ඔප්පුවේ අංකය | අයිතියේ ස්වභාවය | ඉඩම් ප්‍රමාණය (අක්කර: රූඩ්: පර්චස්) | ඇමුණුම |
|---|---|---|---|---|
| සිමෙන්ති කම්හලට අයත් ගොඩනැඟිලි පිහිටි පරිශ්‍රය | ඔප්පු අංක: 111 | සින්නක්කර අයිතිය | 570:00:18 | ඇමුණුම 01 |
| අරුවක්කාලු හුණුගල් නිධිය පිහිටි ඉඩම | අංක: 495 දරන බදු ගිවිසුම | බදු අයිතිය | 5141:00:10 | ඇමුණුම 02 |
| පාලවි | අංක: 26 දරන බදු ගිවිසුම | බදු අයිතිය | 12: 03:30 | ඇමුණුම 03 |
| එකතුව | | | 5723:03:58 | |

*සටහන:* මේ වන විට මෙම සිමෙන්ති කම්හල පුත්තලම සිමෙන්ති කම්හල වශයෙන් හඳුන්වනු නොලබන අතර, වර්තමානයේ එම කම්හල Siam City Cement (Lanka) Limited -INSEE CEMENT- සමාගම යටතේ පවත්වාගෙන යනු ලබයි.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

(ii) අරුවක්කාලු හුණුගල් නිධිය පිහිටි ඉඩම තුළ පහත සඳහන් කර ඇති පරිදි දැනට අනවසර අත්පත් කර ගැනීම් සිදු වී ඇත.

නිවාස තනාගෙන අනවසරයෙන්

පදිංචිව සිටින ඉඩම් ප්‍රමාණය - අක්කර 15ක් පමණ

අනවසරයෙන් වගා කර ඇති

ඉඩම් ප්‍රමාණය - අක්කර 351ක් පමණ

**එකතුව - අක්කර 366ක් පමණ**

(iii)

- අරුවක්කාලු හුණුගල් නිධිය පිහිටි ඉඩම අංක: 283/2 හා 1977.09.20 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත පවරා ඇත. විස්තර ඇමුණුම 04හි දක්වා ඇත.
- අංක 01 සිට 04 දක්වා ඇමුණුම් **සභාගත*** කරමි.
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් මෙම ඉඩම් කොටස 1996.08.23 දිනැති අංක: 495 දරන බදු ගිවිසුම මඟින් එවකට පැවැති Puttalam Cement Company Limited වෙත බදු පදනම මත ලබා දී ඇති අතර එහි වර්තමාන බදු ගැනුම්කරු වන්නේ Siam City Cement (Lanka) Limited - INSEE CEMENT සමාගමයි.
- බදු කාල සීමාව තුළ ඉහත ඉඩම් කොටස අනවසරයෙන් අත්පත් කර ගැනීමට කිසිදු පුද්ගලයෙකුට අවස්ථාව ලබා නොදීමට බදු ගැණුම්කරු විසින් වග බලා ගත යුතු බව බදු ගිවිසුමෙහි 2 (ජී) වගන්තියෙහි සඳහන් කර ඇත. ඒ අනුව,

ඉහත ඉඩම් කොටස වෙත කිසිදු අනවසර පදිංචිකරුවකුට ඇතුළුවීමට අවස්ථාව ලබා නොදෙන ලෙස Siam City Cement (Lanka) Limited සමාගමේ පාලනාධිකාරිය දැනුවත් කරන ලෙසත්, ඒ පිළිබඳව අධීක්ෂණය කරන ලෙසත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපති වෙත දැනුම් දී ඇත.

2020.09.05 දින මෙම ඉඩම තුළට අනවරසයෙන් ඇතුළු වී කැලෑ කපා ගිනි තබා විනාශ කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිවරයා විසින් 2020.09.06 දින අංක: MOIB 250/14 යටතේ වනාතවිල්ලුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

දැනට මෙම ඉඩම් කොටස තුළ අනවසරයෙන් වගා කටයුතු කරනු ලබන පුද්ගලයන්ට එම වගා කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ඉඩ ලබා දෙන ලෙස වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිවරයා සහ ප්‍රාදේශීය ලේකම් අතර සාකච්ඡා සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

අපේ නව කර්මාන්ත ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහනවා. අපේ කර්මාන්තශාලාවලට ලයිට් නැතිව, ජෙනරේටර්වලට ඩීසල් නැතිව ඉතාම අමාරුවෙන් ගතවෙන කාලයක්, මේක. පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව සහ අරුවක්කාලු ඒ කැණීම් අංගණය දක්වා දුම්රිය මාර්ග පද්ධතියක් තිබෙනවා. ඒ දුම්රිය මාර්ග පද්ධතියේ අපේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති track එකක් තිබෙනවා. ඒකේ කොටසක් තනිකරම ඒ කර්මාන්තශාලාව තමයි පාවිච්චි කරන්නේ. ගරු ඇමතිතුමනි, එම දුම්රිය මාර්ග පද්ධතිය නඩත්තු නොකිරීම නිසා බොහොම අබලන් තත්ත්වයේ තමයි තිබෙන්නේ.

ඒ දුම්රිය මාර්ග පද්ධතියේ සම්පූර්ණ කොටසම දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ද, ඒ මාර්ගය පාවිච්චි කිරීම වෙනුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට යම් ගෙවීමක් කරනවාද, ඒ ගෙවීම් නිසියාකාරව ගෙවා තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. ඔබතුමා දැන් ඒ විෂය භාර අලුත් ඇමතිතුමා නේ.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මේ අවස්ථාවේ මට කිසිම අවබෝධයක් නැහැ. ඒ නිසා ඒකට පිළිතුරු ලබා දීම සඳහා මට වෙනත් දිනයක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හොඳයි, ගරු ඇමතිතුමනි.

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

.ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට පුත්තලම දිස්ත්‍රික් මන්ත්‍රී, මා හිතවත් ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු අමාත්‍යතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ ප්‍රදේශයේ විශාලම සම්පතක් තමයි අරුවක්කාලු හුණුගල් නිධිය. මම දන්නේ නැහැ, ඇයි ඒකේ සියලු ලාභය ජාත්‍යන්තරයට ගියේ, ඒක ගන්න ශ්‍රී ලංකාවේ ආයෝජකයෙක් ඉදිරිපත් වුණේ නැත්තේ ඇයි කියලා. එතැන විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම අපට විශාල කනගාටුවකුත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, අරුවක්කාලු හුණුගල් නිධිය පිහිටි ඉඩම ගැන අපි කවුරුත් දන්නවා. අපිට අහන්න ලැබෙන විධියට, ඒක තව අවුරුදු 4,000කට 5,000කට ඉදිරියට පවතින කථාවක්. මම අහන්නේ ඒක බදු දුන්නේ කොහොමද කියලා. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව තිබුණු ඒ ඉඩම කොහොමද අතුරු බදු දුන්නේ? ඒ කටයුත්ත නීත්‍යනුකූලද, නැද්ද? තව කොපමණ අවුරුදු ගණනක් ඒක ඉදිරියට තිබෙනවාද?

ඊළඟ කාරණය මේකයි. මේ නිධියේ තිබෙන හුණුගල්වලට කරන ගෙවීම් පිළිබඳව වර්තමානයේ සාධාරණව ගණනය කර

තිබෙනවාද? ඒ ගණනය කිරීම් අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වෙනවාද, අඩු වෙනවාද? ඒකේ රාජ්‍ය භාගය සම්බන්ධයෙන් අපට විශාල ගැටලුවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ ප්‍රදේශය පරිසර දූෂණයට ලක් වෙලා තිබුණු ප්‍රදේශයක්. ඒ පරිසරය ආරක්ෂා කරන්න යම්කිසි පියවරක් අරගෙන තිබෙනවා. හැබැයි, ඒක සාර්ථකයි කියලා නම් අපට තවමත් පෙනෙන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නවලට පිළිතුරු හැටියට ඔබතුමා ඉදිරි කාලයේදී හෝ විශේෂ විස්තරයක් කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

සිමෙන්ති සංස්ථාව සම්බන්ධයෙන් ඔබතුමා මතු කරපු ප්‍රශ්න ටික පිළිබඳව මම දැනට දැනුවත් නැහැ. හැබැයි, මම ඉදිරි කාලයේදී ඔබතුමාට මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්නම්. ඔබතුමා විස්තර සහිතව තවත් මගෙන් ප්‍රශ්න අහනවා නම්, මම ඒවාටත් පිළිතුරු ලබා දෙන්නම්. මොකද, ඔබතුමා ඒ ප්‍රදේශය නියෝජනය කරන කෙනෙක් නේ. ඒ නිසා මම කැමැතියි, ඔබතුමා මතු කරන ප්‍රශ්න පිළිබඳව දැනගන්න. ඒ වාගේම සිමෙන්ති සංස්ථාව මැලේසියන් සමාගමකට දුන්නේ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාය කියන එකත් මම කියන්න කැමැතියි. ඒ අවස්ථාවේ මම සමෘද්ධිය භාර ඇමති. මම ඒක ඉල්ලුවා. මගේ bid එක - සමෘද්ධි අමාත්‍යාංශයෙන් දමපු bid එක - මැලේසියානු සමාගමේ bid එකට වඩා වැඩියි. නමුත්, අපට ඒක දුන්නේ නැහැ.

## 2018.03.05 දින දිගන ප්‍රදේශයේ ඇති වූ සිද්ධිය : විස්තර

05.03.2018 அன்று திகனவில் ஏற்பட்ட சம்பவம் : விபரம்

INCIDENT OCCURRED IN DIGANA ON 05.03.2018: DETAILS

1312/2022

8. **ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)

මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018.03.05 දින මහනුවර, දිගන ප්‍රදේශයේදී ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) එසේ නම්, එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා එම පරීක්ෂණයට අදාළ වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත සඳහන් සිද්ධියට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iii) එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018.03.05 ஆந் திகதி கண்டி, திகன பிரதேசத்தில் ஏற்பட்ட அமைதியின்மை தொடர்பில் அறிவாரா என்பதையும்;

(ii) அது தொடர்பில் முறையான விசாரணை மேற் கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வாறான சம்பவங்கள் மீண்டும் ஏற்படுவதனைத் தடுப்பதற்காக மேற்படி விசாரணை அறிக்கையினூடாக முன்வைக்கப் பட்டுள்ள விதப்புரைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(ஆ) (i) மேலே தெரிவிக்கப்பட்ட சம்பவத்திற்கு பொறுப் புக்கூற வேண்டிய நபர்கள் அடையாளம் காணப் பட்டுள்ளனரா என்பதையும்;

(ii) ஆமெனில், அவர்களுக்கெதிராகச் சட்ட ரீதியான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) அவ்வாறான சம்பவங்கள் மீண்டும் ஏற்படு வதனைத் தடுப்பதற்காக எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் தெரிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security:

(a) Will he inform this House -

(i) whether he is aware of the tense situation that occurred in Digana area in Kandy on 05.03.2018;

(ii) whether a formal investigation has been conducted in that regard; and

(iii) if so, the recommendations made by the report of the aforesaid investigation to prevent the recurrence of such incidents?

(b) Will he also inform this House-

(i) whether the persons responsible for the aforesaid incident have been identified;

(ii) if so, whether action has been taken against them according to the law; and

(iii) the action that has been taken to prevent the recurrence of such incidents?

(c) If not, why?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) මේ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය මඟින් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොමැත.

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

(iii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

මෙම සිද්ධීන්වලට අදාළව විමර්ශන සිදු කර සැකකරුවන් අත් අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර අදාළ සැකකරුවන්ට විරුද්ධව නඩු පවරා ඇති අතර, මහනුවර මහාධිකරණයේ නඩු අංක එච්.සී. 105/2019 යටතේ, එම නඩුව මේ වන විට විභාග වෙමින් පවතී. තවද, මේ සම්බන්ධයෙන් පල්ලෙකැලේ පොලිස් ස්ථානය මඟින් විමර්ශන කටයුතු සිදු කර මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 45892/18 යටතේ කරුණු වාර්තා කර ඇත.

(ii) ඔව්.

සිද්ධියට අදාළ සියලුම සැකකරුවන් අත් අඩංගුවට ගෙන ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබේ.

(iii)

- දැනට ස්ථාපිතව ඇති මහජන ආරක්ෂක කමිටු සම්බන්ධීකරණය, ප්‍රජාව අතර අවබෝධය, ජාතීන් අතර සහයෝගිතාව හා එකමුතුභාවය ගොඩනැඟීම උදෙසා ක්‍රියාකාරී වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී.
- ජාතික සංහිඳියාවට බාධාවක් ඇති වන ආකාරයෙන් අන්තවාදී අදහස් ප්‍රකාශ කරන්නන්, මහජනතාව අතර නොසන්සුන්තාව වර්ධනය වන පරිදි කඩාකප්පල්කාරී ක්‍රියා සිදු කිරීමට ඉඩ ඇති තැනැත්තන් සම්බන්ධව බුද්ධි අංශ නිලධාරින් යොදවා තොරතුරු එක්රැස් කිරීම හා ආවේක්ෂණ රාජකාරි සිදු කිරීම.
- ප්‍රදේශ ආවරණය වන පරිදි දිවා සහ රාත්‍රී පා මුර සංචාර, යතුරු පැදි සංචාර, දිවා/රාත්‍රී ජංගම සංචාර යෙදවීම හා ක්ෂණික මාර්ග බාධක ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර, ඒ සඳහා අවශ්‍ය අවස්ථාවලදී පොලිස් විශේෂ කාර්ය බලකායේ, ත්‍රිවිධ හමුදාවේ සහාය ලබා ගනිමින් ප්‍රදේශය තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමට ක්‍රියා කරමින් තිබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළව තාක්ෂණික වශයෙන් ගන්න පුළුවන් පියවර තමයි දැන් ඔබතුමා ඉදිරිපත් කළේ. ඔබතුමා දන්නවා පාස්කු ඉරු දින ප්‍රහාරය පිළිබඳව සෙවීම සඳහා පත් කළ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙත් ප්‍රකාශ කර තිබුණා, මේ සිදුවීම සහරාන්ලාට තවත් බඳවා ගන්න උත්තේජනයක් වුණ බව. එතකොට, මේ සිදුවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිද්ධ වුණාද? ඒකට එකතු වූ අය සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගන්න එක හරි. හැබැයි, ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නැහැ කියන එකත් මම කියන්න ඕනෑ. ඒ කියන්නේ, මේ වාගේ සිදුවීම්වලට බලපෑ වෙනත් හේතු, මෙවැනි අන්තවාදී ක්‍රියා සඳහා පෙලඹීමට බලපෑ හේතු සම්බන්ධයෙන් මීට වඩා පුළුල් පරීක්ෂණයක් කරන්න ඕනෑ කියලා මා හිතනවා. මොකද, එහෙම පරීක්ෂණයක් නොකිරීම බරපතළ ප්‍රශ්නයක්. ඔබතුමන්ලා ඉදිරියේදී එවැනි පරීක්ෂණයක් කරන්න බලාපොරොත්තු වෙනවාද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ අමාත්‍යාංශය ස්ථාපිත කළේ පසුගිය අවුරුද්දේ.

ඒ නිසා මේ අමාත්‍යාංශයෙන් ඒ ගැන කිසිම පරීක්ෂණයක් පවත්වා නැහැ. මොකද, ඒ සිද්ධිය වෙනකොට පොලීසිය සම්පූර්ණයෙන්ම තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

ඇත්ත වශයෙන්ම මේ සිද්ධිය ඇති වුණේ මුස්ලිම් ජාතිකයන් හතරදෙනෙකු විසින් සිංහල පුද්ගලයන් කිහිප දෙනෙකුට පහර දී තුවාල සිදු කිරීම හේතුවෙන්. එසේ තුවාල ලැබූ මහනුවර, මැදමහනුවර යන ලිපිනයෙහි පදිංචිව සිටි කුමාරසිංහ යන අය ඊට දවස් හතරකට පසුව මිය ගොස් තිබෙනවා. ඊට පසුව තමයි සිංහල මිනිසුන් කුපිත වෙලා මේ දේවල් කර තිබෙන්නේ. මේක සම්පූර්ණයෙන්ම වැරදියි. මේ සිද්ධියේදී ගෙවල් සහ වෙළෙඳ සැල් 144කට ගිනි තබා විනාශ කර තිබෙනවා. ඒ සියල්ලටම වන්දි ලබා දීලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා ඇසුවේ හොඳ ප්‍රශ්නයක්. මම කලින් කිව්වා වාගේ, අද වෙනකොට අපි බුද්ධි අංශ යොදවා එසේ අන්තවාදී අදහස් ප්‍රකාශ කරන අයගේ, අන්තවාදී විධියට හැසිරෙන අයගේ ඉතිහාසය සම්පූර්ණයෙන්ම සොයා බලා, ඔවුන්ගේ පසුබිම බලා ඒ අය අත්අඩංගුවට අරගෙන, අදාළ අය පුළුවන් නම් පුනරුත්ථාපනයට පවා යොමු කරලා එවැනි කටයුතු නැවැත්වීමට ක්‍රියා කර තිබෙනවා. ඒ නිසා තමයි මම හිතන විධියට ඊට පසුව - අද වනතුරු- ඒ වාගේ ජාතිවාදී කෝලාහලයක් ඇති නොවුණේ.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ සිදුවීම්වලින් පසුව, විශේෂයෙන්ම පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසුව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, මලිත් ජයතිලක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ පාර්ලිමේන්තුවේ කමිටුවක් පත් කළා. එම කමිටුවේ වාර්තාවත් පදනම් කර ගනිමින් ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ ජනාධිපතිතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මම හිතන විධියට එතකොට ආරක්ෂක ඇමති විධියට කටයුතු කළේ ජනාධිපතිතුමාම තමයි. එම කැබිනට් පත්‍රිකාවෙන් කරුණු 57ක් යටතේ නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. එම කැබිනට් පත්‍රිකාවෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනා දැනට මහජන ආරක්ෂක ඇමති විධියට කටයුතු කරන ඔබතුමා ක්‍රියාත්මක කර තිබෙනවාද?

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ඒකත් හොඳ ප්‍රශ්නයක්, ගරු මන්ත්‍රීතුමා. අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මම පිළිගන්නවා, ඒ සියලු දෙයක්ම දැනට ක්‍රියාත්මක වෙලා නැති බව. නමුත් අපි ඒවා පියවරෙන් පියවර, එකින් එක ක්‍රියාත්මක කරගෙන යනවා. සමහර ඒවා ක්‍රියාත්මක කිරීම ටිකක් දුෂ්කරයි. නිර්දේශ කරනවා වාගේ නොවෙයි, ක්‍රියාත්මක කරන එක. නමුත් ඒ දේවල්

ක්‍රියාත්මක කරමින් පවතිනවා. මට ඉතා විශ්වාසයෙන් කියන්න පුළුවන්, අනාගතයේදී ඒ සියලු නිර්දේශ ක්‍රියාත්මක කර අවසන් කරන්න අපට පුළුවන් බව.

## පිරිසිදු පානීය ජලය නොමැති ග්‍රාම නිලධාරී වසම්: අනුරාධපුර දිස්ත්‍රික්කය

சுத்தமான குடிநீர் இல்லாத கிராம அலுவலர் பிரிவுகள்: அநுராதபுர மாவட்டம்

GRAMA NILADHARI DIVISIONS WITHOUT CLEAN DRINKING WATER: ANURADHAPURA DISTRICT

1470/2022

**9. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජලය නොමැති ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරී වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுர மாவட்டத்தில் சுத்தமான குடிநீர் இல்லாத கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு கிராம அலுவலர் பிரிவினதும் பெயர் மற்றும் சுத்தமான குடிநீர் இல்லாத குடும்பங்களின் எண்ணிக்கை என்பன வெவ்வேறாக யாவையென்பதையும்;

(iii) அநுராதபுர மாவட்டத்தின் குடிநீர்ப் பிரச்சினையைத் தீர்ப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply:

(a) Will he inform this House -

(i) the number of Grama Niladhari Divisions without clean drinking water in the Anuradhapura District;

(ii) the names of the said Grama Niladhari Divisions and the number of families without clean drinking water in each of the said divisions, separately; and

(iii) the measures taken to address the drinking water problem in the Anuradhapura District?

(b) If not, why?

Because time is short, I am going to recount one or two personal experiences of mine and when I speak on that, I hope it qualifies my declaration under the etiquette of personal involvement in a matter that I speak of. That will illustrate the absurdity of this Law. I have previously mentioned a case, which I will mention again. There was a couple, a husband and wife, who were prosecuted under Section 5 of the Act for failure to give information about a certain person called “Babu.”. They obtained confessions from this couple. They were people who were threatened and they gave confessions. They were not tortured, but there was a threat of torture - hooks and ropes were brought - and they gave and signed the confession. But, the person named "Babu" who was also arrested, despite severe beatings, did not sign the confession. So, I appeared for this couple when the matter came up. "Babu" had been released because he did not sign the confession. "Babu" came to watch the proceedings of those two persons who were charged for failure to give information about him! That is how absurd this law is. And, what is more? I pleaded guilty on their behalf because they pleaded with me to plead guilty because two years had lapsed, they were in prison, there were three children and no one to look after them. Because of the circumstances, they were given a suspended sentence and they were able to come out after pleading guilty to an offence that they knew very well, we knew very well and the court knew very well that they did not commit.

Then, there is another case of a person whose supposed confession said that he gave food parcels at a particular point in Jaffna to LTTEers.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

On that very day, he was having his appendix removed at Sri Jayewardenapura Hospital. That matter was brought up. The Hon. Tilak Marapana was the Attorney-General. Mr. Mohan Peiris was my senior in the case and we told the prosecutor, "Do not embarrass yourself; withdraw the indictment" and the indictment was withdrawn. They write up whatever stories they want and get you to sign a confession.

The Hon. Leader of the Opposition mentioned the case of J.S. Tissainayagam. I was the counsel in that case. His supposed confession said in one place - he himself had written it in his own handwriting because he was forced to do that - "They offered me money. I said I did not want." In Tamil, it said, "வேண்டாம் என்று சொன்னேன்." It was written "வேண்டாம் என்று சொன்னேன்" in black ink, but a correction was made in blue ink over that. The letter "ட", the அரவு, "டா" was changed to "டு" to say, "வேண்டும் என்று சொன்னேன்", which meant, "I said I want." In that supposed confession, there were 50 odd other places where he had made corrections in black ink and he has initialed on the side. On this particular point where a different ink was used, there was no initial on the side. The very document was not authentic, but it was on that document that he was found guilty and sentenced to 20 years' rigorous imprisonment. That provision still remains! You are not touching that, the most talked about provision in the PTA, the confessions made to police officers being admissible as evidence against that person and even the co-accused, for that matter. That provision still remains; you have not touched it!

Hon. Minister (Prof.) G.L. Peiris, you are embarrassing yourself when you stand up and say that you are reducing the detention period from 18 months to 12 months. I cannot believe that you can do that! Does it make any difference on the ground? No, it does not. Tell me one person who has been released because the 18 months have lapsed. Tell me one person who is going to be released because 12 months are going to be lapsed now. It is not going to make a difference because you have Section 7 of the Act. Before the 12 months lapse, all you have to do is to produce the person before the magistrate and the law stays and will still say, "The Magistrate shall remand the person until conclusion of the trial." But, the trial is in the High Court, not in the Magistrate's Court. So, that does not change.

You say that you are providing provision for bail. Yes, it is for the first time that a provision for bail, a right is coming in and I acknowledge that. But, anyway, you have been releasing people on bail even without that. As you yourself said, courts have interpreted now authoritatively that the word "shall" must be read as "may". So, what is this? This is a superfluous thing now and when you bring it in saying that the Court of Appeal can grant bail, your proviso states, "Subsequently, the High Court can remand the person". Where in the world do you have a law where the higher court grants bail and subsequently, the lower court can remand the person?

Since time is short, I would like to say that we have started a campaign going countrywide, where people from all walks of life and all ethnicities are calling for the total repeal of the PTA. Listen to the people of this country. We, Tamils, have said this for 30 years or more, maybe, for 40 years. Others have also said it. The JVP suffered under this. When I started my practice, I appeared for many persons who were charged under the PTA in 1989, 1990, 1991 and so on. Now, you are victimizing the Muslim community under this Law. So, all of those people are asking for total repeal of the Act.

We will oppose this Bill even though there is a provision, a legal right for bail because you are using this Amendment to mislead everyone saying, "This is some good first step. Let us start here. We will move on" and so on. You are pulling wool over the eyes of the world or you are trying to. You will not succeed in that, but you are trying to. Therefore, in order to expose this puerile attempt by the Government to try and show that there is some reform - I told you, Hon. Minister, in Jaffna that if this is reform, you have to change the meaning of the word "reform" in the dictionary and you did not counter me on that at that point - and to show that it is something which makes no change on the ground, we will be opposing the passage of this Bill today.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චරිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.53]

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම සංවේදී රෙගුලාසි කිහිපයක්, නැත්නම් නීති කෙටුම්පතක් ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා. මට පෙර කථා කළ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයක් සම්බන්ධව මා මුලින්ම අදහසක් පළ කළ යුතුයි. විශේෂයෙන්ම 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත 1979 ජූලි මාසයේ 20වන දා පාර්ලිමේන්තුවේ සම්මත කළා. එදා එය හදිසි පනතක් විධියට තමයි ගෙනැවිත් තිබුණේ. විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ නිරීක්ෂණය සම්බන්ධව යම්කිසි හදිසි වීමක් ඒ තුළ තිබුණා. හදිසි පනත ගෙන ඒමේ නීති ප්‍රතිපාදන තුළ 2/3ක අනුමැතියකින් තමයි එය ගෙනැවිත් තිබුණේ. ඒ නිසා එය රැගෙන ඒමේදීම නෛතිකව යම්කිසි ආකාරයක ගැටලුකාරිත්වයක් මතු වුණාය කියලා ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා මතු කරන නිරීක්ෂණය සම්බන්ධයෙන් අපේ අවධානය යොමු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රනිල් වික්‍රමසිංහ හිටපු අග්‍රාමාත්‍යතුමා මීට පෙර අදහස් ප්‍රකාශ කරද්දී කියා සිටි වැදගත් කරුණක් මෙහිදී මම එකතු කරන්න ඕනෑ. 1978, 1979, 1980 වනකොට මේ රටේ මතු වෙමින් තිබුණු කැරලිකාරිත්වය සහිත ත්‍රස්තවාදයේ දිසාවට ගමන් කළ සමාජ ක්‍රියාකාරිත්වයන් සමහන්

කළ හැකි නෛතික පද්ධතියක් අපේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරලා තිබුණේ නැහැ කියන මතය ඒ කාලයේ තිබුණා. ඒ නිසායි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හදිසි පනතක් විධියට පාර්ලිමේන්තුවට ගෙනෙන්න සිදු වුණේ කියලා තමයි ඔවුන් තර්ක කරන්නේ. මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, එදා මේ පනත ගෙනාවේ, ඒ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ දෙමළ ජාතික ඇමතිවරයකු වන කේ.ඩබ්ලිව්. දේවනායගම් මැතිතුමා බව.

එතුමා තමයි මෙය පළමුවෙන්ම පනත් කෙටුම්පතක් විධියට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. ඒ, 1979 ජූලි මාසයේ 20වැනි දා. ඊට පස්සේ මේ පනතට අවස්ථා දෙකකදී සංශෝධන ගෙනැවිත් තිබුණා. 1982 අංක 10 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (සංශෝධන) පනත වාගේම 1988 අංක 22 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත කියලා පනත් දෙකක් ගෙනාවා. මේ පනත එලෙස දෙවරක් සංශෝධනය වෙලා තිබුණා. විශේෂයෙන් මෙම පනත සම්බන්ධව සාකච්ඡා වුණු ඒ අවස්ථා දෙකේදීමත් අපේ රටේ ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ කාරණය සහ ඒ පනත තුළ ගැට ගැහිලා තිබෙන සමාජ, දේශපාලන තත්ත්වය පිළිබඳවත් පළල් සාකච්ඡාවක් අපේ පාර්ලිමේන්තුවේ සිදු වෙලා තිබෙනවා. මමත් විශ්වාස කරනවා, අපි ත්‍රස්තවාදය සම්බන්ධයෙන් අලුත් පනතකට, අලුත් නීතියකට යන්න අවශ්‍යයි කියලා.

මීට පෙර තිබුණු රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරමින් ප්‍රතිත්‍රස්ත පනත ඉදිරියට ගෙනෙන්න කල්පනා කළා කියා ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකාශ කළා. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතත්, පසුගිය ආණ්ඩුව ගෙනෙන්න උත්සාහ කරපු ප්‍රති ත්‍රස්ත පනතත් -ඒ දෙකම- සම්බන්ධ සාකච්ඡාවේ ඉදිරියක් විධියට අපේ රටේ ත්‍රස්තවාදය හා සම්බන්ධව අනාගතයේ ඇති විය හැකි තත්ත්වයන් පාලනය කරන්න පුළුවන් නෛතික තත්ත්වයක් හදන්න ඕනෑ. ඒක අවශ්‍යයි. ඒක හැදීම වාගේම මේ පනත හරහා අපේ සමාජයට මතු කරපු තැති ගැන්මෙන් අපි සමාජයක් විධියට නිදහස් වෙන්න ඕනෑ. මම එහෙම කියන්නේ මේ නිසායි. මේ පනත හරහා අපට ධනාත්මක ප්‍රතිඵල රාශියක් ලැබුණා තමයි. 1983න් පස්සේ උතුරේ මතු වෙච්ච බරපතළ ගැටුම එක්ක ආරක්ෂක පැත්තෙන් වැඩ කරද්දී මේ පනත හරහා විශාල සහයෝගයක් ලැබුණා. ඒ වාගේම 1989 කාලයේ දකුණේ මතු වෙච්ච ප්‍රශ්නයේදීත් මේ පනත යම් විධියක ධනාත්මක එකතු කිරීම් කරන්න ඇති. හැබැයි, මේ පනත හරහා මතු වෙච්ච සමාජ තැති ගැන්ම, සමාජ කැළඹීම අපේ රටේ බරපතළ තත්ත්වයක් නිර්මාණය කෙරුවා. ඒක නිසා මේ පනත හොඳ පැත්තට වාගේම නරක පැත්තටත් විශාල වශයෙන් සේවය කරලා තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. දේශපාලන වශයෙන් එයට මැදිහත් වෙන්න විශාල ඉඩක් ලැබුණොත් ඒ සමහර අවස්ථාවල මේ පනත වැරැදි ප්‍රතිඵල සමාජයට ගොඩ නඟනවා අපි දැක තිබෙනවා. ඒ නිසා ත්‍රස්තවාදය වැළැක්වීම අවශ්‍ය තත්ත්වයක් වුණාට, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත හරහා අපේ රටේ මතු වෙච්ච සමාජ තත්ත්වය ගැන අපි සාකච්ඡා කළා දැන් හොඳටම ඇති. අවුරුදු 40ක් මේ පනතත් එක්ක අපි ආරක්ෂණ වැඩ කරලා තිබෙනවා; දේශපාලන සාකච්ඡා කර තිබෙනවා. ඒක නිසා ත්‍රස්තවාදයයි, අන්තවාදයයි කියන පැති දෙක දුරු කරන්න, පරාජය කරන්න ඕනෑ වාගේම සමාජය ඇතුළේ විරුද්ධ මත දැරීම කියන එක අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒක නිසා ත්‍රස්තවාදය, අන්තවාදය පරාජය කරන්න නීතියක් අපි ගෙනෙන්න ඕනෑ. ඒ වාගේම සමාජය තුළ ස්වාධීන, නිදහස් භාෂණය සහ ස්වාධීනව අරගල කිරීමේ ඉඩ ආරක්ෂා කරන්න පුළුවන් නීතියක් ඒ තුළ තිබෙන්න ඕනෑ. ඒක නිසා ඒ ප්‍රශ්නය රටක් විධියට අපි ජයග්‍රහණය කරන්න ඕනෑ. මේ, එක ආණ්ඩුවක ප්‍රශ්නයක් නොවෙයි.

ත්‍රස්තවාදයේ අලුත් ස්වරූප තිබෙනවා. ඒකේ ඩිජිටල් ස්වරූපයක් තිබෙනවා. අද වන කොට ඒකේ ජාත්‍යන්තර ස්වරූපයක් තිබෙනවා. කලාපීය ස්වරූපයක් තිබෙනවා. අන්තවාදී ආගමික වෙනත් සම්බන්ධතා ඒකට තිබෙනවා. ඒ නිසා ත්‍රස්තවාදය කියන එක අද වෙන කොට තවදුරටත් පුංචි තැනක, පුංචි කැලයක, රට ඇතුළක තිබෙන පොඩි දෙයක් නොවෙයි. ඒක නොපෙනෙන ඩිජිටල් අවකාශය ඇතුළේ ගමන් කරන, මූල්‍ය පද්ධතියට සම්බන්ධ වුණු, ජාත්‍යන්තරකරණය වුණු ප්‍රපංචයක් විධියටයි තිබෙන්නේ. ඒ නිසා ත්‍රස්තවාදය පරාජය කරන්න නීතියක් අපි හදන කොට අන්න ඒ පළල් වපසරිය ගැන ඉතාම විධිමත් නිරීක්ෂණයක් එක්ක එය කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සභාවේ අද ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කරන්න අපි දරන උත්සාහය තුළ තිබෙන්නේ අලුත් නීතියක් එනතුරු රජයක් විධියට කළ හැකි ඉදිරිගාමී වෙනස් කිරීම් ඒ පනතට සිදු කිරීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට පෙර -1982 දී සහ 1988 දී- මේ පනතට ගෙනාපු සංශෝධනවලට වඩා අපි මේ ගෙනෙන සංශෝධනයේ ඉතාම ධනාත්මක තත්ත්වයක් තිබෙනවා. ඒක අපි දකින්න ඕනෑ. ඒ සංශෝධන දෙක පැරණි පනත බලාත්මක කරන්න ගෙනාපු සංශෝධන කියලායි ඒ කාලයේ අපි තේරුම් ගත්තේ. හැබැයි, මේ සංශෝධන පනත හරහා පැරණි පනත ඊට වඩා අඩු තැනකට ගෙන යන්න, එහි බර අඩු කරන්න අපි මහන්සි වෙනවා. යටත්විජිතයෙන් පසුව අපි හදන රට කුමක්ද කියන සංවාදය අපට හොඳින් නිම කරන්න අද බැරි වෙලා තිබෙනවා. පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකා රාජ්‍යය -PostcolonialSri Lankan State එක- අපිට තවමත් හදන්න බැරි වෙලා තිබෙනවා. ඒ ගමන් මාර්ගයේ එක පැත්තකින් අන්තවාදය, තව පැත්තකින් දේශපාලනය, තව පැත්තකින් ත්‍රස්තවාදය, තවත් පැත්තකින් ත්‍රස්තවාදයට ප්‍රති ත්‍රස්තවාදය ආදී වශයෙන් වූ පළල් අර්බුදයක අපි හිරවෙලා ඉන්නවා. ඒ නිසා ත්‍රස්තවාදය සම්බන්ධ සාකච්ඡාව නීතියක් විධියට මේ ආකාරයෙන් ගෙනාවත්, මේක තුළ අපි නිවැරදි කරන්න ඕනෑ දෙයක් විධියට තිබෙන්නේ, මේ රටේ යටත්විජිතයට පසුව හදන රාජ්‍යය කියන එකේ සංවාදය ධනාත්මකව නිම කරන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ සභාවේ ඉන්න ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මැතිතුමාගේ සීයා වන ජී.ජී. පොන්නම්බලම් මැතිතුමා සහ යදාමිණී ගුණවර්ධන මැතිතුමාගේ සීයා වන පිලිප් ගුණවර්ධන මැතිතුමා 1936 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සංවාද කරපු ප්‍රශ්නයම එතුමන්ලාගේ තුන්වැනි generation එකේ දරුවන්ටත් අද ඒ විධියටම සංවාද කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ජී.ජී. ගේ මුණුබුරා වන ගජේන්ද්‍රටත්, පිලිප්ගේ මුණුබුරා වන යදාමිණීටත් අද එක සභාවක ඒ ප්‍රශ්නය නැවත අහන්න වෙලා තිබෙනවා. එහෙම වෙලා තිබෙන්නේ, අපේ රටේ යටත්විජිතයෙන් පසුව හදන රාජ්‍යය සම්බන්ධ සංවාදය නිම කරන්න බැරි වුණු නිසායි. ඒ ගමන් මගට මේ නීතිය සම්බන්ධ වෙලා තිබෙනවා. මේ වෙලාවේ රජයක් විධියට අපි ධනාත්මක ඉදිරි පියවරක් තබනවා. නමුත්, මේ නීතියට එහා ගිය ත්‍රස්තවාදය සම්බන්ධ අලුත් නීති පද්ධතියකුත්, රාජ්‍ය සම්බන්ධයෙන් අලුත් එකඟතාවකුත් හදා ගත යුතුයි කියා යෝජනා කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නිම කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Dr.) Suren Raghavan to the Chair?

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)

I propose that the Hon. (Dr.) Suren Raghavan do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *left the Chair and* THE HON. (DR.) SUREN RAGHAVAN *took the Chair.*

[අ.භා.1.04]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුව ඉතා පැහැදිලිව මේ කාරණය කියනවා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා තමයි මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ගෙනාවේ. මේ රටේ ජනතාවට ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න එදා අවස්ථාවක් දුන්නේ නැහැ. ඒ පනත් කෙටුම්පත 1979 ජූලි 19 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබියදී, ජූලි 20 වැනිදා පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඒ වෙනකොට රටේ බරපතළ ත්‍රස්තවාදයක් මතු වෙලා තිබුණේ නැහැ. එදා ජයවර්ධන ආණ්ඩුව රටේ ජනතාවගේ සහන කප්පාදු කළා. ඔබ, අපි කාටත් මතකයි, හාල් පොත් කප්පාදුව. ඊට පෙර පැවැති ආණ්ඩුව ලබා දීපු හාල් පොත කප්පාදු කළේ ජයවර්ධන ආණ්ඩුව. ඒ කප්පාදු කිරීමත් එක්ක මේ රටේ ජනතාව එයට එරෙහිව යම් යම් තැන්වල විරෝධතා දැක්වූවා. අන්න, ඒ විරෝධතා මැඩ පැවැත්වීම සඳහා තමයි 1979 දී ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ගෙනාවේ. මේ පනත ගෙනෙන කොටත් ඉතා පැහැදිලිව කිව්වා, "මේක අවුරුදු 3ක කාලයකට පමණයි, දීර්ඝ කාලීනව ක්‍රියාත්මක වෙන්නේ නැහැ, 'තාවකාලික' කියන වචනය මේකට දැම්මේම, මේ පනත ගෙනෙන්නේ අවුරුදු 3ක කෙටි කාලයකට නිසා" කියලා.

මේ පාර්ලිමේන්තුවේ සිටි තුනෙන් දෙකක් මන්ත්‍රීවරු -එක්සත් ජාතික පක්ෂයේ බහුතරය- එදා ඒකට පක්ෂව ඡන්දය දුන්නේ මේක තාවකාලික පනතක් කියන අර්ථයෙන්. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා, ආර්. ප්‍රේමදාස අගමැතිවරයා, එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු ඇතුළු සියලුදෙනා එකතුවෙලා තමයි මේ පනත ගෙනාවේ. අවුරුදු 43කට පසුව අද එක්සත් ජාතික පක්ෂයට පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා, මේක ඇත්තටම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් නොවෙයි, රාජ්‍ය ත්‍රස්තවාදය ව්‍යාප්ත කිරීමේ පනතක් කියලා. මේක කැලෑ නීතියක්. සාමාන්‍ය ජනතාවගේ අයිතිවාසිකම් මුළුමනින්ම උල්ලංඝනය කිරීමක් තමයි මේ පනතින් සිදු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලු පුරවැසියන්ගේ ජීවත් වීමේ අයිතිය ආරක්ෂා කිරීම රජයක මූලික වගකීමක්. නමුත්, මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඒ අයිතිය ආරක්ෂාව නැති කළ පනතක්. ඒ නිසා තමයි එදා මේ පනත හඳුන්වා දෙනකොටම, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොටම ඒකට එරෙහිව එදා අපේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කර තිබෙන්නේ. එයින් අවුරුදු 43කට පසුව අද බහුතරයකට පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා මේක වැරැදියි; මේක කැලෑ නීතියක්; රාජ්‍ය ත්‍රස්තවාදය ව්‍යාප්ත කිරීම සඳහා තිබෙන පනතක් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව කලබලයේම මේ සංශෝධනය ගෙනාවේ ඇයි?

මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවංක වුවමනාවෙන්ද මේක ගෙනාවේ? නැහැ. පසුගිය කාලය පුරාවට අපි විපක්ෂයේ ඉඳන් ඉතා පැහැදිලිව දිගින් දිගට බලපෑම් කළා, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත -ඒ මර්දන පනත- වහාම අහෝසි කරන්න කියලා; මුළුමනින් අහෝසි කරන්න කියලා. නමුත් ආණ්ඩුව කිව්වා, "ඒක අහෝසි කරන්න බැහැ." කියලා. ඊට පස්සේ ගිය අවුරුද්දේ -2021- ජූනි මාසයේ නාමල් රාජපක්ෂ ඇමතිවරයා තමයි ඒ පනත සංශෝධනය කරන බව හදිසියේ, කලබලයේ පාර්ලිමේන්තුවට දැනුම් දුන්නේ. ඒක වුණේ කොහොමද? ඒක වුණේ නිකම් නොවෙයි. යුරෝපා සංගමය GSP Plus බදු සහනය අහෝසි කරනවා කියන යෝජනාව සම්මත කරන්න ලකලෑස්ති වෙච්ච වෙලාවේයි ඒක වුණේ. ජාත්‍යන්තරයට පෙන්වන්න තමයි ඔබතුමන්ලා අද මේ උප්පරවැට්ටිය කරන්නේ. මේ සොච්චම් හෝ සංශෝධන ගෙනෙන්නේ ඒ අර්ථයෙන්. ඒ මිස ඇත්තටම අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න, එහෙම නැත්නම් සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න නොවෙයි. මෙහෙම සොච්චම් සංශෝධනයක් ගෙනාවාට ඒ කැලෑ නීතිය මුළුමනින් අහෝසි වෙන්නේ නැහැ. ඇත්තටම මේ සොච්චම් සංශෝධනයෙන් සිදු වෙන්නේ මොනවාද? රඳවා තබා ගැනීමේ නියමයක් යටතේ යම් තැනැත්තකු මාස 18ක් රඳවා තබා ගැනීම මාස 12 දක්වා අඩු කර තිබෙනවා. ඇප ලබා දීම සම්බන්ධයෙනුත් පුංචි වෙනස්කමක් කර තිබෙනවා. අත් අඩංගුවට ගන්නා දින සිට අවුරුද්දක කාල සීමාවකින් පසුවත් නඩුවක් දැම්මේ නැත්නම්, ඊට පසුව appeal කරන්න පුළුවන්. ඒ වාගේම මාස12කින් පසුවත් නඩු විභාගය පටන් ගෙන නැත්නම් ඇප ලබා දීමේ අවස්ථාව මහාධිකරණයට තිබෙනවා. ඔච්චරයි! ඇත්තටම ගත්තොත්, අනෙක් ඔක්කොම තිබ්බ විධියම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිවරයාට තමයි සම්පූර්ණ බලය තිබෙන්නේ. මෙහි තිබෙන බැරෑරුම් කාරණය ඒකයි. ඇමතිවරයාගේ ඔළුවේ හැදෙන මනෝ විකාරය අනුව ඕනෑම පුද්ගලයෙකු යම්කිසි ක්‍රියාවකට සම්බන්ධයි හෝ සැකයි කියලා හිතුණොත් මේ නියෝගය පනවන්න පුළුවන්. ඒ කියන්නේ මොකක්ද? තමන්ට එරෙහිව නැඟී සිටින ඕනෑම පුද්ගලයෙකු මර්දනය කරන්න, අත් අඩංගුවට ගන්න මේ පනත පාවිච්චි කරනවා. ඒ සම්බන්ධයෙන් වන අත් දැකීම් ඉතිහාසයේ ඕනෑ තරම් තිබෙනවා. හිජාස් හිස්බුල්ලා නීතිඥවරයා කියන්නේ එක්කෙනෙකු පමණයි. හැබැයි, මේ රටේ ගම් බිම්වල ප්‍රසිද්ධ නැති තරුණ තරුණියන් දහස් ගණනක් මේ පනත පාවිච්චි කරලා අත් අඩංගුවට ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා වෙච්ච සිදුවීමක් මට මතකයි. උතුරේ තිලීපන් කියන තරුණයා -විශ්වවිද්‍යාල ශිෂ්‍යයා- එදා මාරාන්තික උපවාස කරමින් කිව්වා, "උතුරේ අපිට විතරක් නොවෙයි, දකුණේ ඔබටත් මේ පනතේ මර්දනය ළඟා වෙනවා. එදාට තමයි ඔයාලාට එය තේරෙන්නේ" කියලා. තිලීපන් එදා ජීවිත පරිත්‍යාගයෙන් එහෙම කිව්වේ මේ මර්දන පනත දෙමළ ජනතාවටත්, සිංහල ජනතාවටත්, මුස්ලිම් ජනතාවටත් එරෙහිව පාවිච්චි කරනවා කියන එක කල් තියා දැකපු නිසා. ඒ නිසා තමයි, ඒ මර්දන නීතියට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයත් ඉතා පැහැදිලිව අර්ථ විග්‍රහයන් කර තිබෙන්නේ. මාක් ප්‍රනාන්දු හිටපු

අගවිනිසුරුවරයා පවා තමන්ගේ අර්ථ දැක්වීම්වල ඉතා පැහැදිලිව කියා තිබෙනවා, මෙහි වෙනස් වෙන්න ඕනෑ දේවල් මේවායි කියලා. හැබැයි, ඒකට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් එක දවසින් සම්මත කළා. මහ ජනතාවට අවස්ථාවක් තිබුණේත් නැහැ, අදහස් දක්වන්න. හැබැයි, ඊට පසුව ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව මොකක්ද කළේ? ඒ පනත බලපවත්වන්නේ අවුරුදු තුනක් සඳහා විතරයි කියා සඳහන් එම පනතේ 29වැනි වගන්තිය ඒ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වෙලා අවුරුදු තුනක් අවසන් වනකොට - 1982 වර්ෂයේදී- අහෝසි කළා. ඒකට තමයි ඒ පනතට 1982 වර්ෂයේදී සංශෝධනය ගෙනාවේ. එමඟින් එම පනත තවත් ශක්තිමත් කළා. 1988-1989 කාලයේත් එය තවත් ශක්තිමත් කළා.

"ත්‍රස්තවාදය" කියන වචනයට අර්ථකථනයක් ඒ පනතේ කොහේවත් නැහැ. මොකක්ද ත්‍රස්තවාදය කියන්නේ? එහි නිර්වචනය මොකක්ද? අදත් ඒකට නිර්වචනයක් නැහැ. ඒ නිර්වචනය තීරණය කරන්නේ අදාළ විෂය භාර ඇමතිවරයා. ආරක්ෂක ලේකම්වරයායි, ඊට අනුව නියෝග නිකුත් කරන්නේ. නීතිපතිවරයාගේ අනුමැතියක් නැතිව ඇප ලබා ගන්න බැහැ. එතකොට ඒ පනතින් කර තිබෙන්නේ රාජ්‍ය ත්‍රස්තවාදය සම්පූර්ණයෙන් වර්ධනය කිරීමක්.

දැන් කියනවා, රැඳවුම් ස්ථානයට ගිහින් රැඳවියා ගැන සොයා බලන්න මහෙස්ත්‍රාත්වරයෙකුට පුළුවන් කියලා. රැඳවුම් භාරයේ ඉන්න පුද්ගලයාට පුළුවන්, තමන් රැඳවුම් භාරයේ සිටියදී තමාට ගැහුවා නම්, මාරාන්තික වධ හිංසා කළා නම්, ඒ ගැහුවේ කවුද කියලා දැනුම් දෙන්න. නමුත්, ගහන්නේ කවුද කියලා කොහොමද කියන්නේ? රඳවාගෙන ඉන්න අයගේ ඇස් බැඳලා නේ ගහන්නේ. ඒක තමයි ඇත්ත. ඇස් බැඳලා රට රට නිලධාරීන් ඇවිත් ගහලා - පහර දීලා-, අමානුෂික වධ දුන්නාට පසුව මහෙස්ත්‍රාත්වරයාට කොහොමද කියන්නේ, "මට ගැහුවේ අහවල් නිලධාරියා" කියලා? කෝ, සාක්ෂි? කවුද ඇතුළේ සාක්ෂි දෙන්න ඉන්නේ? තනියෙන් කළුවර කාමරයකට දාලා තමයි හතර වටෙන් ගහන්නේ. රැඳවුම් ස්ථානයට මහෙස්ත්‍රාත්වරයෙකු ගියාට ඒකෙන් උත්තරයක් ලැබෙන්නේ නැහැ. අධිකරණ වෛද්‍යවරයාට ගිහින් එම සැකකරු පරීක්ෂා කරන්න පුළුවන්. ඒක දැනුත් වෙනවා. අපි දන්නවා, අධිකරණ වෛද්‍යවරුන් පරීක්ෂා කිරීම් කරන්නේ කොහොමද කියලා. එයට ඕනෑ තරම් අත් දැකීම් ඉතිහාසයේ තිබෙනවා. අධිකරණ වෛද්‍යවරයා පත් කර ගන්නේත් බලයේ ඉන්න ආණ්ඩුව. ඒ ආණ්ඩුවට අවශ්‍ය කෙනා තමයි අධිකරණ වෛද්‍ය වාර්තාව දෙන්නේ. එම සැකකරු අධිකරණ වෛද්‍යවරයාට පෙන්වන්නේ කොහොමද? අත් අඩංගුවේ ඉන්න කෙනාට පහර දීම නිසා වෙච්ච තුවාල, patches වහලා, ශරීර අභ්‍යන්තරයේ වෙච්ච දේවල් සොයා ගන්න බැරි විධියට වහලා අධිකරණ වෛද්‍යවරයාට ඉදිරිපත් කරන හැටි අපි අත් දැකීමෙන් කියන්නම්. ඔබතුමන්ලා කියන මේ කථා හොඳයි කොණ්ඩෙ බැඳපු වීන්නුන්ට. යුරෝපා සංගමය මේවායින් රවටන්න බැහැ. ජාත්‍යන්තර ප්‍රජාව මේ සොච්චම් සංශෝධනයෙන් රවටන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතුවාට, එහෙම කරන්න බැහැ. ජාත්‍යන්තර ප්‍රජාවට මේ කැරට් අලය දීලා ඒ අය රවටන්න බැහැ. දැනටමත් යුරෝපා සංගමය ඉතා පැහැදිලිව කියා තිබෙනවා, "මේ සංශෝධන ප්‍රමාණවත් නැහැ. මේක නොවෙයි ඇත්ත සංශෝධනය" කියලා. මේකේ තිබෙන අයින් කළ යුතු හරයාත්මක දේවල් අයින් කරලා නැහැ. සහකාර පොලිස් අධිකාරිවරයෙකු හෝ ඊට ඉහළ බලයලත් නිලධාරියෙකු ඉදිරියේ දෙන ලද කට උත්තරය, එම කට උත්තරය දුන් කෙනා කළ පාපොච්චාරණයක් විධියට පිළිගන්නවා.

අපි දන්නවා සිද්ධ වන දේ. ගහලා ගහලා, ඇණ ගහලා, පුච්චලා අන්තිමට කියනවා, "මේක පිළිගනින්" කියලා. "මේක පිළිගනින්" කියලා කිව්වාට පස්සේ ඒ තිබෙන මාරාන්තික බිය - මරණයට තිබෙන බිය- නිසා ඕනෑම කට උත්තරයකට අත්සන් කරනවා. ASP කෙනෙකු ඇවිල්ලා තමයි වැඩේ කරන්නේ. ASP හෝ ඊට ඉහළ නිලධාරියෙකු ඉස්සරහා දෙන කට උත්තරයක්, ඔහු විසින් ස්වේච්ඡාවෙන් ලබා දුන් කට උත්තරයක් බව සඳහන් වගන්තිය මෙම සංශෝධන මඟින් අහෝසි කරලා නැහැ. ඒක මාරාන්තික වගන්තියක්. එම වගන්තිය නිසා තමයි මෙතුමන්ලා හැම දාම තමන්ට වාසිදායක විධියට ඒ පනත පාවිච්චි කළේ. ඒ වගන්තිය වෙනස් කරලා නැහැ.

"ත්‍රස්තවාදය" කියන්නේ මොකක්ද? ඒක හරියාකාරව නිර්වචනය වෙන්න ඕනෑ. පවතින ආණ්ඩුවට විරුද්ධව කථා කිරීම ත්‍රස්තවාදය ද? එහෙම සැලකුවොත් විසම්මුතියට ඉඩක් නැහැ. අද මෙමඟින් කරලා තිබෙන්නේ විසම්මුතියට තිබෙන ඉඩ සම්පූර්ණයෙන් අහුරා දැමීමක්; වෙනත් මතවලට තිබෙන ඉඩ සම්පූර්ණයෙන් අහුරා දැමීමක්. ආරක්ෂක ඇමතිවරයාට සිතැඟි විධියට කෙනෙකු රැඳවුම් භාරයේ තැබීමට නියෝග නිකුත් කරන්න පුළුවන්. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට හිතුණොත් 23වන දා -එනම් හෙට- ලංකාවේ නන් දෙසින් සෙනඟ කොළඹට එන බස් රථ පරීක්ෂා කරන්න පොලීසියට නියෝග දෙන්න, ඒක කරන්න පුළුවන්. දැන් එහෙම කරනවා. ඒ සියලු බස් රථ පරීක්ෂා කරන්න පොලීසියේ අය දැන් ලෑහැස්ති වෙනවා. ඇත්තටම ගත්තොත්, මේකද ප්‍රජාතන්ත්‍රවාදය? මේ වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව ගමන් කිරීමක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මට කියන්න කනගාටුයි මෙන්න මේ සිද්ධිය ගැන. මේක, පසුගිය මාසයේ පස්යාල ප්‍රදේශයේ මමත් සහභාගි වුණු රැස්වීමක වෙච්ච සිදුවීමක්. මම සහභාගි වුණු ඒ රැස්වීමට මේ ආණ්ඩුව දැනුවත්ව, හිතා මතා පුද්ගලයෙකු එව්වා, ඔහු එතැන කලහකාරී ලෙස හැසිරුණා. මම මූලාසනයේ ඉඳන් පොලීසියේ මහත්වරුන්ට කිව්වා, "කරුණාකර මේ පුද්ගලයාව ඉවත් කරන්න" කියලා. ඒ මොහොතේ එතැන හිටපු පොලිස් නිලධාරීන් හය හත්දෙනෙක් ඇවිල්ලා ඔහු එතැනින් ඉවත් කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ පොලිස් නිලධාරීන්ට විරුද්ධව charge sheet එකක් දෙනවා, "එහෙම ඉවත් කළේ ඇයි? ඒක වැරදියි. තමුසෙලාට ඕනෑ නැති වැඩක් නේ මේ කරලා තිබෙන්නේ" කියලා. කවුද charge sheet එක දෙන්නේ? SSP. Charge sheet එකක් දෙන්න කියලා SSPට කියන්නේ කවුද? බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා. අපට මතකයි, ඔය වාගේ දේශපාලන වුවමනාවලට වැඩ කරපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට වෙච්ච දේවල්. හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අනුර සේනානායක මහත්මයා එදා ඒ කියපු කියපු විධියට කියපු කියපු දේවල් කළා; ජනතාව මර්දනය කළා; නීතිය අතට අරගෙන අයථා විධියට පොලීසිය පාවිච්චි කළා. අන්තිමට එතුමා මාරාන්තික විධියට අසනීප වෙලා මැරෙන්න ගියත් දේශපාලනඥයෝ කවුරුවත් අඩුම ගණනේ එතුමා බලන්නවත් ගියේ නැහැ. රාජපක්ෂලා එදා ඔහුගෙන් වැඩ ගත්තා. වැඩ අරගෙන අන්තිමට පැත්තකට දැම්මා. ඔහු සතෙකු වාගේ මැරිලා යන තත්ත්වයට පත් වුණා. එවැනි පොලිස් නිලධාරීන්ට -හීලෑ වෙච්ච පොලිස් නිලධාරීන්ට- සලකපු විධිය ඒක. ඒ නිසා දැන් ඉන්න නියෝජ්‍ය පොලිස්පතිවරුත් තේරුම් ගත යුතුයි, නීතිය වැරදි විධියට පාවිච්චි කළාට පස්සේ ඒ අයටත් අත් විඳින්න වන ඉරණම මොකක්ද කියලා. මේක තමයි ප්‍රායෝගික තත්ත්වය.

මේ සංශෝධනවලින් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නිවැරදිව ස්ථාපිත කරන්න බැහැ. පැහැදිලිව ගත්තොත්, මේ සංශෝධනවලින් කර තිබෙන්නේ ජාත්‍යන්තර ප්‍රජාව රැවටීමක්. මෙමඟින් තාවකාලික උප්පරවැට්ටියක් යොදා තිබෙනවා, ජාත්‍යන්තර ප්‍රජාව රවටන්න. එහෙම නැතිව, මෙය මේ රටේ

[ගරු විජිත හේරත් මහතා]

ජනතාවගේ අයිතිවාසිකම් -පුරවැසි අයිතිවාසිකම්- ආරක්ෂා කිරීම සඳහා සද්චේතනාවෙන් ගෙනෙන සංශෝධනයක් විධියට අපට කිසිසේත් පිළිගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතා පැහැදිලිව කියනවා, ඒ මාරාන්තික පනත මඟින් කෙරෙන රාජ්‍ය ත්‍රස්තවාදය බලාත්මක කිරීමේ, එහෙම නැත්නම් ව්‍යාප්ත කිරීමේ කටයුත්ත අඩ පණ කරන්න මේ සංශෝධන දෙක තුන කිසිසේත් සමත් වන්නේ නැති බව. මේක රාජ්‍ය ත්‍රස්තවාදය නීත්‍යනුකූලව පවත්වාගෙන යන්න තවත් උඩ ගෙඩි දීමක් පමණයි. ඒ නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මුළුමනින් අහෝසි කළ යුතුයි. එය තමයි අපේ ස්ථාවරය. ඒ වෙනුවෙන් තමයි අපි මැදිහත් වෙන්නේ. ඒකෙන් තමයි රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න පුළුවන් වෙන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
டுத்ததாக, கௌரவ றவுப் ஹகீம் அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

[1.15 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Presiding Member, I was listening to the Hon. (Prof.) G.L. Peiris, Minister of Foreign Affairs, when he prefaced his presentation of this Bill. He said that this is only an initial step. However, he alluded that these are very substantial Amendments and certainly not cosmetic amendments. He also proudly declared that these Amendments break new ground. Given his ability with the Queen's language, he was able to pull the wool over the eyes of the entire House by saying various words in trying to describe the effort of this Government, which basically is a woefully inadequate cosmetic exercise and a minimalist approach to change the *status quo* as far as the Prevention of Terrorism (Temporary Provisions) Act is concerned. That is why we have decided to vote against this Bill, particularly because this does not serve any purpose for the simple reason that the impact of these Amendments is merely superficial and this is a charade. The Hon. Minister of Justice is here. He will know that all of these Amendments, except for that relating to the reduction of the six months' period, have virtually materialized through other means connected with legislative provisions in other Acts of Parliament, constitutional safeguards or judicial interpretation.

So, what are we trying to tell the country and the international community through this effort? This is virtually a puerile attempt to take the focus away from the timely need to totally do away with this draconian piece of legislation from being implemented in this country. Therefore, we are calling, at least, for a moratorium on the Prevention of Terrorism Act. As a prelude, the Hon. Minister had already said that he is prepared to further consider amendments. There was a robust presentation made by the Leader of the Opposition in defence of our position to oppose this Bill and he was followed by the former Prime Minister, the Hon. Ranil Wickremasinghe. He, too, very clearly articulated from his practical experience the various historical happenings that has impeded the criminal justice system in this country through such faulty legislation which deprives the liberty of the citizens.

Sir, the biggest culprits, as far as I am concerned, are the Police Department and the Attorney-General's Department. I say this because they are the people who come and tell the Ministers and the Cabinet, "You cannot do away with the Prevention of Terrorism (Temporary Provisions) Act. We must retain all these draconian provisions". Those people have found it to be a very convenient tool to conclude investigations, wrap up investigations as they please and then get promotions.

I dare say this. Without any rigorous and substantial supporting evidence, you are able to succeed in inducing and coercing a suspect and obtain a confession under duress. Most of the time, it is due to the mental trauma and the physical abuse or the torture that these suspects are subjected to. Confessions being admissible and important time-tested safeguards in the Evidence Ordinance being made inapplicable has resulted in serious travesty of justice. In many cases, this has been pointed out by superior courts in this country.

Officers - with an exception of a very few - have resorted to this PTA as a means to get promotions; to show that they are efficient in exposing terrorism. What is more? What the Hon. Ranil Wickremesinghe said is also very true, that there is so much of intrigue within the officers of our intelligence agencies; one is against the other and therefore, he wants to fix the other. What has happened to Shani Abeysekara, one of our reputed, very efficient investigators? What has happened to former DIG Ravi Seneviratne, another reputed and a very good officer with a lot of integrity? They are all under the scanner of this particular legislation. These are all officers who have served the country with distinction; but now there is a witch-hunt against them using the same legislation. Sir, this is an utter shame!

I would like to say that there are umpteen number of judges who have criticized the variety of manners in which this legislation is being abused. Recent among them, I would like to mention, are Justice Bandula Karunarathna, Justice Janak De Silva and High Court Judge Amal Ranaraja in the Azath Salley's case. They have all pointed out the puerile, very inefficient and deliberate manner in which these provisions are being abused. This has also been pointed out by the young judges who have been bold enough to look at the weaknesses in this legislation. They have pointed out the inefficiencies very clearly.

What happened in the Azath Salley's case? Of course, that was done under the ICCPR Act, but remember, even the PTA contains the similar provision under Section 2(1)(h). It is the usual practice of the AG's Department to use Section 2(1)(h).

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, you are making a very valid contribution, but we have to be mindful of time.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

I know.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

You have two more minutes.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Let me say this, Sir.

What happened in the Azath Salley's case is a damn shame! Three of our Members of Parliament went and made a statement. They cherry-picked certain portions of a statement made at a press conference and then tried to bring an indictment against him. I dare say this. I asked the officers in the AG's Department who aided and abetted in creating this indictment and the weakness of it was clearly exposed in the High Court judgment. This is a damn shame! Our institutions have become the tools in the hands of their political masters. This must end, Sir. These issues must be exposed. This is a damn shame!

See what has happened. In every case we find - the Hon. Ranil Wickremesighe has also pointed out how the Easter Sunday investigators had attempted to take the direction of the investigations in a different way because certain intelligence officers were coming there to save the suspects. Finally, they were found to be implicated in the Easter Sunday attacks. These were the very people whom intelligence officers wanted to release. Now they are found to be the culprits of the Easter Sunday attacks. Now the Cardinal has gone to Geneva and the matters have been taken up there. The High Commissioner for Human Rights has, in her statement, asked the Government to look into the possibility of security forces being involved in this entire conspiracy. It has gone to that extent.

Now we resort to this piece of legislation.

With so many years of use, how much has been achieved which has finally contributed to radicalizing people who are held in custody for so many years for no fault of theirs? That is the type of mental trauma that you subject them to. These institutions are plagued with corruption and impunity and they incentivize torture. That is what is happening and I would like to say this, Hon. Presiding Member. Finally, the PTA has shown distrust and also insecurity and has caused human suffering to untold number of people. Therefore, it is time that we totally do away with this draconian piece of legislation and at least a moratorium must be brought to the implementation of the PTA and therefore this Act must be thrown out from the law books of this country.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you, Hon. Rauff Hakeem, for your contribution. රටක ප්‍රජාතන්ත්‍රවාදයේ ගැඹුර පවතින්නේ එම රටේ නීතියේ ආධිපත්‍යයෙහි පැවැත්ම මතයි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.25]

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත - Prevention of Terrorism (Temporary Provisions) Act which is called the PTA- සංශෝධනය කිරීම සඳහා ගරු ඇමතිතුමා අද කටයුතු කර තිබෙනවා. මේ පනත 1979 දී හඳුන්වා දෙනකොටම within brackets යටතේ දමා තිබෙනවා, "තාවකාලික විධිවිධාන" කියලා. අපරාධ නීතියේ තිබෙන වරදවල්, ඒවායේ දණ්ඩන සඳහන් කර තිබෙන දණ්ඩ නීති සංග්‍රහය ආඥා පනත ඉදිරිපත් කළේ කොයි කාලයේදීද? ඒක ඉදිරිපත් කළේ 18 වන සියවස අග භාගයේදී. 1889 ජනවාරි 01 වන දා සිට තමයි දණ්ඩ නීති සංග්‍රහය අපේ රටේ ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ. දණ්ඩ නීති සංග්‍රහය පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවලට, අසල්වැසි ඉන්දියාව වාගේම හැම රටකටම පොදුයි. හැබැයි, ඒ වාගේ නොවෙයි මේ පනත. අපේ රටේ ඇති වූ විශේෂ තත්ත්වයකට මුහුණ දීම සඳහා තාවකාලික විධිවිධානයක් තමයි මේ පනත මඟින් හදලා තිබෙන්නේ. 1979 අවුරුද්දේ තමයි මේ පනත හඳුන්වා දුන්නේ. ඒ අනුව මේ වන විට මෙම පනතට අවුරුදු 43ක කාලයක් ගත වෙලා තිබෙනවා. මේකට 'තාවකාලික විධිවිධාන පනත' කියා කිව්වාට තවමත් ක්‍රියාත්මක වෙනවා. කෙසේ වෙතත්, මම අපේ අධිකරණ ඇමතිතුමාටත්, විදේශ කටයුතු ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ සංශෝධනයක් හෝ ගෙන ඒමට කටයුතු කිරීම සම්බන්ධයෙන්. ඊට හේතුව මොකක්ද? මේ සංශෝධන යටතේ මූලික වශයෙන් පුද්ගලයෙකු රඳවා ගැනීමේ කාල සීමාව - detention period - මාස 18 සිට මාස 12ක් දක්වා අඩු කර තිබෙනවා. Clause 3 යටතේ "Insertion of section 9A and 9B" හඳුන්වා දී තිබෙනවා. පොලීසියට පුද්ගලයෙකු රඳවා තබා ගන්න පුළුවන් කාල සීමාව කලින් තිබුණේ 72 hours කියායි. ඒ කාල සීමාව දැන් පැය 48 දක්වා අඩු වෙලා තිබෙනවා.

ඊළඟට, තවත් සංශෝධන කිහිපයක් තිබෙනවා. ඒ අනුව මහෙස්ත්‍රාත්වරයෙකුට ඒ පුද්ගලයා රඳවා තැබීමේ ස්ථානයට, place of detention එකට යන්න පුළුවන්. ඒ වාගේම ඔහුව යම් ශාරීරික හිංසනයකට ලක් කර තිබෙනවා නම්, වධ දීමක් කර තිබෙනවා නම් ඒක නිරීක්ෂණය කරන්න පුළුවන්. ඒකට ඉංග්‍රීසියෙන් කියනවා torture කියලා. ඊළඟට, ඔහුව JMO කෙනෙකුට යොමු කරන්න පුළුවන්. ඒ ස්ථානය ආරක්ෂා සහිත නැත්නම් ස්ථානය වෙනස් කරන්න කියලා නියෝගයක් දෙන්න පුළුවන්. ඊළඟට, මානව හිමිකම් කොමිසමට දැනුම්දීමක් කරන්න පුළුවන්. ඒ වාගේම නීතිඥ මහත්මයෙකුට ඒ පුද්ගලයා රඳවා තබා ඇති ස්ථානයට හෝ රිමාන්ඩ් බන්ධනාගාරයට ගිහිල්ලා, ඒ සැකකරු හමු වෙන්නත් පුළුවන්. දැන් විතරක් නොවෙයි, අපි මේ පනත යටතේ නඩු කථා කරලා තිබෙන්නේ. මම මේ යටතේ සිය ගණනක් විතර නඩු කථා කරලා ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දකුණේ තරුණයන් වෙනුවෙන් නඩු කථා කළා මට

[ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මතකයි. අපේ ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. එතුමාගේ පියාණන් වන කුමාර් පොන්නම්බලම් මැතිතුමා, මෝතිලාල් නේරු මැතිතුමා ඒ කාලයේ හිටපු leading lawyersලා. ඒ අය කොළඹ මහාධිකරණයේදී PTA එක යටතේ, විශේෂයෙන්ම උතුරු-නැගෙනහිර දමිළ තරුණයන් වෙනුවෙන් නඩු ගණනාවකට පෙනී සිටියා. අද මේ පනත සඳහා ඉදිරිපත් කර තිබෙන සංශෝධන ප්‍රමාණවත් කියලා මම කියන්නේ නැහැ. නමුත්, යම් ආකාරයක සාධනීය ඉදිරි පියවරක් මෙතැන තිබෙනවා. අනෙක් පැත්තෙන්, මේ පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්ම කාරණය මේකයි. සාමාන්‍යයෙන් අපරාධ නීතිය -දණ්ඩ නීති සංග්‍රහය- යටතේ, යම් මිනී මැරුමක් වෙන්න පුළුවන්; මිනී මැරීමට තැත් කිරීමක් වෙන්න පුළුවන්; මංකොල්ලයක් වෙන්න පුළුවන්; සොරකමක් වෙන්න පුළුවන් යම් සැකකරුවෙක් පොලීසියට කරන ලද ප්‍රකාශයක් අපරාධ නඩු විභාගයේදී ඔහුට විරුද්ධව යොදා ගැනීම අපරාධෝච්චාරණයක්, confession එකක් හැටියට යොදා ගැනීම වළක්වා තිබෙනවා, සාක්ෂි ආඥා පනතේ 24 වන වගන්තිය අනුව. සාක්ෂි ආඥා පනතේ 25 සහ 26 වගන්තිත් ඒකට අදාළයි. හැබැයි, මේ පනත් කෙටුම්පත මඟින් එය ඉවත් කර තිබෙනවා. එතකොට සාමාන්‍ය අපරාධයක් යටතේ, සාක්ෂි ආඥා පනතේ 24 වගන්තියෙන් හදා තිබෙන්නා වූ ඒ තත්ත්වය මේ සංශෝධනයෙන් පවා ඉවත් වෙලා නැහැ. මෙහි ප්‍රධානම ලක්ෂණය තමයි දැන් මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ, යම්කිසි වරදක් කළා යැයි සැක කරනු ලබන සැකකරුවෙකු සහකාර පොලිස් අධිකාරිවරයෙකුට වඩා ඉහළ කෙනෙකු -අධිකාරි කෙනෙකු වෙන්න පුළුවන්, DIG කෙනෙකු වෙන්න පුළුවන්- ඉදිරියේ කරන ලද ප්‍රකාශයක් ඔහුට එරෙහිව නඩු විභාගයේදී භාවිත කරන්න පුළුවන් වීම.

සාමාන්‍යයෙන් එවැනි අවස්ථාවකදී විත්තිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥයන් ඒකට විරුද්ධ වෙනවා, "මේක ස්වේච්ඡාවෙන් හෝ කැමැත්තෙන් කරපු ප්‍රකාශයක් නොවේය" කියන පදනම මත. එතකොට වෙන්නේ, එම ප්‍රකාශ කැමැත්තෙන් කළාද, නැද්ද කියන එක විමසීම සඳහා අතුරු සාක්ෂි විභාගයක් පවත්වන එක. ඒකට කියන්නේ, *voir dire* කියලා. මම මේ ගැන හොඳට දන්නවා. මොකද, මේ පාර්ලිමේන්තුවේ මට මතක විධියට කාරක සභා කාමර අංක 02දී, 1987 වසරේ ආණ්ඩු පක්ෂ රැස්වීම පැවැත්වුණු වෙලාවේ hand grenades දෙකක් ගැහුවා. එම සිදුවීමෙන් දෙනියායේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කීර්ති අබේවික්‍රම මැතිතුමා මිය ගියා; පාර්ලිමේන්තු සේවකයෙක් මිය ගියා; ඇතුලත්මුදලි මැතිතුමා බරපතළ තුවාල ලැබුවා. එම සිද්ධිය සම්බන්ධයෙන් විත්තිකරුවන් පස්දෙනෙකු නම් කර තිබුණා. ඒ සියලු දෙනාම මේ පාර්ලිමේන්තුවේ හිටපු සේවකයෝ. ප්‍රසිද්ධ "අජිත් කුමාර නඩුව" කියන්නේ ඒක තමයි. කාරක සභා කාමර අංක 02දී තමයි එම සිදුවීම වුණේ. එම නඩුවට පෙනී සිටින කොට, විත්තියේ නීතිඥයන් හැටියට අපි ඇවිල්ලා මේකේ සම්පූර්ණ දිග, පළල බැලුවා. ඒ සිද්ධිය ඇති වුණු කාමරයටත් ගිහිල්ලා බැලුවා. එම සිදුවීමේදී අපරාධෝච්චාරණ ස්වරූපයේ ප්‍රකාශන - confessional statements - 14ක් record කර තිබුණා, SSP බෙනට් පෙරේරා. නඩුව අහගෙන යන කොට, මේ ප්‍රකාශන නඩුවට අදාළ කරගන්න හදන කොට අපි ඊට විරුද්ධ වුණා. විරුද්ධ වෙලා, අතුරු සාක්ෂි විභාගයක් කළා. හැබැයි, ඒ වෙලාවේ රටේ තිබුණු වාතාවරණය තුළ -මේවා දැන් හුඟ දෙනෙකුට අමතකයි.- බෙනට් පෙරේරා මැතිතුමා නාඳුනන තුවක්කුකරුවකු විසින් ඝාතනය කළා. එතකොට සාක්ෂිකරු නැහැ; ප්‍රකාශය සටහන් කළ SSP නැහැ. ඊට පසුව මොකද වුණේ? ඔහුට assist කළ ASP සාක්ෂියට ගෙනාවා. අපිට ඕනෑ කරන්නේ, මේක කැමැත්තෙන් කළ ප්‍රකාශයක් නොවෙයි කියලා ඔප්පු කරන්නයි. යම් බලපෑමක් වුණාය කියලා ඔප්පු කර ගත්තොත්, ඇති නේ. ඕනෑම පොලිස් නිලධාරියෙක් සාක්කු සටහන් පොතක් තබා ගන්න ඕනෑ. හැම movement එකක්ම ඔහු ඒකේ සටහන් කරන්න ඕනෑ. විත්තියේ නීතිඥවරු හැටියට අපි ඒක තමයි ඇදලා ගත්තේ. අර සහකාර පොලිස් අධිකාරිවරයා ඒකේ සටහනක් දමා තිබුණා, "බෙනට් පෙරේරා මහතාගේ 9mm revolver එක ප්‍රකාශ ගන්නා හැම වෙලාවේම මේසය මත තිබුණා" කියලා. That is the intimidation; ඒක තමයි බලපෑම. එතකොට ස්වේච්ඡාවක් නැහැ. ඊට පස්සේ මොකක්ද වුණේ? අතුරු සාක්ෂි විභාගයේදී, "අජිත් කුමාරගේ ඒ ආකාරයෙන් සටහන් කරගත්ත කිසිදු ප්‍රකාශයක් අදාළ කරගන්න බැහැ" කියලා ත්‍රිපුද්ගල මහාධිකරණ විනිශ්චය මණ්ඩලය තීන්දු කළා. ඒ අනුව සම්පූර්ණයෙන් ඒ සාක්ෂි ටික එළියට ගියා. ඉතුරු පරිවේෂණීය සාක්ෂිවලින් නඩුව ඔප්පු කරන්න බැරි වුණා. විත්තිකරුවෝ පස් දෙනාම නිදහස් වුණා. මම මේ පෙන්වා දුන්නේ, කොහොමද මේවා වෙන්නේ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුල් PTA එක මගේ ළඟ තිබෙනවා. මුල් පනතේ දෙවැනි වගන්තිය යටතේ වැරදි සහ දණ්ඩන ගැන තිබෙනවා, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් යනාදි වශයෙන්. ඒවා එහෙමම තිබෙනවා. අපි හුඟක් වෙලාවට කරන්නේ පස්වැනි වගන්තියට යන එකයි. පස්වැනි වගන්තියේ (a), (b) කියලා දෙකක් තිබෙනවා. ඒකේ (b) යටතේ වරද පිළිගත්තාම, අවුරුදු හතක බන්ධනාගාරගත කිරීමකට යටත් වෙනවා. අවුරුදු හත දක්වා කිව්වාට අවුරුදු තුනක් විතර දඬුවම් දෙන්න පුළුවන්. එතකොට ඉක්මනට බන්ධනාගාරයෙන් එළියට එනවා. එහෙම වුණු සිද්ධි තිබෙනවා. මේ පනත යටතේ -දැන් නොවෙයි, මම දේශපාලනයට එන්නත් කලින් 1987-1988 කාලයේ; ඒ කාලයේ තමයි නඩු ආවේ- නඩු කථා කළ නීතිඥයෙක් හැටියට මම මෙතැනදී පෙන්වා දෙන්න හැදුවේ මේකයි. ඒ කාලයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කර ගන්න තමයි, ආණ්ඩු පක්ෂ රැස්වීම පැවැත්වූවේ. දැන් තිබෙන Hotel Cinnamon Grand එකට ඒ කාලයේ කිව්වේ Hotel Oberoi කියලා. Hotel Oberoi එකේ නවත්වා හිටපු මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවට එක්කගෙන ආවේ ඉස්සරහින් armoured car එකක් සහ පිටුපසින් තව armoured car එකක් යොදවා ගෙනයි. මේවා සමහරුන්ට අමතකයි. එම නඩුව පටන් ගන්නකොට, ඒ කාලයේ හිටපු පොලිස්පති ෆ්‍රැන්ක් ද සිල්වා මහත්මයා ඇවිල්ලා කිව්වා, "මේක කල් දමන්න ඕනෑ. මොකද, පොලිස් නිලධාරින් උසාවි එන්න බයයි" කියලා. පොලිස් නිලධාරින් උසාවි එන්න බය කාලයකුත් තිබුණා. ඔය සිද්ධි ඔක්කොම වෙලා ඊට පසුව නඩුව පටන් ගන්න කොට විත්තිකාරයෝ කිව්වා, "අපිට එන්න ආරක්ෂාව මදි" කියලා. එහෙම තමයි ඒ කාලයේ වුණේ; එම නඩුවේදී වුණේ ඔන්න ඕක තමයි. එම නිසා මෙතැනදී අපි මතක තබා ගන්න ඕනෑ, 1979දී මේ පනත ගෙනාවේ විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර ප්‍රදේශවල තිබුණු ඒ ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම සඳහා බව.

ඒක නිසා තමයි "තාවකාලික විධිවිධාන" කිව්වේ. හැබැයි මොකද වුණේ? 1988-89 වෙනකොට දකුණේ තරුණයෝ -ඒ වෙලාවේ සිදු වූ තරුණ නැඟිටීම එක්ක- සිය දහස් ගණනකට නඩු පැවරුවා මේ පනත යටතේ. අද වුණත් පුළුවන් මේ පනත යටතේ නඩු පවරන්න. මේ සංශෝධනයෙන් පස්සේ නඩු පැවරුවොත් වෙන්නේ රඳවා තබා ගත හැකි කාලය මාස 18, මාස 12ට අඩුවන එක. මාස 18ට තිබුණු detention කාලය මාස 12ට ඇවිල්ලා තිබෙනවා. පළමුවෙනි Schedule එකේ එන වැරදිවලට නම් නඩුව අවසන් වෙනකම් ඇප නොදී ඉන්න පුළුවන්. ඒ කාලය කොච්චරද කියන්න බැහැ. එතැනදී මානව හිමිකම් කඩවීමක් සිදු වෙනවාය කියන ප්‍රශ්නය අද මතුපිටට ඇවිල්ලා තිබෙනවා. මම පෙන්වා සිටියේ ප්‍රායෝගික අත්දැකීම් කිහිපයක්.

ගරු විදේශ ඇමතිතුමා අද සභාවට ඉදිරිපත් කළ සංශෝධනවලින් පනතේ තිබුණු කරුණුවලට වඩා යම් සාධනීය පියවරක් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, ඒ ඉදිරියට යෑම සීමිතයි. Detention Ordersවලට සහ තව සුළු කරුණු කිහිපයකට තමයි මේ සංශෝධනය බලපාන්නේ. ඒ තමයි, Magistrate කෙනෙකුට රැඳවුම් ස්ථානයට visit කරන්නට පුළුවන්, සැකකරු JMO කෙනෙකුට ඉදිරිපත් කරන්න පුළුවන් වාගේ කරුණු. එතකොට අර මම කියපු කාරණය, torture කියන එක අඩු කර ගන්න, වළක්වන්න පුළුවන්. හැබැයි, මෙතැනින් එහාට යන්න නම් මොනවාද කරන්න ඕනෑ? අද රටවල් ජාත්‍යන්තර මට්ටමේ නීති, Counter-Terrorism Acts පනවලා තිබෙනවා. යහ පාලන ආණ්ඩුව කාලයේ නීතිපති දෙපාර්තමේන්තුවත් සම්බන්ධ කරගෙන ආරක්ෂක අංශවලත් අදහස් අරගෙන Counter Terrorism Bill -කෙටුම්පත- සකස් කළා. ඒක කළේ international normsවලට එකඟව.

මේ අවස්ථාවේ මේ සංශෝධන නිසා තිබුණු තැනින් ඉදිරියට යෑමක් සිද්ධ වුණත්, අද තිබෙන ලෝක තත්ත්වය සහ රටේ තත්ත්වය කියන මේ සියලු දේ එක්ක ගත්තොත්, මෙතැනින් එහාට ගිහින් අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙනවා නම් ඒක තමයි වඩාත් සුදුසු වෙන්නේ කියලා මා හිතනවා; යෝජනා කරනවා.

මම අවසාන වශයෙන් සඳහන් කරන්නේ මෙච්චරයි. අද මම ගරු අධිකරණ ඇමතිතුමාගේ අවධානයටත් මේ කාරණය යොමු කළා. මම මේ සභාවට ආවේ උසාවියේ ඉඳලා. දැන් විනිශ්චයකාරවරයෙක් උසස්වීමක් ලබලා ගියාම ඒ උසාවියට ස්ථිර විනිශ්චයකාරවරයෙක් පත් කරලා එවන්න සති දෙක තුනක් යනවා. එතකොට වෙන්නේ වෙනත් උසාවියක විනිශ්චයකාරවරයෙක් තමන්ගේ උසාවියට ගිහින් එතැන තිබෙන නඩු ටික කැඳවලා පැය දෙකහමාරකට විතර පස්සේ තමයි ධුරය හිස් වූ විනිශ්චයකාරවරයාගේ උසාවියට එන්නේ. අද මට පාර්ලිමේන්තුවට එන්න පරක්කු වුණේ ඒ නිසා. ඒක අධිකරණ නිලධාරින්ගේ වරදක් කියන්න බැහැ. That is administration of justice. එතැනයි issue එක. ගිහින් බලන්නකෝ උසාවි ටිකට. අපි කොවිඩ් ගැන කථා කරනවා. මෙහෙම වුණොත් කොවිඩ් හදාගෙනයි උසාවියෙන් එළියට එන්න වෙන්නේ, නඩුකාර උන්නාන්සේලාටයි, නීතිඥවරුන්ටයි ඔක්කෝටම. ඒ තැන්වල හැරෙන්න ඉඩක් නැහැ. මම මේ එතැන ඉඳලා ඇවිල්ලායි කියන්නේ. මේ පනත් සංශෝධනය කිරීම හොඳයි, නීතියේ ඉදිරි ප්‍රගමණයට. හැබැයි, සාධාරණත්වය විත්තිකරුවන්ටත්, නීතිඥයන්ටත්, නඩු යන්නන්ටත් සිද්ධ වෙන්න නම්, අධිකරණවල පරිපාලනය මීට වඩා විධිමත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය අවධානය යොමු කළ යුතු බව අවධාරණය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත 1979 දී ගේනකොට ඒකට විරුද්ධ වූ පාර්ශ්ව සමඟ හිට ගත් කෙනෙකු විධියට තමයි අද මම මේ සංශෝධනය ගැන කථා කිරීමට අදහස් කරන්නේ. මම නම් මේ පනතට එදා සිට අද දක්වාම විරුද්ධයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත තුළ මානව අයිතියක් ගැන කථා කිරීම හෝ මිනිසුන්ගේ නිදහස ගැන කථා කිරීම හෝ බොරුවක්. සිංහල තරුණයාටද, ද්‍රවිඩ තරුණයාටද, මුස්ලිම් තරුණයාටද කියන එක නොවෙයි මෙතැන වැදගත්. ඉතා මානව විරෝධී පනතක් තමයි එදා ගෙනාවේ. මේ පනත ගෙනා ජේ.ආර්. ජයවර්ධන පවා දන්නවා මෙහි තිබුණු භයානකත්වය. ඒ නිසා එතුමා කිව්වා, මේක මාස හයකට තාවකාලිකව ගේන්නේ කියලා. ඒ නිසා ලිව්වා, "තාවකාලික" පනතක් කියලා. ඒ විධියට තමයි එදා මේ පනත ගෙන ආවේ. එදා ඒ විධියට මේ පනත ගෙනැල්ලා 1982, 198දී පනත සංශෝධනය කළා. මේක ගෙනාවේ, for prevention. As you know, Hon. Presiding Member, it was brought in for prevention, but today this is being used for curative purposes. සහරාන් බෝම්බ ගැහුවාට පස්සේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ක්‍රියාත්මක කරනවා, ඒ සඳහා. නමුත් ඇත්තටම ඒවා වැළැක්වීම සඳහායි මේ පනත ගෙනාවේ. මොකද, එදා තිබුණේ දිගු ගැස්සුණු අරගළයක්. ඒ අරගළයට තාවකාලික පිළියමක් විධියට තමයි එදා මේ පනත ගෙනාවේ. එදා මේ පනත ගෙනාවේ කේ.ඩබ්ලිව්. දේවනායගම් ඇමතිතුමා. එදා විපක්ෂයේ පළමු කථාව කරන්නේ මෛත්‍රීපාල සේනානායක මැතිතුමා. එතුමා එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු නියෝජ්‍ය නායකයා. එතුමා එදා මොකද කියන්නේ?

"මහජන ආරක්ෂක පනත යටතේ අවශ්‍ය පියවර ගත හැකි තත්ත්වයක් උතුරේ තිබියදී එම තත්ත්වය පදනම් කරගෙන මේ පනත ඉදිරිපත් කිරීමෙන් ආණ්ඩුව අදහස් කරන්නේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති නිසා මහජනතාවගේ ප්‍රශ්න විසඳීමට අසමත් වීමෙන් නුදුරු අනාගතයේ දී පැන නැඟිය හැකි දේශපාලන උද්ඝෝෂණ මැඩ පැවැත්වීමට හැකි බලතල රට පුරා ක්‍රියාත්මක කිරීමට අවසර පැතීමයි."

මෙන්න මේ විධියට එතුමා ඊට තනිකරම විරුද්ධ වෙනවා.

"මෙරට පුවත්පත් හා විදෙස්වලින් එන පුවත් පත් පාලනය කිරීමේ බලය, උසාවි අවසර පත්‍රයක් නැතිව පුද්ගලික නිවෙස්වලට ඇතුළු වීම, සෝදිසි කිරීම, ලිපි ලේඛන අත් අඩංගුවට ගැනීම, සිරභාරයේ පැය 24 කට වඩා තබා ගැනීමට නොහැකි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් නීතිය පැය 72 දක්වා දීර්ඝ කිරීම, ... "

යනුවෙන් එතුමා දිගටම මේ පනත් කෙටුම්පත පිළිබඳව අදහස් දක්වනවා.

"මේ රටේ සියලුම දේශපාලන ක්‍රියාකාරිත්වය මර්දනය කිරීම සඳහා සකස් වූවක් බව පෙන්වා දිය යුතුය."

යනුවෙන් එතුමා වැඩිදුරටත් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ ස්ථාවරයේ තමයි මම එදාත් හිටියේ; අදත් ඉන්නවා. මම කොයි පක්ෂයේ හිටියත් මට මගේ ප්‍රතිපත්ති නම් වෙනස් කරන්නට බැහැ. මම අපේ පක්ෂයටත් කිව්වේ, මේ පනත් කෙටුම්පතට දැඩි විරෝධතාවක් තමයි අපට තිබෙන්නේ කියලා.

එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ විවාදයේදී කථා කළේ නැති වුණාට, එතුමිය මේ පනත් කෙටුම්පත ගැන විවාදයට වරින් වර කෙටියෙන් සම්බන්ධ වෙනවා. එතුමියගේ ස්ථාවරයත් ඒකමයි. මම හිතන හැටියට මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමාත් එතැනින් තමයි එතුමාගේ දේශපාලනය ආරම්භ කළේ. නමුත් එතුමාට ඒ අතීතය මතකද කියන්න මම දන්නේ නැහැ. එදා එහෙම පටන් ගත්ත පනතේ මොනවාටද අපි විරුද්ධ වුණේ ? එදා ඉඳලාම අපි විරුද්ධ වුණු පළමුවෙනි කාරණය තමයි, අත්අඩංගුවට අරගෙන අධිකරණයට ඉදිරිපත් නොකර පැය 72ක් තබා ගැනීම. මෙතැනදී තමයි සියලු වද හිංසා කරලා ගන්න ඕනෑ කට උත්තර

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ගන්නේ. ඒ අනුව පිස්තෝල කටට තියලා ගත්ත කට උත්තර තිබෙනවා. දැන් හිජාස් හිස්බුල්ලාට විරුද්ධව කට උත්තර ගත්තේ දරුවන්ගේ කටට තුවක්කුව ඔබලා; පිස්තෝල ඔබලා ඒ කට උත්තර ගත්තේ. ඒවා තමයි උසාවියට ඉදිරිපත් කළේ. දෙවැනි එක, රඳවා තබා ගැනීම මාස 18යි කියන එක. දැන් ඒ මාස 18 අවුරුද්දක් -මාස 12ක්- කරනවා ලු. නමුත් ඒ මනුස්සයා අවුරුද්දක් ඇතුළේ ඉන්න එපා යැ. අංක ගණිතයෙන් මාස 18 මාස 12 කරලා සාධනීයයි කිව්වාට, කොහොමද මාස 12 සාධනීය වෙන්නේ? මේවාට විරුද්ධ වුණ දේශපාලනඥයන්, මේවාට විරුද්ධ වුණු දේශපාලන පක්ෂ අද ලජ්ජා නැතුව මේ වෙනුවෙන් කටයුතු කරනවා. ජේ.ආර්. ජයවර්ධන හොඳ නැහැ ලු. හැබැයි, එතුමාගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හොඳයි, හැමෝටම. ජේ.ආර්. ජයවර්ධන හොඳ නැහැ ලු. හැබැයි, එතුමා ගෙනාපු විධායක ජනාධිපති ක්‍රමය හොඳයි, හැමෝටම පාවිච්චි කරන්න. ජේ.ආර්. ජයවර්ධන හොඳ නැහැ ලු. හැබැයි, පාවිච්චි කරන්න, එතුමාගේ මැතිවරණ ක්‍රමයත් හොඳයි. ජේ.ආර්. ජයවර්ධන හොඳ නැහැ ලු. හැබැයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතත් හොඳයි ලු. මේ ඔක්කෝම හොඳයි. හැබැයි, ජේ.ආර්. නරකයි. ඒක තේ මේ තිබෙන තත්ත්වය.

අනික් කාරණය තමයි රඳවා තබා ගැනීමෙන් පසු ඇප තීන්දු කිරීම. ඒ ඇපය ඉල්ලන්නේත්, ඒකත් තීන්දු කරන්නේ පොලිසියෙන්. අධිකරණ බලය පොලිසියට පවරා ගෙන තිබෙනවා. එතකොට පොලිසියට දෙන කට උත්තර අධිකරණයේදී පිළිගැනීමට ලක් වෙනවා.

ඊළඟට, ත්‍රස්තවාදය නිර්වචනය කිරීම. මම හිතන හැටියට ජේ.ආර්. ජයවර්ධන මහත්තයා ගෙනාපු පනතට වඩා භයානක තත්ත්වයක් තිබෙනවා, මේ නිර්වචනයේ.

මේකේ නිර්වචනය ඊට වඩා පුළුල් කරලා තිබෙනවා. මේකේ නිර්වචනය කිරීම පුළුල් පරාසයකට ගෙනැල්ලා තිබෙනවා. මේකේ වැඩිපුරම තිබෙන්නේ ත්‍රස්තවාදයට වඩා විරුද්ධවාදය මර්දනය කිරීම. අනෙක් එක තමයි, කිසිදු search warrant එකක් හෝ මොකුත් නැතිව අත්අඩංගුවට ගැනීමට පුළුවන්කම. මේ පනතට විරුද්ධව එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ මැදිහත්වීමත් මම පෙන්වා දෙන්නම්.

වීරවංශ එදිරිව නීතිපති (2000) 1 SriLR 387 නඩුවේදී විනිසුරු මාර්ක් ප්‍රනාන්දු විසින් නිරීක්ෂණය කර ලබා දුන් මතය මෙයයි:

"ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත මෙම අධිකරණයට යොමු කළ විට, එහි 15 (7) වැනි ව්‍යවස්ථාවෙන් අවසර දී ඇති පරිදි (ජාතික ආරක්ෂාව යනාදී අවශ්‍යතා සඳහා), ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1), 13 (1) සහ 13 (2) ව්‍යවස්ථාවන්ට සාධාරණ සීමා කිරීම් එම විධිවිධානවලින් සිදු වේද යන්න තීරණය කිරීමට අධිකරණයට සිදු නොවීය. මක්නිසාද යත්, පනත් කෙටුම්පත තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත කිරීමට තීරණය කර ඇති බව අධිකරණයට දැනුම් දී ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුනෙන් දෙකක බහුතරයකින් බලාත්මක වූ අතර, ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 ව්‍යවස්ථාව අනුව, ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සමඟ නොගැලපීම් රාශියක් තිබියදීත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නීතිය බවට පත් විය."

මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා තමයි එහෙම කියන්නේ. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයකින් පනත් කෙටුම්පත පාස් කරනවා කියලා දුන්නු සහතිකය උඩ තමයි ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුවුණේ මේක අනුමත කරන්න. එවැනි භයානක පනතක් මේ පනත.

දෙවැනි එක තමයි, මරිදාස් එදිරිව රජය (1995) 1 SriLR 96 නඩුවේ මෙසේ සඳහන් වෙනවා.

"........එබැවින් ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 16 වැනි වගන්තිය යටතේ සටහන් කර ඇති පාපොච්චාරණයක ස්වේච්ඡාභාවය සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දෙන ලෙස අධිකරණයක් ඉල්ලා සිටින විට අපරාධ නඩු විභාගයේදී චූදිත පුද්ගලයා සම්බන්ධයෙන් පරම සාධාරණය සහතික කිරීම සඳහා සාක්ෂි පරීක්ෂා කර ඇගයීමට ලක් කිරීම අතිශයින් වැදගත් වේ."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මීට අවුරුදු තුනකට පෙර, එනම් 2019 මාර්තු 12වැනි දා "ලංකාදීප" පුවත් පත සමඟ කළ සාකච්ඡාවක් මම ඉදිරිපත් කරන්නම්. එහි මාතෘකාව ලෙස සඳහන් වන්නේ, "යෝජිත ත්‍රස්ත පනත භයානකයි." යන්නයි. එතුමා 2019 මාර්තු 12වැනි දා "ලංකාදීප" පුවත් පතට කියා තිබෙන්නේ මොකක්ද?

එතුමා මෙහෙම කියනවා:

"නම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වුවත් මෙහි අන්තර්ගතය විමසන විට පෙනෙන්නේ ත්‍රස්තවාදය වැළැක්වීම නොව ඊට හාත්පසින්ම වෙනස් ක්‍රියාවලියකි. මේවා පිළිබඳ ජනතාවට අවබෝධයක් නොමැති වීම ද බරපතළ කරුණකි. පක්ෂ භේදයෙන් තොරව මෙවන් පනත්වලට විරුද්ධ වීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද වගකීමකි."

එසේම එතුමා එම ලිපියේ තවත් තැනක මෙහෙම කියනවා:

"එහෙත් මෙම පනත් කෙටුම්පත සම්මත වුවොත් එය ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ පසුගිය දශකයේ ඉදිරිපත් වූ භයානකම පනත වශයෙන් හඳුන්වා දෙන්නට පුළුවන."

එතුමා එම සාකච්ඡාවේදී තවදුරටත් මෙහෙම කියනවා:

"සිවිල් සමාජය මර්දනය කිරීමට මේ හරහා යොමුව තිබේ. තම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඉදිරිපත් වන සිවිල් සමාජයේ සංවිධාන මර්දනය කිරීමක් මෙමඟින් සිදුවනු ඇත."

මෙහෙම මර්දනය කළේ එදා ද, අද ද? සිවිල් සංවිධාන ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන් කී දෙනෙක් අද CID එකට දක්කාගෙන යනවා ද? මේවාට ඉතා හොඳ උදාහරණ තමයි, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා කියපු කාරණා. මේ විධිවිධාන අලුත් පනත් කෙටුම්පතේ අඩංගු නැද්ද? තිබෙනවා. එතුමාම ලජ්ජා නැතිව එ්වා ගෙනැල්ලා තිබෙනවා.

හිජාස් හිස්බුල්ලාගේ නඩුවේදී අන්තිමට ඔහු නිදහස් කරනවා. අත්අඩංගුවට අරගත්ත අසාද් සාලි අන්තිමට නිදොස් කොට නිදහස් කරනවා. ගරු ඇමතිතුමා 2019දී "ලංකාදීප" පුවත් පතට කියනවා, ප්‍රතිත්‍රස්ත පනත හොඳ නැහැ කියලා. දැන් මීට ඉස්සෙල්ලා කථා කරපු නීතිඥ සුසිල් ප්‍රේමජයන්ත හිටපු රාජ්‍ය ඇමතිතුමා කියනවා, යෝජනා කරනවා ජාත්‍යන්තරය පිළිගන්නාවූ පනත් කෙටුම්පතක් ගේන්න කියලා. දැක්කා ද ඒ කථා දෙකේ තිබෙන වෙනස? ඒ නිසා නීතිඥ ජී.එල්. පීරිස් මැතිතුමා ද හරි, නැත්නම් නීතිඥ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ද හරි කියලා මම අහනවා. මොකද, ජී.එල්. පීරිස් ඇමතිතුමා උසාවියේ වැඩ නොකළාට, එතුමා උසාවියේ වැඩ කරලායි ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මේ ගැනත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අඩු ගණනේ අපේ Law Commission Report එකේ තිබෙන මෙන්න මේ කාරණා ටික

සංශෝධනය කරලා මේ පනත් කෙටුම්පත ගේන්න. තමුන්නාන්සේලාගේම නීතිඥවරුන් වන ජනාධිපති නීතිඥ රොමේෂ් සිල්වා, ජනාධිපති නීතිඥ මනෝහර ද සිල්වා, ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන කියන මේ තුන්දෙනා තමයි තමුන්නාන්සේලාගේ ව්‍යවස්ථාව හදන්නේ. මේ තුන්දෙනා තමයි පසුගිය කාලයේ තමුන්නාන්සේලා වෙනුවෙන් නඩු කථා කළේ. ඒ ගොල්ලන්ම කියනවා නම් මේ පනත මෙන්න මේ විධියට සංශෝධනය කරන්න කියලා, ඇයි ඒක පිළිගන්න බැරි තමුන්නාන්සේලාට?

ඒ විතරක් නොවෙයි, මානව හිමිකම් කොමිෂන් සභාව පවා මේ ත්‍රස්ත විරෝධී පනත අහෝසි කරන්න කියලා ඉල්ලීමක් කරලා තිබෙනවා.

එම නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව අපි මීට වඩා සාකච්ඡා කළ යුතුයි. බොරුවට EU එකට පෙන්වන්න, UN එකට පෙන්වන්න, ඒවායේ බලපෑමට හෝ GSP සහනය බේර ගන්න නොවෙයි, අපි ක්‍රියා කළ යුත්තේ. මේ රටේ මිනිසුන් ගැන හිතලායි අපි ක්‍රියා කළ යුත්තේ. මේ රටේ මිනිසුන්ගේ නිදහස හා අයිතිය ගැන සිතා බලලා නිවැරදි පනතක් ඉදිරියේදී ගෙනෙන්න. ගරු ඇමතිතුමනි, නීතිය පිළිබඳ මහාචාර්යවරයෙක් වන ඔබතුමාට ඒ සඳහා සියලු සුදුසුකම් තිබෙනවා. ඔබතුමා අමාත්‍ය ධුරය දරන මේ කාලයේ මෙම කටයුත්ත අවසන් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.48]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - கிராமிய வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை மற்றும் கட்டிடப்பொருள் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Rural Housing and Construction and Building Material Industries)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා අද ගරු අමාත්‍යතුමා විසින් සංශෝධන ගෙනැවිත් තිබෙනවා. වර්තමාන රජය උතුර හා නැඟෙනහිර ප්‍රදේශවල වැඩ කටයුතු ක්‍රියාත්මක කරන ආකාරය සහ එහි කටයුතු තරමක් භාරව කටයුතු කරන රාජ්‍ය ඇමතිවරයෙක් විධියට නැවත පදිංචි කිරීමේ කටයුතුවල සත්‍ය, අසත්‍යතාව මේ අවස්ථාවේදීම ප්‍රකාශ කිරීම මැනවයි කියලා හිතපු නිසා මේ විවාදයේදී ඒ පිළිබඳ අදහස් කීපයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊට කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සහමුලින්ම අහෝසි කළ යුතුයි කියන මතය වෙනුවෙන් දැඩි ලෙස පෙනී සිටින්නේ ඇයි කියලා අපි සොයා බලන්න ඕනෑ; ඒ තුළ ඉන්නේ කවුද කියලා අපි බලන්න ඕනෑ. ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවකින් රටක ආරක්ෂාව නැති කරන්න පුළුවන්. ත්‍රස්තවාදී කණ්ඩායම්වල, එහෙම නැත්නම් අන්තවාදී කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය උච්චතම අවස්ථාවට ඇවිල්ලා ත්‍රස්තවාදී ක්‍රියාවක් සිදු වුණාම ඒකේ වාසි ගන්නේ කවුද, නොගන්නේ කවුද කියලා අවුරුද්දක් හෝ දෙකක් ගියාට පස්සේ හොයා ගන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවාම ඒ කථාවලින් අපට ඒවා පෙනෙනවා. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයක් සිදු වුණා. ඒ බෝම්බ ප්‍රහාරය සිදු වෙන්න මාස ගණනාවකට උඩදී එවකට හිටපු ආණ්ඩුවේ ඇමතිවරු දෙපැත්තට බෙදිලා රණ්ඩු වුණා. ඒ මොකද? "යම් යම් ජන කොටස්වල ඡන්ද බලය අපට නැතිව යයි. ඡන්ද බලය නැතිව ගිහිල්ලා අපට මේ පාලනය නැතිව යයි. පාලනය නැතිව ගියොත් අපට අපේ වැඩක් කර ගන්න බැරි වෙයි" කියලා. ඒ සඳහා යොදා ගත්තේ කාවද? අහිංසක සිවිල් ජනතාව. හැබැයි, දැන් පෙන්වන්නේ මොකක්ද? "ත්‍රස්තවාදී පනතක් ගේනවා. සිවිල් ජනතාව අල්ලනවා. කුඩු කරනවා -කොටු කරනවා-, මර්දනය කරනවා" කියන එක තමයි දැන් පෙන්වන්නේ. නමුත්, ජනතාවට යම්කිසි අස්වැසිල්ලක් ලබා දෙන්න, පැවති නීතිරීති යම්තාක් දුරට නම්‍යශීලීව හදලා, අද මේ පනත් කෙටුම්පත සද්භාවයෙන් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. මේ සංශෝධනවලින් යම්කිසි අස්වැසිල්ලක් ලැබෙන බව TNA එක නියෝජනය කරන අපේ මන්ත්‍රීවරුත්, අනෙක් අයත් හෘදය සාක්ෂියට එකඟව පිළිගන්නවා ඇති.

මෙය ජනතාව පාවිච්චි කිරීමක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාත් උතුර ප්‍රදේශය පාලනය කරන යම් යම් වැඩසටහන්වල ඉන්නවා. ඔබතුමාත් දමිළ ජනතාව නියෝජනය කරනවා. ඒ වාගේම සමස්ත ශ්‍රී ලාංකික ජනතාව නියෝජනය කරනවා. ඔබතුමාගේ හෘදය සාක්ෂියත් දන්නවා, මේ තුළින් යම් යම් සාධනීය සංශෝධන ගෙනැවිත් තිබෙන බව. ඒවා ප්‍රමාණවත් නොවන්න පුළුවන්. මෙවැනි පනතක් ඇත්තටම අවශ්‍ය නොවන්න, ඒ තරමට නිදහස තිබෙන රටක් බවට ලංකාව පත් වෙන්න පුළුවන්. හැබැයි මේ වෙද්දී ලංකාවට තිබෙන තර්ජන, වෙනත් රටවලින් තිබෙන ඇල්ම බැල්ම පාවිච්චි කරලා ඒ රටවලට ඕනෑ ආකාරයට කටයුතු සිදු කර ගැනීමට මේ රට පාවා දෙන්න යම්කිසි කණ්ඩායමකට අවශ්‍යයි නම්, ඒගොල්ලන් උත්සාහ කරනවා අන්තවාදය උත්සන්න කරන්න. ඒ ගොල්ලෝ එදා එය කළා. එදා ආණ්ඩුවේ ඇමතිවරු දෙපැත්තට බෙදිලා ගහ ගත්තා. එදා ආණ්ඩුවේ හිටපු අධිකරණ ඇමතිවරයාට චෝදනා කළා. හැබැයි, එදා අධිකරණ ඇමතිවරයාට බලපෑම් කළේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අහෝසි කරන්න කියලා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා එදා පාර්ලිමේන්තුවේ නොහිටියාට එදා මෙතුමන්ලා ඔබතුමන්ලාගේ කර මතින් ඇවිල්ලා 2015 දී ආණ්ඩු බලය ගත්තා. බලය ගත්තාට, ඔබතුමන්ලාගේ ජනතාව වෙනුවෙන් මෙම පනතේ එක ඉස්පිල්ලකින් හෝ ඇලපිල්ලකින්වත් සංශෝධනය කරන්න එදා මේ අය අරගළ කළේ නැහැ. එහෙම නොකර පනත පෙන්ව පෙන්වා ඔබතුමන්ලාගේ අහිංසක දමිළ ජනතාව මෙල්ල කළා; අහිංසක දමිළ ජනතාව රැවැට්ටුවා. රවටමින් කටයුතු කළා. එදා යහ පාලන රජය කළේ, රාජපක්ෂවරුන්ගෙන් පළිගන්න එක. රාජපක්ෂවරුන්ගෙන් පළිගන්න නීති හැදුවා. ඒ වෙනුවෙන් අලුත් උසාවි හැදුවා; පොලිසි හැදුවා. හැබැයි, දමිළ ජනතාව තබපු විශ්වාසය අල්පෙනෙත්තක තරමින්වත් ඔවුන් ඉටු කළේ නැහැ.

අද අපි මේ පනතට සංශෝධන ගෙනැවිත් තිබෙනවා. ඒ අනුව, රැඳවියෙක් රඳවා තබා ගැනීමේ කාලය අඩු කර තිබෙනවා. ඉදිරියේදී මෙම පනතට අපි තව සංශෝධන ගේනවා. ඒ වාගේම, නව පනත්වලින් ජනතාවට තව තවත් සහන ලබා දෙනවා. අපි දමිළ ජනතාව තුළ විශ්වාසය ඇති කරවනවා.

අද තිබෙන ප්‍රශ්නය දමිළ ජනතාව ද, මුස්ලිම් ජනතාව ද කියන එක නොවෙයි. එදා තිබුණු රාජ්‍ය ත්‍රස්තවාදය අපි ඇස් දෙකෙන් දැක්කා නේ. එදා සමහර පුද්ගලයන්ගේ වෙස් මාරු කෙරෙව්වා.

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

මේකේ අමාරුව තිබෙන්නේ එල්ටීටීඊ එකට එදා උදව් කරපු, අදත් එල්ටීටීඊ එක හොඳයි කියන අයට. අපි දන්නවා, 88-89 කාලයේ කල්ලි හදාගෙන ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකතු වෙලා කැරලි ගහපු අය, රටේ ධනස්කන්ධය විනාශ කරපු අය මේ පනතේ සඳහන් සමහර වගන්ති අහෝසි වනවාට අදත් විරුද්ධ බව. දමිළ ජනතාව විතරක් නොවෙයි, 'ප්‍රා' කල්ලි හදාගෙන, තුවක්කු උස්සාගෙන මේ රටට මහා විනාශයක් කරපු අයත් මේකට විරුද්ධයි. ඒක ගැන අපි ආයෙත් අමුතුවෙන් තර්ක කරන්න ඕනෑ නැහැ. මොකද, ඒ අයට මේ සංශෝධන ඉදිරිපත් නොවන තරමට හොඳයි. අන්තිම වකවානුවේදී රැවුල් දාලා වෙස් මාරු කරලා වෙන වෙන පුද්ගලයන් ඉදිරිපත් කරලා බොරු -බෙගල්- කියපු අය මේවාට විරුද්ධයි. ත්‍රස්තවාදය ගොඩ නඟන්න යම්කිසි කෙනෙක් මූලාරම්භය ගන්නවා නම්, ජනතාවට අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරලා වංචා කරලා ජනතාව නොමඟ යවා ඒගොල්ලන් උත්සාහ කරන්නේ අන්තවාදීව ආණ්ඩුවට එරෙහිව කැරලි ගහලා, එහෙම නැත්නම් අන්තවාදීව යම් යම් තරුණ ජන කොටස් බෙදාබින්න කරලා 'අපි තමයි ඔයගොල්ලන් වෙනුවෙන් ඉන්නේ' කියලා ඉස්සරහට එන්නයි. ඒකේ උත්සන්නම අවස්ථාව තමයි, අපි 2019 අප්‍රේල් 21වන දා දැක්කේ. එදා මුස්ලිම් තරුණයාට හරි දේ පෙන්වන්න, ඒ මුස්ලිම් නායකයෝ හිටියේ නැහැ. එදා මුස්ලිම් තරුණයා නොමඟ යන වෙලාවේ හරි මඟ කියා දීලා ඒ තරුණයාට ඒ තැනට යන්න එපා කියන්න කවුරුවත් හිටියේ නැහැ. මේ ගරු සභාවේ හිටියා, කබීර් හෂීම් මන්ත්‍රීවරයා. එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමාගේ හෘදය සාක්ෂිය මේ ගැන කියයි. එතුමාගේ හිටපු ලේකම්වරයකු අබ්බගාතවෙලා අදටත් ලෙඩ ඇඳේ ඉන්නේ. මොකක්ද, එතුමා කළේ? මේ මුස්ලිම් සහෝදරයන්, දමිළ සහෝදරයන් හැමෝම අන්තවාදීන් නොවෙයි. සිංහල මිනිස්සු අන්තවාදීන් නොවෙයි. සිංහල තරුණයෝ අන්තවාදීන් නොවෙයි. ඔවුන් ත්‍රස්තවාදීනුත් නොවෙයි. හැබැයි, යම්කිසි පොඩි තැනකින් තමයි අන්තවාදය පටන් ගෙන ත්‍රස්තවාදය දක්වා වර්ධනය වන්නේ. අන්න ඒ වර්ධනය වූ ත්‍රස්තවාදයේ බිල්ලක් බවට තමයි ඒකට විරුද්ධ අර අහිංසක සියලු ජන කොටස් යටත් වෙන්නේ, එහෙම නැත්නම් ඒකෙන් හෙම්බත් වෙන්නේ; ඒකෙන් දුක් විඳින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තමුන්නාන්සේලා නියෝජනය කරන උතුර, නැඟෙනහිර පළාත්වලට අවශ්‍ය සංවර්ධනය ලැබී තිබෙනවාද, නැද්ද? තමුන්නාන්සේලාට යම්කිසි ගැටලුවක් තිබෙනවා නම්, ඒ ගැටලුව දකුණේත් තිබෙනවා. ඒක උතුරට විතරක් තිබෙන දෙයක් නොවෙයි. එදා උතුරට කෝච්චිය ගියේ නැහැ. නමුත්, දකුණේ කෝච්චි වැඩ කළා. හැබැයි, මේ යුද්ධය අවසන් කරලා ඒ සියලු සංවර්ධනය උතුරට ගෙනිච්චා. අද වෙද්දි අපි දකුණේ හදන ගෙවල් ප්‍රමාණයම උතුරේත් හදනවා. දකුණේ හදන පාරවල් ප්‍රමාණයම උතුරේත් හදනවා. අපි ඒ සියලු සංවර්ධන කටයුතු උතුරේත් කරනවා. අපි මේ කටයුතු බෙදා නැහැ. මේක උතුර, මේක නැඟෙනහිර, ඒ නිසා අපි අඩුවෙන් දෙන්න ඕනෑය කියලා නැහැ. හැබැයි, එදා හිටපු පාලකයන් උතුරේ ජනතාව යම් යම් දේවල්වලට පාවිච්චි කළා. 2015-2019 කාලයේ හිටපු පාලකයෝ -බලය ගත් අය- නැඟෙනහිර මුස්ලිම් තරුණයෝ පාවිච්චි කළා, ඔවුන්ට බලය ගන්න. එහෙම බලය අරගෙන මුහුදට වීසි කරන පොල් ලෙල්ලක් ගණනට ඒ තරුණයන් නිකම් ම වීසි කරලා දැම්මා; අහක් කරලා දැම්මා. ඒ නිසා ඒ ගොල්ලන් මේ පනත් කෙටුම්පතට හරි අකැමැතියි.

ජාත්‍යන්තර ප්‍රජාව අද මොකක්ද කියන්නේ? මේ සංශෝධන පනත් කෙටුම්පත සකස් කරද්දි මේ ගැන හොයා බලපු රටවල්, ජාත්‍යන්තර සංවිධාන අපි යම්කිසි නම්‍යශීලීත්වයකින් කටයුතු කිරීම ගැන ශ්‍රී ලංකාවට ප්‍රශංසා කර තිබෙනවා; ස්තුතිය පළ කර තිබෙනවා. මේ හැරවුම් ලක්ෂ්‍යය ආරම්භ කිරීම ගැන ඒගොල්ලන් විශ්වාසය තබා තිබෙනවා. සමහරු හිතනවා, "අපට පුළුවන්, අපේ රටේ ආරක්ෂාව තහවුරු කර ගත්තාම මේවා සියයට සියයක් අහෝසි කරන්න. එතකොට අපට කිසි ගැටලුවක් නැහැ. මේ වාගේ දේවල් අපට තවත් අවශ්‍ය නැහැ" කියලා. හැබැයි, එහෙම තැනක නොවෙයි අද අපේ රට ඉන්නේ. එම නිසා, "මේ පනත් කෙටුම්පත නොවෙයි, සියයට සියයක්ම මේක අහෝසි වෙන්න ඕනෑ" කියලා කවුරුන් හෝ කියන්න උත්සාහ කරනවා නම්, එහෙම ආරක්ෂාවක් ඇතිවද 2020 දී අපට මේ රට හම්බ වුණේ? එදා මුස්ලිම් තරුණයා දිහා සිංහල තරුණයා බැලුවේ සැකයකින්. සිංහල තරුණයා දිහා දමිළ තරුණයා බැලුවේ සැකයකින්. ඒ සැකය වැඩි වෙලා යුද්ධයක් බවට, එහෙම නැත්නම් බෝම්බ පත්තුවන තත්ත්වයට පත් වුණාට පසු තමයි වර්තමාන රජය බලයට ආවේ. හැබැයි, අපි තවම එක කඳුළු ගෑස් ප්‍රහාරයක්වත් එල්ල කරලා නැහැ. නමුත්, එදා පැවැති රාජ්‍ය ත්‍රස්තවාදය එලෙස කටයුතු කළා. අපි එකම ජල බවුසරයක්වත් පාවිච්චි කළේ නැහැ.

දමිළ අම්මලාගේ දරුවෝ 80කට වැඩි ගණනක් නිදහස් කරලා උතුරට යවන්න අපිට පුළුවන් වුණා. අපි ඒ ගැන සතුටුවනවා. දැන් කයිවාරු ගහන මේ අය එදා ඒ සහනය දුන්නාද? එදා ඒ අම්මලාට දරුවන් ගෙනිහින් දුන්නාද? එදා ඒක කළේ නැහැ. ඒ දරුවන් ගෙනිහිල්ලා දෙන්නම් කිය කියා ඒගොල්ලන්ගේ දේශපාලන වටපිටාව හදා ගත්තා. ඒ අම්මලා දකින්න ඇති, එදා ඒ අම්මලාගේ දරුවන් හිරබත් කද්දි මේ තාත්තලාගේ, එහෙම නැත්නම් ඔය කයිවාරු ගහන ඇමතිවරුන්ගේ දරුවෝ අරලියගහ මන්දිරය සරසාගෙන මඟුල් කාපු හැටි.

දමිළ තරුණයාට පෙන්වූවා, නිදහස දෙන්නයි හදන්නේ කියලා. හැබැයි, කෝටි-ප්‍රකෝටි ගණන් වියදම් කරලා, අරලියගහ මන්දිරය පාවිච්චි කරලා, එදා ඒ ඇමතිවරුන්ගේ දරුවෝ මඟුල් කෑවා. එහෙම තමයි 2015-2019 කාලයේ කටයුතු කළේ. අද ඇවිල්ලා පූස් පැටව් වාගේ කියනවා, "මේක නොවෙයි, සියයට සියය අහෝසි විය යුතුයි" කියලා. හැබැයි, අපි එතුමන්ලාට කියනවා, හොයා බලන්න, ආපස්සට හැරී බලන්න කියලා. අද මේ රටේ ජනතාවට පෙන්වන්න තිබෙන්නේ, අනාගතය සහ ඉතිහාසයයි. වර්තමානයේ දේවල් ගැන විපක්ෂය ජනතාව කුලප්පු කරද්දී, ඉතිහාසය දෙසට හැරිලා බලන්න ඒ හැමෝම කටයුතු කළ ආකාරය කොහොමද කියලා. එදා තිබුණු අවාසනාවන්ත ඉරණමට තමයි ඒ ගොල්ලන් අනාගතයේදීත් මේ රට ගෙන යන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ යම්කිසි සාර්ථක හැරවුමක් තිබෙන බව මා පැහැදිලිවම කියනවා. ඒ හැරවුම උතුරට ගොඩක් වටිනවා; උතුරේ ජනතාවට වටිනවා; දමිළ සහෝදරයන්ට වටිනවා. මොකද, මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතෙන් ජාති, පක්ෂ, පාට, කුල භේද නැතුව හැමෝටම ඒ වරද අනුව දඬුවම් කරනවාද, රඳවා තබන පුද්ගලයා පරීක්ෂා කර බලන්න පුළුවන්ද, ඔහු ඉන්න තැන හොයා ගන්න පුළුවන්ද, ඔහු වෙනුවෙන් නීතිඥයෙක් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියන කාරණා සියලු දෙනාටම මතු වී තිබෙනවා. ඒ නිසා ඒ දේවල් නිවැරදි කරගෙන, ජාත්‍යන්තරය දිනාගෙන, අපේ රටේ තිබෙන අර්බුදය නිමා කර ගැනීම සඳහා මිස, පටු දේශපාලන වාසි ලැබීමේ අපේක්ෂාවෙන්, කාලකණ්ණි දේශපාලන සිතුවිලිවලින් තමන්ගේ අරමුණු කරා යන්න හදන නායකයන්ට ඕනෑ දෙයක් නොවෙයි මේ කරලා තිබෙන්නේ. අපේ විදේශ කටයුතු ඇමතිතුමාටත්, අධිකරණ ඇමතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා, මෙම පනත සංශෝධනය කිරීමට මූලිකත්වය ගැනීම ගැන.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.00]

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රට ලේ බිඳක්වත් නොසෙල්වා නිදහස ලබා ගත් රටක් බව අප සියලු දෙනාම දන්න කාරණයක්; පාසල් ගිය කාලයේ ඉඳලාම දැන සිටි කාරණයක්. නමුත් ගෙවුණු දශක හතක කාලය දෙස බැලුවාම, සෑම ජන කණ්ඩායමකටම අයිති තරුණ තරුණියන්, එසේ නොවන පිරිස් කැරලි කෝලාහලවලට, ත්‍රස්තවාදී ක්‍රියාවලට, සමාජ පිපිරීම්වලට ගමන් කළ, අතිවිශාල මනුෂ්‍ය ඝාතන සිදු වුණු, අතුරුදහන්වීම් සිදු වුණු, අතිවිශාල ජනතාවක් මෙරටින් පලා ගොස් පිට රට ජීවත් වන, තමන්ගේම මව් බිමේ අනාථයන් බවට පත් වුණු රටක් හැටියටයි අපට මේ රට දකින්න ලැබෙන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ අප එක දෙයක් මතක තබා ගත යුතුයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත 1979දී ගෙනාවේ, එවකට මහා බ්‍රිතාන්‍යයේ තිබුණු අයි.ආර්.ඒ. ගරිල්ලා ව්‍යාපාරය මර්දනය කිරීමට ගෙනාපු ඒ නීති පද්ධතිය එහෙම පිටින්ම කොපි කරලායි. මේ මමත් ඒ පනතෙන් බැට කාපු කෙනෙක්. අපවත් රැඳවුම් නියෝග නැතුව රඳවා තබාගෙන, මේ ආකාරයටම වධ වේදනාවලට ලක් කළා. අපේ පරම්පරාව අතිවිශාල වශයෙන් ලේ, කඳුළුවලින් වන්දි ගෙවපු පිරිසක්. ඒ නිසා එවැනි තත්ත්වයක් නැවත මේ රට තුළ ඇති නොවෙන්න වග බලා ගැනීම අප සියලුදෙනාගේම වගකීමක් බව මා පළමුව ප්‍රකාශ කරන්න ඕනෑ.

දැන් මේ පවතින පනත ගැන විවිධ විවේචන තිබෙනවා. පළමුවෙන්ම මේ පනත වර්තමානයට, නවීන තාක්ෂණයට, නවීන ආර්ථික තත්ත්වයට, නවීන ගෝලීය තත්ත්වයන්ට ගැළපෙන්නේ නැති, අතීතයට අයිති පනතක් බව අප කවුරුත් පිළිගත යුතුයි. ඒ වාගේම මේ පනත ක්‍රියාත්මක කිරීමේදී වූදිතයන්ගේ මානව හිමිකම් පිළිබඳව හැඟීමකින් තොරව, ඒවා කඩවන ආකාරයට ක්‍රියාත්මක වෙලා තිබෙන බවත් අප පිළිගත යුතුයි. ඒ වාගේම මේ පනත ක්‍රියාත්මක කිරීමේදී නීතිය පිළිගත් සාධාරණත්වයේ මූලධර්ම උල්ලංඝනය වන ආකාරයට ක්‍රියාත්මක කර තිබෙන බවත් අපේ අතීතය දිහා බැලුවාම අප පිළිගත යුතුයි. ඒ වාගේම මේ පනත ඉතාම බරපතළ විධියට, දේශපාලන අවියක් හැටියට පාවිච්චි කරලා, දේශපාලන විරුද්ධවාදීන් මර්දනය කරන්න, රඳවා තබා ගැනීමේ නියෝග අනුව ඔවුන් රඳවා තබාගෙන කටයුතු කිරීමට පවත්වාගෙන ගිය පනතක් බවත් අපට දැන් පැහැදිලියි. ඒක අතීත කාලයේදීත්, මෑත අතීතයේදීත් අපි දැක්කා. ඒ වාගේම මේ පනතේ ස්වරූපය මත මේ රටේ නීති තනන මේ පාර්ලිමේන්තුවේ උපදේශනයට, නියාමනයට මේ පනත යටත් නොවීමත් බරපතළ ගැටලුවක්. ඒ නිසා මේ පනත වෙනුවට වෙනත් පනතක් ගෙන ඒමේ අවශ්‍යතාව එවකට යහ පාලන රජයත් පිළිගෙන, ඒ සම්බන්ධයෙන් වුණු පනත් කෙටුම්පත් සකස් කළා. ඒ වාගේම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කොමිසම යනාදී සියලු ආයතන එකතු වෙලා, නව පනතක අවශ්‍යතාව මතු කළා. ඒ නිසා නව පනතක් මේ රටට අවශ්‍යයි. ඒ අවශ්‍යතාව ඉටු කිරීමේදී අප කරුණු කිහිපයක් මතක තබා ගන්න ඕනෑ. නීති රීති ගැන පමණක් සලකා කථා කරන්න අපට බැහැ. ලෝකයේ අද පවතින නව ආර්ථික තත්ත්වය, අපේ විදේශ උපාය මාර්ග, විදේශ ප්‍රතිපත්තිය, ඒ වාගේම අපේ ආරක්ෂක උපාය මාර්ග මොනවාද යන්න මත අපේ නීති රීති පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එල්ටීටීඊ ත්‍රස්තවාදයට මුහුණ දීලා, එය පරාජය කළා. අපි අති දැවැන්ත යුද හමුදාවක් බිහි කළා. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසුව ඒ රණ විරුවන් පිළිබඳව අපි ආඩම්බර වුණා. නමුත් වර්තමාන තත්ත්වය අනුව මෙතරම් විශාල ආරක්ෂක අංශයක් රටට අවශ්‍යද කියන ප්‍රශ්නය දැන් අප ඉදිරියේ තිබෙනවා.

අපේ රටේ සියලු ආරක්ෂක අංශ සාමාජිකයන් සංඛ්‍යාව ලක්ෂ තුනකට ආසන්නයි. මහා බ්‍රිතාන්‍යයේ දෙලක්ෂ හැත්තෑපන්දාහයි; ප්‍රංශයේ දෙලක්ෂ පනස්දාහයි. ඒ නිසා අපි කල්පනා කර බැලිය යුතුයි අපි තවදුරටත් මේ දැවැන්ත ආරක්ෂක ව්‍යූහය පවත්වාගෙන යනවා ද කියන එක ගැන. මොකද, අද තාක්ෂණික පැත්තෙන් ගත් කල, අතිශය වෙනස් තත්ත්වයනට ලෝකය පරිවර්තනය වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ ඔබතුමාට නියමිත අවසාන විනාඩි දෙක.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බිම් බෝම්බ, පැති බෝම්බ වෙනුවට ඩ්‍රෝන යානා මඟින්, අන්තර්ජාලයේ සිදු කරන අපරාධ මඟින්, හැකර් ප්‍රහාර මඟින් තමයි අද ත්‍රස්තවාදය බරපතළ ලෙස ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා අපට අද අවශ්‍යයි, මේ රටේ අනාගත දියුණුව ඇති කරන්න, සුහුරු හමුදාවක්. සුහුරු පොලිස් සේවාවක් අපට අවශ්‍යයි. දේශපාලන නියාමනයෙන් තොර ස්වාධීන පොලිස් සේවාවක් අපට අවශ්‍යයි. ඒ වාගේම, බලගතු නාවික හමුදාවක් අපට අවශ්‍යයි. මොකද, ශ්‍රී ලංකාව වාගේ 23 ගුණයක් විශාල මුහුදු තීරයක් අපට ආරක්ෂා කරන්න තිබෙනවා. එය අපට ආදායම් උපදවන තැනක් බවට පත් වෙලා තිබෙනවා. එය ජවාරම්කාරයන් තුන්හතරදෙනෙකුට ලබා දෙන්න පුළුවන් දෙයක් නොවෙයි. එය ශ්‍රී ලංකා නාවික හමුදාවේ බලය යටතේ තිබෙන්න ඕනෑ දෙයක්. ඒ වාගේම අපට අවශ්‍යයි, අපේ සම්පත් සහ අනෙකුත් දේවල් රැකීම සඳහා වන බලගතු ගුවන් සේවයක්. විදේශ රටකට, විදේශ රටවල යානාවලට අපේ රටේ සම්පත් ගවේෂණය කිරීමේ අයිතිය දෙනවාට වඩා අපේ ගුවන් හමුදාව මඟින් ඒ කටයුතු කිරීමේ ක්‍රියාවලියක් අපට අවශ්‍යයි. ඒ නිසා, නව ත්‍රස්ත මර්දන පනතක් ගෙනෙනවා නම් මේ තාක්ෂණික කාරණා, මේ නව ආර්ථික ප්‍රවණතා, අපගේ ආර්ථික උපාය මාර්ග, අපගේ විදේශ ප්‍රතිපත්තිය, අපගේ නව ආරක්ෂක ප්‍රතිපත්තිය කියන කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ඒ කටයුත්ත කරනවා මිස, විදේශ රටවල නියෝග මත පමණක් අප යම් යම් දෑ වෙනස් කරන්න යෑම සුදුසු නැහැ. මේ සම්බන්ධයෙන් යම් කෙටුම්පතක් පසුගිය රජය ඉදිරිපත් කළා. ඒ කෙටුම්පත පදනම් කරගෙන පූර්ණ ක්‍රියාවලියකට යනවා මිස අතැනින් මෙතැනින් පුංචි පුංචි සංශෝධන ගෙන ඒමෙන් ඵලක් නොවන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.06]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

පසුගිය කාල පරිච්ඡේදය පුරාවට ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සම්බන්ධයෙන් නොයෙකුත් පාර්ශ්ව වෙතින් දෝෂාරෝපණ, විවේචන ඉදිරිපත් වනවා අපි දැක්කා. උතුර සහ නැඟෙනහිර නියෝජනය කරන අපේ සහෝදර දමිළ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේදී මේ පනත සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ දැඩි විවේචනයන් එල්ල කරමින් කථා කරපු ස්වරූපයක් තමයි අප පැහැදිලිවම දැක්කේ. හැබැයි, අපි මෙහිදී තේරුම් ගන්න ඕනෑ දෙයක් තිබෙනවා, මේ පනත අපේ දමිළ සහෝදරවරුන් පාලනය කරන්න, ඒ අයට විරුද්ධව ගෙන ආ පනතක් නොවෙයි කියන කාරණය. අපි එය පැහැදිලිවම කියන්න ඕනෑ. එදා යුද්ධය පැවැති කාලය තුළ ඒ පනත උපයෝගී කර ගත්ත බව සැබෑව. ඒ යුද්ධය පැවැති කාලය තුළ ත්‍රස්තවාදීන් මර්දනය කිරීම සඳහා ඒ පනත උපයෝගී කර ගත් බව සැබෑව. ඔබතුමන්ලා කිව්වා, 2009 අවුරුද්දේ යුද්ධය අවසන් වුණා කියලා. නමුත්, යුද්ධය අවසන් කරලා අවුරුදු 10ක් යන්නත් කලින් නැවත වතාවක් එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරය නිසා මේ පනතේ අවශ්‍යතාව අපි දැක්කා.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය හොඳින් ව්‍යාප්ත වුණු ඇමෙරිකා එක්සත් ජනපදය ගෙන බලමු. අයිතිවාසිකම් බෙහෙවින් සීමා කරන, සංකෝචනය කරන Patriot Act වාගේ පනත් එහි බිහි වෙලා තිබෙනවා. එසේ වී තිබියදීත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත අවශ්‍ය නැහැ, එය repeal කළ යුතුයි කියලා අපේ රටේ විපක්ෂය අද කියනවා නම්, ඒක ඉතාම වැරැදියි. මේ රටේ රාජ්‍ය ආරක්ෂාව, මේ රටේ භෞමික අඛණ්ඩතාව, මේ රටේ ස්වෛරීත්වය රැකීම සඳහා වන නීති අණ පනත් අපට තිබෙන්න ඕනෑ.

එක් ජාතියක් මර්දනය කරන්න ඒ පනත උපයෝගී කර ගන්නවා කියලා කවුරුන් හෝ කෙනෙකු විශ්වාස කරනවා නම්, මේ තිබෙන්නේ ඒ සිතිවිල්ලෙන් බැහැර වීමට සුදුසුම කාලය කියලායි මා හිතන්නේ. මම ආයාචනාත්මකව ඉල්ලා සිටිනවා, කරුණාකර තමුන්නාන්සේලා ඒ සිතුවිල්ලෙන් බැහැර වෙන්න කියලා. තමුන්නාන්සේලා කළ යුත්තේ, තමුන්නාන්සේලාගේ උතුර, නැඟෙනහිර ජනතාවට අවශ්‍ය සංවර්ධනය උදා කර ගැනීම සඳහා මේ ආණ්ඩුවට සහයෝගය ලබා දෙන එකයි. හැබැයි, ඔබතුමන්ලා විසින්ම බිහි කරනු ලැබූ 2015-2019 ආණ්ඩුවවත් ඔබතුමන්ලාගේ කියන ඒ ඉල්ලීමට එකඟ වුණේ නැහැ. මම ඒ බව කනගාටුවෙන් වුණත් මතක් කරන්න ඕනෑ. එදා ඒ ආණ්ඩුවේ සිටි අය අද විපක්ෂයේ ඉඳන් මොන විධියේ ප්‍රකාශ කළත් එතුමන්ලාත් දන්නවා, කවදා හෝ ආණ්ඩු බලය ගත්තාම, ඒ අයටත් පාලන බලතල ලැබුණාම මේ පනත තිබෙන්න ඕනෑ, මේ පනත අවශ්‍යයි කියන කාරණය.

ආණ්ඩුව හැටියට අප පැහැදිලිව ප්‍රකාශ කළ යුතුයි, එදා එල්ටීටීඊ සැකකරුවන් විශාල පිරිසක් රඳවා ගෙන සිටියත්, පසුගිය කාලය වන විට එම ප්‍රමාණය ඉතාම සීමිත සංඛ්‍යාවක් බවට පත් වෙලා තිබෙන බව. අපේ පාලන කාලය තුළ එල්ටීටීඊ සැකකරුවන් අසූ ගණනක් නිදහස් කර තිබෙනවා.

ආණ්ඩුවක් හැටියට අපි පැහැදිලිව කියනවා, රැඳවුම් භාරයේ දීර්ඝ කාලයක් ගත කළ සමහර සැකකරුවන්ට විරුද්ධව පැමිණිලි කළ පැමිණිලිකරුවන්, සාක්ෂිකරුවන් පවා මිය ගිහින් තිබෙන අවස්ථාවල රඳවා තබා ගැනීමේ කාල සීමාව ම දණ්ඩනයක් හැටියට සලකා හෝ එම සැකකරුවන් නිදහස් කිරීමේ හැකියාව සලකා බැලීමට අද වෙනම කොමිසමක් පත් කර, ඒ පිළිබඳව විමසා බලන තත්ත්වයක් අප නිර්මාණය කර තිබෙන බව. ඒ නිසා අපි කිව යුතුයි, අපගේ දමිළ සහෝදරවරුන් සම්බන්ධයෙන්, උතුරු-නැඟෙනහිර සහෝදරවරුන් සම්බන්ධයෙන් අපට කිසිම ආකාරයකට ප්‍රශ්නයක් නැති බව. අප මේ උත්සාහ කරන්නේ අපේ රටේ රාජ්‍ය ආරක්ෂාව තවදුරටත් තහවුරු කරන්නයි. මොකද, යුද්ධය අවසන් වුණා කියලා ත්‍රස්ත ප්‍රහාර කවදාවත් නවතින්නේ නැහැ; ත්‍රස්ත ප්‍රහාර සිදු නොවී තිබෙන්නේ නැහැ. ත්‍රස්ත ප්‍රහාර නොමැති, ආරක්ෂාව සම්බන්ධයෙන් සියයට 100ක් වග කියන්න පුළුවන් රාජ්‍යයක් බිහි කරනවා කියන්න අපට බැහැ. එවැනි තත්ත්වයක් පවතින වෙලාවකත් අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු සමහර විට කියනවා, අපේ රටේ සිටින යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සංඛ්‍යාව අතිවිශාලයි කියලා. නමුත්, එතුමන්ලාගේ ආණ්ඩුව වාගේ නොවෙයි, අපේ ආණ්ඩුව ඒ යුද්ධ හමුදාව අද නොයෙකුත් කාර්යවලට උපයෝගී කර ගන්නවා. සමහර වෙලාවට සංවර්ධන ව්‍යාපෘති සඳහා අපි යුද්ධ හමුදාව උපයෝගී කර ගන්නවා. සමහර වෙලාවට වසංගත රෝග වළක්වා ගන්න යුද්ධ හමුදාව උපයෝගී කර ගන්නවා. ඒ සියලු කාරණා එක්ක බැලුවාම පෙනී යන්නේ මොකක්ද? අපි දේශපාලන තීන්දුවක් ගෙන තිබෙනවා රට ආරක්ෂා කිරීමටත් වඩා මේ රටේ දියුණුව සඳහා යුද්ධ හමුදාව උපයෝගී කර ගන්න කටයුතු කරන බවට. මා ඒ කාරණය පැහැදිලිව කියන්න ඕනෑ.

අද බොහෝ දෙනා මේ පනත බොහොම නිෂේධනාත්මකව විවේචනය කරන ස්වරූපයක් අපට පෙනෙන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවදාවත් සර්ව සම්පූර්ණ නීතියක් බිහි වන්නේ නැහැ. නීතිය අඛණ්ඩව වෙනස් වෙනවා. මනුෂ්‍ය චර්යා අනුව නීතිය අඛණ්ඩව වෙනස් වෙනවා. ඒ අනුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කිරීම තුළින් ද එදා තිබුණු සමාජයීය තත්ත්වය, එදා තිබුණු ආකල්ප වෙනස් කර නව ආකල්ප ඇතිව, එදා හිටපු තැනින් මෙහාට අපි ඇවිත් තිබෙනවා.

මෙම සංශෝධන පනත් කෙටුම්පත හරහා රඳවා තබා ගැනීමේ නියමයක් යටතේ යම් තැනැත්තකු රඳවා තබා ගන්නා කාල සීමාව මාස 18 සිට මාස 12 දක්වා අඩු වී තිබෙනවා. ඒ වාගේම, රඳවාගත් පුද්ගලයා ආරක්ෂා සහිතව සිටින බව තහවුරු කරගැනීම සඳහා මහෙස්ත්‍රාත්වරයෙකුට රැඳවුම් ස්ථානයට යෑමේ සුවිශේෂී හැකියාව ලබා දී තිබෙනවා. ඒ වාගේම, යම් පුද්ගලයෙකුට දැඩි, කෲර, අමානුෂික, අවමන් සහගත සැලකිලි කර තිබෙනවා නම්, ශාරීරික පීඩා කර තිබෙනවා නම් එය සොයා ගන්නත් පුළුවන්. මාසයකට වරක් මහෙස්ත්‍රාත්වරයෙකු ගිහින් ඒ පුද්ගලයා නිරීක්ෂණය කිරීම සහ අධිකරණ වෛද්‍ය නිලධරයාගේ පරීක්ෂාව මඟින් පැහැදිලිවම අපට සොයාගන්න පුළුවන් ඒ පුද්ගලයා යම් ආකාරයක වින්දනීය ස්වරූපයේ කුරිරු සැලකිල්ලකට ලක් කර තිබෙනවාද කියලා. මේ ගෙන තිබෙන සාධනීය පියවර ගැන බොහොම අඩු ලුහුඬුව කථා කිරීම ගැන අපි කම්පා වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පත මඟින් බොහොම සාධනීය සංශෝධන ගණනාවක් ගෙනැල්ලා තිබෙනවා. යම් රඳවා තබාගන්නෙකු සම්බන්ධයෙන් නීතිඥවරයකු මාර්ගයෙන් කරුණු කියාපෑමට ඉඩ දීම, තමන්ගේ ඥාති හිතමිත්‍රාදීන් හමු වීමට ඉඩ දීම වැනි කාරණා සාධනීය වෙනස්කම් නොවේද? පූර්වයේ නොතිබුණු නමුත් කළ යුතු වෙනස්කම් ගණනාවක් අද මෙමඟින් ඉදිරිපත් කර තිබෙනවා. ඒ එක්කම, ප්‍රකාශන තහනම් කිරීම පිළිබඳව සඳහන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 14වන වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කර තිබෙනවා.

ඒ අනුව, ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාව ලබා දී තිබෙනවා. එහෙම කල්පනා කර බැලුවාම, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සම්පූර්ණයෙන් ඉවත් කරනවාට වඩා එම පනතට යම් යම් සංශෝධන ගෙන ඒම හරහා සැකකරුවෙකුට, රඳවා තබාගන්නෙකුට වඩාත් පුළුල් ලෙස අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන තත්ත්වයක් අද අප පැහැදිලිව ම නිර්මාණය කර තිබෙන බව පෙනෙනවා.

රටක රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් තීන්දු තීරණ ගනිද්දී වෙනත් තීන්දු තීරණ ගන්නවාට වඩා එහාට ගිහින් අප එම තීන්දු තීරණ ගන්න ඕනෑ. අද පැය 72ක් රඳවා තබා ගැනීම ගැන කථා කළාට සාමාන්‍ය නීතිය යටතේ වුණත්, ළමා අපචාර සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් යම් සැකකරුවකු වුණත් පැය 72ක් රඳවා තබා ගැනීමේ හැකියාව තිබෙන බව අපි දන්නවා. සැකකරු පැය 72ක් රඳවා තබාගෙන මහෙස්ත්‍රාත්වරයෙකුට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවා සාමාන්‍ය නීතියේත් තිබෙනවා. පාපෝච්චාරණය කියන කාරණය ගත්තත් එහෙමයි. සාමාන්‍ය නීතිය තුළත් -සාක්ෂි ආඥාපනතේ 27(2) වගන්තිය යටතේත්- පාපෝච්චාරණය කියන කාරණය අඩංගුවෙලා තිබෙනවා. හැබැයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මෙසේ සුවිශේෂ වශයෙන් සංශෝධනය කිරීමේදී, පවතින නීතියෙන් අප මෙහාට ඇවිත් තිබෙනවාය කියන කාරණය මා පැහැදිලිව ප්‍රකාශ කරනවා. ඒ පනත එහෙම පිටින් ගලවා වීසි නොකර අප එයට සාධනීය ලෙස යම් යම් සංශෝධන එක් කර තිබෙනවා. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒ නිසා උතුර, නැඟෙනහිර නියෝජනය කරන සහෝදරවරුන්ගෙන් වාගේම විපක්ෂයේ අනෙක් සහෝදරවරුන්ගෙන් මා ඉල්ලා සිටින්නේ, මේ වෙලාවේ ආණ්ඩුව කරන හැම දේකටම විරුද්ධ වෙන්න එපා කියලායි. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ඔබතුමන්ලා සියලුදෙනා ආණ්ඩුවත් එක්ක ගමන් කළ යුතුයි. එවැනි අවස්ථාවක් තමයි මේ එළඹ තිබෙන්නේ. මේ සංශෝධන ගෙන ඒම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වන ගමන් අද අපේ රටේ පවතින කාරණා කිහිපයක් ගැන කථා කරන්න, යෝජනා කීපයක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. Hon. Presiding Member, I think I have two more minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල අපි දකිනවා, ඉන්ධන හිඟයක් විශාල වශයෙන් පවතින බව. ඉන්ධන හිඟ තත්ත්වයක් අද තිබෙනවා. ත්‍රිරෝද රථ ධාවනය මඟින් එදිනෙදා ජීවිකාව සොයා ගන්නා සහෝදරවරු අද ඔවුන්ගේ ත්‍රිරෝද රථවලට තෙල් ගහ ගන්න බැරිව ඉන්නවා.

ඒ නිසා අදාළ බලධාරින්ට මා යෝජනා කරනවා, හැකියාවක් තිබෙනවා නම්, ත්‍රී වීලර් හා මෝටර් බයිසිකල් පදවන අයට වෙන් වුණු petrol shed එකක්, එහෙම නැත්නම් ඒ අයට ඉන්ධන ලබා ගැනීමට පැයක හෝ පැය දෙකක නිශ්චිත කාල රාමුවක් ලබා දීමේ යම් ක්‍රමයක් ඇති කරන්න කියලා. මොකද, ඒ අය ලීටර් 5ක විතර පෙට්‍රල් ප්‍රමාණයක් තමයි වාහනවලට ගහන්නේ. එතකොට වැඩිදෙනකුට පෙට්‍රල් ගහගන්න පුළුවන්.

ඊළඟ කාරණය මේකයි. අද ගෑස් නොමැති වීම විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. පොලීසිය හෝ අදාළ යන්ත්‍රණ සම්බන්ධවෙලා, කූපන් එකක් ඉදිරිපත් කරලා, ගෑස් සිලින්ඩරය ගෙදරට ගෙන ගොස් දෙන්න පුළුවන් නම් හොඳයි. මේවා බොහොම ප්‍රායෝගික දේවල්. එවැනි කාරණා සම්බන්ධයෙනුත් අපට ක්‍රියාත්මක වෙන්න පුළුවන් නම් වඩා හොඳයි කියන කාරණය මට පෙනෙන්න තිබෙනවා. ඒ සමහර දේවල් අපට ප්‍රායෝගිකව වෙනස් කර ගන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. පසුගිය අවස්ථාවකත් මේ යෝජනාව මා ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයාත් ඒ පිළිබඳව මතක් කළා. ඔහුත් එයට එකඟ වුණා. පිටරට ඉඳලා වාහන ගෙන්වනකොට අය කරන ටැක්ස් ඒ රටවල සිට ඩොලර්වලින් ගෙවන්න පුළුවන් ක්‍රමයක් අපි යෝජනා කළා. ඒ සම්බන්ධයෙනුත් නැවත වතාවක් මේ සභාවේ අවධානය යොමු කරවනවා. මෙවැනි අවස්ථාවක එවැනි දෙයක් කළොත් පිටරට ඉඳලා වාහනයක් ගෙන්වන්න අවසර දෙනකොට ඒ ටැක්ස් පිටරටින් ගෙවන්න පුළුවන් නම්, ඒ ඩොලර් ප්‍රමාණය අපේ රටට ලැබෙනවා. මෙවැනි ක්‍රමවේද පිළිබඳව මා නැවත වතාවක් මතක් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය 02වන දා පැවති, "මුළු රටම හරි මඟට" සමුළුවට මා සහභාගි වුණාය කියලා, පසුපෙළ මන්ත්‍රීවරුන් යයි කියාගන්නා මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් කියා තිබෙනවා, "පසු පෙළේ වාඩි වෙන්න දෙන්නේ නැහැ. පසු පෙළට එන්න දෙන්නේ නැහැ" කියලා. මා පැහැදිලිව කියන්න ඕනෑ, එදා 2015දී මහින්ද රාජපක්ෂ මැතිතුමා පරාජයට පත් වුණාට පස්සේ, එතුමාගේ මැතිවරණ කාර්යාලය නියෝජනය කළ නියෝජිතයන් 5දෙනාගෙන් කෙනකු වශයෙන් මා භය නැතුව ගිහිල්ලා එතුමා වෙනුවෙන් මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ පෙනී සිටි බව. හැම විටම හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන නීතිඥයකු හැටියට, කොන්ද කෙළින් තබාගෙන වැඩ කරන කෙනෙකු හැටියට මම එදා "පරාජිතයි" කියලා අත්සන් කළා. ඒ නිසා මම එක එක්කෙනා කියන විධියට, "එහේ වාඩි වෙන්න දෙන්නේ නැහැ, මෙහේ වාඩි වෙන්න දෙන්නේ නැහැ" කියන කථාවලින් භය කරන්න පුළුවන් කෙනෙකු නොවන බව පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක්තරා මාධ්‍යයක කියා තිබුණා, මා ඒ සමුළුවට සහභාගි වෙලා, සහභාගි වුණේ නැහැයි කියලා දැන් කියනවා කියලා. එහිදී නීතිඥයකු වන මට යොමු කළ ප්‍රශ්නය තමයි, "ඔබ පක්ෂ 11 සාකච්ඡාවට සහභාගි වුණාද" කියන එක. මා සාකච්ඡාවලට සහභාගි වුණේ නැහැ. හැබැයි, මා එම සමුළුවට සහභාගි වුණා. හෘදය සාක්ෂියට එකඟව භය නැතුව තීන්දු ගන්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මා අදත්, හෙටත්, අනිද්දාත් පැහැදිලිව කියනවා, මා ඒ සමුළුවට සහභාගි වුණාය කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහණ දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.16]

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට ශුභවාදී සංශෝධන කිහිපයක් එකතු කරමින් අද මේ උත්තරීතර සභාවේ ඒ ගැන විවාද කරන අවස්ථාවේ මටත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව ඉතාම සතුටු වෙනවා. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත එදා ගෙනාවේ කෙටි කාලයක් සඳහායි; මාස කිහිපයක් සඳහායි. ඒ, එදා රටේ පැවතුණු තත්ත්වය අනුව ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහායි. 1979 සිට අද වනකොට අවුරුදු 42ක් පමණ ගතවෙලා තිබෙනවා. එදා මෙදා කාලය තුළ අවස්ථා කිහිපයක දී එම පනතට සංශෝධන ඇතුළත් වෙලා තිබෙනවා. අද විදේශ අමාත්‍ය ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාත්, අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි ඇමතිතුමාත් මූලිකවෙලා මේ කටයුතු සිද්ධ කරනවා. වත්මන් අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේත් මැදිහත් වීමෙන් එදා අපේ රජය මේ රටේ ත්‍රස්තවාදය පරාජය කරන්න කටයුතු කළා. ඒ වාගේම ඉදිරියටත් මේ රටේ ත්‍රස්තවාදය පරාජය කිරීමට කටයුතු කරනවා. විශේෂයෙන්ම ත්‍රස්තවාදයට අදාළ යම් යම් හේතු කාරණා නිසා බන්ධනාගාරගත වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහාත්, ඒ වාගේම රිමාන්ඩ් බන්ධනාගාරගත වූවන් පිළිබඳව ඉතාම සාවධානව කල්පනා කර බලා ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට කිරීම සඳහාත් කටයුතු කිරීම මේ සංශෝධන තුළින් බලාපොරොත්තු වන ප්‍රධාන කරුණු කාරණා වෙනවා. තිබෙන ඉතාම වැදගත් කරුණු කාරණා අතර, මේ නීතිය යටතේ මාස 18ක් දක්වා බන්ධනාගාරගත වීමේ කාල සීමාව මාස 12 දක්වා අඩු කිරීම මේ සංශෝධන මඟින් සිද්ධ වෙනවා.

ඒ වාගේම රැඳවුම් භාරයේ සිටින අය බලන්න යන අයගෙන් ඒ සම්බන්ධ නොයෙකුත් චෝදනා තිබෙනවා. "ඔහු බලන්න දෙන්නේ නැහැ. කථා කරන්න දෙන්නේ නැහැ. ඔවුන්ට සහන සලසන්න දෙන්නේ නැහැ. ඔවුන් වෙනුවෙන් කිසිම සාධාරණයක් ඉෂ්ට කරන්නේ නැහැ" කියමින් යම් යම් අවස්ථාවල චෝදනා කරනවා අපි දකිනවා. වූදිතයන් වෙනුවෙන් කථා කරන උදවිය එවැනි චෝදනා කරනවා. ඔවුන්ගේ ඥාති මිත්‍රයන් එවැනි චෝදනා කරනවා. හැබැයි, මේ ගෙනැවිත් තිබෙන සංශෝධන පනත් කෙටුම්පත තුළ ඒ විධියට චෝදනා කරන අයට සතුටු වෙන්න පුළුවන් ඉතාම සාධනීය වූ කරුණු කාරණා රාශියක් ඇතුළත් කර තිබීම ඉතාම වැදගත්.

අපි ත්‍රස්තවාදය අනුමත කරන පිරිසක් නොවෙයි. ත්‍රස්තවාදය පරාජය කරන්න ඉතිහාසය පුරාම විවිධ රජයන් උත්සාහ කළා. 1976න් පස්සේ අපේ රටේ ජනාධිපතිවරුන් කිහිප දෙනෙකුම රට පාලනය කළා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, ඩී.බී. විජේතුංග මැතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ රට පාලනය කළා. ඔඩුදුවන තුවාලයක් වාගේ, හිඟන්නාගේ තුවාලය වාගේ ත්‍රස්තවාදය තිබුණු රටක ඒ ත්‍රස්තවාදය අවසන් කරලා, මේ රටේ අනාගත පරම්පරාවට ත්‍රස්තවාදය අවසන් කළ රටක් ලබා දෙන්න වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි. එතුමා සේනාධිනායකයා වශයෙන්, ජනාධිපතිවරයා වශයෙන් එදා ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා කටයුතු කළා. ඒ වාගේම එදා ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කළ වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. ත්‍රස්තවාදය නිසා මිය ගිය සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, ඉස්ලාම් කියන කාගේ වුණත් ජීවිත ඉතා වටිනවා. උණ්ඩය නිසා ඒ ජීවිත නැති වෙන එකට තිත තියන්න, අනාගත පරම්පරාවට ඒ ත්‍රස්තවාදය ලබා නොදෙන්න එවකට හිටපු ජනාධිපතිතුමා සහ වර්තමාන ජනාධිපතිතුමා එකතු වෙලා කටයුතු කළා. එහිදී මේ රටේ යුද හමුදාව, පොලීසිය අපි ඔක්කෝම එකට එකතු වුණා. සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා වෙනසක් නැතිව රටේ හැම ජනතාවම ත්‍රස්තවාදයට විරුද්ධයි. ලෝකයම ත්‍රස්තවාදයට විරුද්ධයි. ඒ පිළිබඳව හොඳ අවබෝධයක් අපට තිබෙනවා. අපේ රටේ තිබුණු ත්‍රස්තවාදී යුද්ධය අනාගත පරම්පරාව වෙත ගෙන යන එක නැවතුණේ 2009 වර්ෂයේ දී. එදා ඒ ත්‍රස්තවාදය පරාජය කරපු නිසා අලුත් ගමනක් සහිතව නිදහසේ මේ රටේ ඉදිරියට යන්න අපට හැකියාව ලැබුණා. මහ බැංකුව අසල, දුම්රිය ස්ථානවල, පාසල්වල, බස්වල තබපු බෝම්බ වාගේම පිච්චමල් පූජාව සඳහා ගිය බැතිමතුන් ඉලක්ක කරගෙන කළ ත්‍රස්තවාදී ක්‍රියා නිසා මේ රට විශාල විනාශයකට ලක් වුණා. ඒ නිසා අතිවිශාල ජනතාවක් මිය ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොඩනැඟිලි වැනි භෞතික දේවල් නැති වුණොත් අපට ඒවා නැවත හදාගන්න පුළුවන්. හැබැයි, උණ්ඩයක් නිසා නැති වුණු ජීවිතයකට නැවත පණ දෙන්න කිසිම කෙනෙකුට හැකියාවක් නැහැ. ඒ නිසා ත්‍රස්තවාදය පරාජය කිරීමේ වගකීම තමයි අපට ඉෂ්ට කරන්න තිබුණේ. එවකට හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒ වග කීම නිසි අයුරින් ඉෂ්ට කළා. ඒ ත්‍රස්තවාදී යුද්ධය අපි අනාගත පරම්පරාවට උරුම කළේ නැහැ.

2015 වර්ෂයේ අපේ රජය පරාජයට පත් වුණා. 2015 වර්ෂයේ අපේ රජය පරාජය වුණාට පස්සේ, එතෙක් තිබුණු නිදහස 2019 අප්‍රේල් මාසයේ 21වැනි දා පාස්කු දිනයේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය නිසා නැති වුණා. නැවත මේ රටේ ත්‍රස්තවාදී ක්‍රියාවක් සිද්ධ වුණා. ඒ ත්‍රස්තවාදී ක්‍රියාව ඇති වෙන්න කලින් මේ රටේ බුද්ධි අංශ 97 වතාවක් කියලා තිබුණා, "මෙවැනි තත්ත්වයක් එනවා. ඒක පරාජය කරන්න, එහෙම නැත්නම් ඒ සඳහා යම් ආකාරයකට කටයුතු කරන්න" කියලා. හැබැයි, එදා හිටපු පාලකයෝ මොකක්ද කළේ? මම ඒ අයගේ නම් කියන්න උත්සාහ කරන්නේ නැහැ. කවුරු වුණත් තමන්ගේ වගකීම පිළිබඳව කල්පනා කළේ නැහැ. ඔවුන් බුද්ධි අංශ ලබා දුන් තොරතුරු නොසලකා හැරියා. ඒ නිසාම 2019 වර්ෂයේ පාස්කු ඉරිදා ප්‍රහාරය මේ රටේ ඇති වුණා. අවුරුදු 10ක් රටේ ජනතාව නිදහසේ ජීවත් වුණත්, ඒ ප්‍රහාරය නිසා රට තුළ නැවත ත්‍රස්තවාදය පිළිබඳ බයක් ඇති වුණා. ඒ වාගේම එම ප්‍රහාරය නිසා අතිවිශාල ජනතාවක් මිය ගියා; දේපළ විනාශ වුණා. එපමණක් නොවෙයි. ඒ අවස්ථාවේ අපේ රට සංවර්ධනයේ මාවත කරා යොමු වෙලායි තිබුණේ. 2015 වර්ෂයේදී අපි යහ පාලන ආණ්ඩුවට මේ රට භාර දෙනකොට ඇමෙරිකන් ඩොලර් බිලියන 8.5ක විදේශ සංචිත ප්‍රමාණයක් තිබුණා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය ඔස්සේ අපට අවුරුද්දකට ඇමෙරිකන් ඩොලර් බිලියන 5කට වැඩි මුදල් ප්‍රමාණයක් ලැබුණා.

අවුරුදු තුනකට ඇමෙරිකන් ඩොලර් බිලියන 15යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි International Sovereign Bonds අත්සන් කර තිබුණා. එයින් ඇමෙරිකන් ඩොලර් බිලියන 12.5ක් යහ පාලන ආණ්ඩුව ලබා ගත්තා. 2019 වෙනකොට ඩොලර් බිලියන 35ක් වාගේ අපට ලබා දීලා තිබුණා. හැබැයි, 2020දී අපට ලැබුණු මුදල් දිහා බැලුවාම, මේ රටේ සංචාරක ව්‍යාපාරයෙන් අපට ලැබුණු සම්පූර්ණ ආදායම නැති වෙලා තිබෙනවා. මේ රටේ නිදහසේ ගත කරන්න බැරි තත්ත්වයක් අද උදා වෙලා තිබෙනවා. හැබැයි, බොහෝ අය උත්සාහ කරනවා, මේක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නිසා ඇති වුණු තත්ත්වයක් කියලා පෙන්වන්න.

අද අපි ඩොලර් ප්‍රශ්නයකට මුහුණ දෙනවා. දේශීය වශයෙන් තවත් නොයෙක් ගැටලුවලට අපි මුහුණ දෙනවා. හැබැයි, මේ ගැටලු 2015දී පටන්ගත් යහ පාලන ආණ්ඩුවේ වැරැදි නිසා ඇති වූ

ඒවාය කියන එක මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. අද ඒ නායකයෝ තමන්ගේ වැරැදි වෙනත් අයගේ පිට උඩ දමලා බේරෙන්න උත්සාහ කරනවා. අපි ඒ තත්ත්වය පැහැදිලි කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබට නියමිත කාලය දැන් අවසන්.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திஸாநாயக்க)
(The Hon. Rohana Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

වර්තමාන ජනාධිපතිතුමා, අගමැතිතුමා ප්‍රමුඛ රජය එවැනි ණය ලබා ගෙන මේ තිබෙන ගැටලුවලට නිසියාකාරව පිළිතුරු ලබා දීලා, රාජ්‍ය තන්ත්‍රය නියමාකාරයෙන් පවත්වා ගෙන යන්නයි බලාපොරොත්තු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කොවිඩ් - 19 වසංගතය තවත් ත්‍රස්තවාදයක් වුණා. ඒ ගැටලුවත් විසඳලා ඒ වසංගතය මේ රටින් තුරන් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ අද ක්‍රියාත්මක කර තිබෙනවා. මේ ප්‍රශ්න අනාගත පරම්පරාවට ලබා දෙන්න අපි ඉඩ තබන්නේ නැහැ. ජනාධිපතිතුමා යන ගමන, අපේ රජය යන ගමන තවත් ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම, මේ කිසිම ගැටලුවක් අනාගත පරම්පරාවට ඉතිරි නොකර, මේ රට හැම පැත්තකින්ම නිදහස් කරන බවත්, ආර්ථික සංවර්ධනය ඇති කර, ජීවන මට්ටම උසස් කර, ජීවන තත්ත්වය පහසු කර, අධ්‍යාපනය, සෞඛ්‍යය ආදි අංශ වැඩි දියුණු කරන බවත් අද මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පතට සංශෝධන ගෙන එන වෙලාවේ අපි මතක් කරන්න කැමැතියි. මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් බන්ධනාගාරවල සිටින අයටත්, එයින් නිදහස් වුණු අයටත්, ඒ වාගේම අනාගත පරම්පරාවටත් බොහොම සුබවාදී බලාපොරොත්තු තබා ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து கௌரவ க.வி. விக்னேஸ்வரன் அவர்கள்! உங்களுக்கு 6 நிமிடங்கள் உண்டு.

[2.26 p.m.]

**ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා**
(மாண்புமிகு க.வி. விக்னேஸ்வரன்)
(The Hon. C.V. Wigneswaran)
Let me thank the Chair for giving me this opportunity to speak about a heinous, hideous, barbaric and draconian law in existence in Sri Lanka for the past 43 years. It came in as a Temporary Provisions Act, but it has had a two score and three-year stint thanks to the successive Sri Lankan Governments who preferred their own individual safety than the safety of the people. The provisions of this Act have been conveniently used by successive Governments to silence their critics and to terrorize their opponents. It has been mostly used against the Tamils and, in recent times, against the Muslims. Many an innocent person had been convicted solely on the basis of uncorroborated confessions made to police officers, which were manufactured by the powers that be.

The very Act which sought to prevent so-called terrorism fanned the flames of hatred and violence. When the State decided that a person must be kept in long custody or detention, it immediately preferred to take that person into custody under the PTA, whether he had committed any offence or not.

Often Judges grant conditional bail to persons detained for long periods without charges or indictments being filed, advising the Police or the Attorney-General's Department to file cases when they are ready. More often, such cases are not filed. It could only mean that the purpose of the arrest was detention and incarceration of the person rather than any severe act committed by such person. The PTA has been an instrument of repression rather than a mechanism to ensure public security. The powers that be have so far raised the bogey of terrorism and kept this draconian law in the statute books until now. It is high time that the PTA is withdrawn altogether.

Mostly, those taken into custody under the PTA are political prisoners or prisoners of conscience. A political prisoner is a dissident generally, who is critical of agents of governmental authority - military included - or ruling elites. These political prisoners are different from common criminals. Whereas political prisoners are involved in some type of group struggle against the establishment or the ruling elites, common criminals are typically involved in an element of satisfying their self-interests. Political prisoners are those penalized by legal systems and imprisoned by a political regime, not for their violation of the country's codified laws, but for their thoughts, ideas and actions that have fundamentally challenged the existing power relations. It is the State which identifies individuals as common criminals and so-called "terrorists". Prior to capture, they may have been dissidents, revolutionaries, social reformers, freedom fighters or radical thinkers depending upon the nature of their activities and how their activities were interpreted, but they all become so-called "terrorists" after arrest under the PTA.

The Amendment Bill seeks to give a few cosmetic concessions to those taken into custody under the PTA. It has not examined the crux of its illegality. I say illegal because, in comparison with our regular criminal law, there are provisions in the Prevention of Terrorism Act that go contrary to the basic principles of criminal and evidentiary law. Act No.48 of 1979 permits the conviction of a person purely and solely on his confession made to a police officer. Our regular law forbids the acceptance of confessions made to police officers as evidence. Thus, the Amendment Bill seeks to make cosmetic changes, forgetting that the law itself is

[ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා]

contrary to the regular law of the country and, therefore, needs to be jettisoned from our statute books. The general civilized law of our country frowns upon the admission as evidence of confessions to police officers due to the danger of confessions being "manufactured" in police stations through physical or mental intimidation. Such admittance by a "politically-motivated law" such as the PTA was contrary to Sri Lanka's obligations under the International Covenant on Civil and Political Rights.

The danger of relying on an uncorroborated confession lies on the possibility of the matters stated in the confession being found to be factually wrong or erroneous. If we suppose an accused states that he shot and killed person "X" and it later transpires that "X", in fact, is still living, the charge would fail, but the accused would have been found guilty solely on his confession and he would be convicted and sentenced. In the absence of the Act requiring corroboration of the contents of the confession by separate independent evidence essential to find an accused guilty, the PTA must be removed from our statute books; it has no place in a civilized country. I hope all my Colleagues in this august Assembly consider this country civilized.

Therefore, it is appropriate that the PTA as well as the Amendment Bill are withdrawn even at this late stage. If we are interested only in dealing with common criminals, our regular criminal law is more than enough, but if our politicians are interested in saving themselves from the wrath of their voters and cirtics, then they would have to retain such a diabolical law for their own individual safety. But, our politicians would have to realize that the PTA would be an instrument of repression against them in the hands of their successors opposed to them later.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you, Hon. Member. Your time is over.

**ගරු සී.වී. විග්නේෂ්වරන් මහතා**
(மாண்புமிகு க.வி. விக்னேஸ்வரன்)
(The Hon. C.V. Wigneswaran)
Please give me half a minute, Sir.

In their own interest, the present Government, which has so soon earned the wrath of our people, must make sure that the PTA is no more when they leave office. Otherwise, the PTA would boomerang on them. Let us hope the PTA as well as the Amendment Bill would be withdrawn today.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Eran Wickramaratne. You have eight minutes.

[2.32p.m.]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Thank you, Hon. Presiding Member.

Today, in this Debate, we have had many views expressed and something that really surprised me was the former Prime Minister Ranil Wickremesinghe putting up his hand and saying that he was also responsible for bringing in the PTA under urgent conditions in 1979. I had no issue with that. He was a young politician and he participated in that process. But what surprised me was that he concluded that with the PTA it was actually possible to reduce terrorism. 1979, 1983, and 1990s! I mean, what are we talking about? Terrorism does not basically go away. We are just formulating laws. Laws are part of a system and terrorism does not go away in that particular way.

The problem we have with the present PTA - if I am to summarize it - is that the term that somebody could be held is extraordinarily long, and the amendment suggests to bring it down. The next problem we have with it is that a person really is not produced before a Magistrate like under the normal law and it is by a Detention Order by the Executive. The third issue we have is it denies bail to the accused even though an indictment has already been there in the High Court and fourthly, it makes confessions to police officers admissible and thereby incentivizing the abuse of those in custody. So, it is very clear that this has been abused in a big way.

Just to give you an idea, according to the data of the Human Rights Commission of Sri Lanka, 212 people were arrested under the PTA in 2020 and it was 109 people in 2021. This is what actually the data shows and I will not go into all the data. The well-known cases of how this has been abused are the cases of Rishad Bathiudeen, the arrest of Azath Salley, Hejaaz Hizbullah, then, Ahnaf Jazeem, and with Hejaaz Hizbullah**,** five others have also been held under the PTA. And also, there are some names which we have talked less about and among them is the high-profile case of Murugupillai Kokulathasan, a freelance Tamil journalist who was arrested in Batticaloa on 28th Novermber, 2020 because of a social media post commemorating civil war-related incidents. He remains in custody. Keerthi Ratnayake, a freelance journalist, was summoned to a police station and arrested on 14th August 2021 and he remains in custody. Ten Tamil-speaking people were arrested for having memorialization events in Batticaloa on 18th May, 2021 and held under the PTA. In Batticaloa, again the police detained 19 people in November, 2020 for allegedly posting online birthday wishes for the late LTTE leader. Well, if these are offences, let us take them under the normal law of the country.

I do not think we should be using a draconian law like the PTA to harass people like this and I think we should look at it under the normal law of the country.

Sir, I am now quoting from a document released by the Human Rights Commission of Sri Lanka on the 15th of February, 2022 under the signature of the Chairperson Justice Rohini Marasinghe, which states, I quote:

> "Notwithstanding the amendments already suggested by the government, the HRCSL advocates the complete abolition of the PTA.
>
> The Commission believes that the offence of terrorism should be included in the Penal Code with a new definition for terrorism. It is explicitly for those who threaten or use violence unlawfully to target the civilian population by spreading fear thereof to further a political-ideological or religious cause. The Commission advocates that terrorism should be investigated under the General Law of the country with necessary amendments. The Commission also supports that it is not required to exclude the application of the Evidence Ordinance for the offence of terrorism. The indefinite period of detention violates the Constitution. 'Deprivation of liberty of a person pending investigation or trial shall not constitute punishment' (Art 13(4).' "

This is the view of the Human Rights Commission of Sri Lanka.

Now, we really need to address this issue. We, the Members of the Samagi Jana Balawegaya, are conscious of the importance of national security. The question that really lies before this House is how do we balance the importance of national security with prevention of terrorism. How do we balance this? How do we protect the human rights of people while being conscious of the issues of national security?

What happened when this law was brought in 1979? It was brought in and passed basically under the state of Emergency and there was no reference to the Supreme Court of the country. That is how it was actually passed and it remained in the books for so long without actually being corrected. One fundamental problem with this is that the provisions reflect an undue and totally unconstitutional lack of trust in the competence of the judicial officers in the country. I think we need to rebalance this by focusing on the importance of the judiciary and the judiciary making the decision whether somebody should be held or whether that person should actually be released.

The Samagi Jana Balawegaya is proposing that we take the Law Commission draft prepared in 2016 under the Chairmanship of President's Counsel Romesh de Silva, who is presently the Chairman of the present Government's constitutional process committee and adapt that as actually the alternative to the existing PTA. So, we are for repealing the existing PTA and then replacing it with the draft prepared in 2016.

I might say this in closing my remarks. I listened carefully to the Hon. Minister and I could not agree with everything he said. For example, he said that there are going to be daily trials. The issue is, before you get to the trials, people are unfairly held for such long periods. I have a long list of them. I cannot read them because of the lack of time. The magistrate going and visiting detention centres is not practical. I am not sure whether the Hon. Minister has visited a prison cell. I have visited the prisoners in prison cells. I have been to detention centres. It is not practical for a magistrate because he has a load of work to do instead.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
Sir, I will conclude with what the Daily Financial Times has stated on the 07th of March, 2022. I quote:

> "What is needed is a genuine effort in Sri Lanka to address its numerous outstanding human rights issues. In this regard it is time for an emeritus professor of law to learn a few things from a dead fashion designer on how to be a positive instrument of change to advance human rights in Sri Lanka."

Thank you for the time provided.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආචාර්ය සරත් වීරසේකර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.40]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අද අපි කථා කරන්නේ. ප්‍රථමයෙන් මම පිළිතුරක් දෙන්න කැමැතියි පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මන්ත්‍රීතුමාට. එතුමා මේ විවාදයේදී කිව්වා, එතුමාගේ රැස්වීමකට බාධා කරපු පුද්ගලයෙක් ඉවත් කළ පොලිස් නිලධාරින් දෙදෙනෙකුට විරුද්ධව දඬුවම් කරන්න කියලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති- බස්නාහිර, උපදෙස් දීලා තිබෙනවා කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි; එය අසත්‍යයක්; සත්‍යයෙන් තොරයි. එහෙම එකක් වෙලා නැහැ. නමුත්, ඇත්ත වශයෙන්ම මේ සිද්ධිය සමාජ මාධ්‍යවල ඉතා විශාල ලෙස පැතිරුණා. ඒ වාගේම එය ආන්දෝලනාත්මක සිද්ධියක් බවට පත් වුණා. නමුත්, ඒ සිද්ධියට සම්බන්ධ අදාළ ප්‍රදේශයේ මූලස්ථාන භාර පොලිස් පරීක්ෂකවරයා - HQI - ඉහළ නිලධාරින්ට දැනුම් දීලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි ඔහුගෙන් නිදහසට කරුණු අහලා තිබුණේ. එහෙම නැතිව, අදාළ පොලිස් නිලධාරින් දෙදෙනාට විරුද්ධව කිසිම දෙයක් කරලා නැහැ. ඒ පිළිබඳ මම පළමුවෙන්ම කියන්න ඕනෑ. මා විජිත හේරත් මන්ත්‍රීතුමාට කියා සිටිනවා, මේ වාගේ වග කීමකින් තොර ප්‍රකාශ මීට පස්සේ කරන්න එපා කියලා.

1979දී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා එල්ටීටීඊ ත්‍රස්තවාදය මර්දනය කරන්න තමයි තාවකාලිකව, -මේ විවාදයේදී බොහෝ මන්ත්‍රීවරුන්ගෙන් ඒක කියැවුණා.- ඉතා හදිසියෙන් මේ පනත ගෙනාවේ. මේකට මහජන මතය වුණත් නිසි පරිදි ලබා

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

ගත්තේ නැහැ. මම හිතන විධියට ශ්‍රේෂ්ඨාධිකරණයට වුණත් මේ පනත් කෙටුම්පත ව්‍යවස්ථානුකූලද, නැද්ද කියලා බලන්න පැය 24යි ලබා දුන්නේ. එදා සිට අද දක්වා මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත - PTA එක - තමයි තිබෙන්නේ. ඒ පනතට තමයි අද මේ සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ. උදාහරණ කිව්වොත්, රඳවුම් කාලය මාස 18 සිට 12 දක්වා අඩු කිරීම, මහෙස්ත්‍රාත්වරයාට රඳවුම් ස්ථානයට පැමිණ ඒ සිරකරුවන්, රඳවුම්කරුවන් අධීක්ෂණය කිරීම, වධහිංසාවට ලක් නොවූ බව සනාථ කිරීම වාගේ සියලුදෙයක්ම මේ සංශෝධන තුළ තිබෙනවා. මේවා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට ගෙනෙන සංශෝධන පමණයි. නමුත්, ඇත්ත වශයෙන්ම අද ලෝකයේ පවතින ත්‍රස්තවාදය සහ අන්තවාදය ගැන අපි සලකා බලනකොට මේ සංශෝධනවලින් පමණක් අපට සෑහීමකට පත් වෙන්න බැහැ. මේ පිළිබඳ අපි විශාල සමාලෝචනයක් කළ යුතුයි. There has to be a comprehensive review of the PTA, considering the present day extremism and terrorism prevailing in the world. ඒ වාගේ සමාලෝචනයක් කරලා ඉදිරියේදී වෙනම පනතක් ගෙන ආ යුතු බවයි මේ අවස්ථාවේදී මම යෝජනා කරන්නේ.

අද බොහෝ මන්ත්‍රීවරුන් කියනවා, මේ PTA එක අවශ්‍ය නැහැ කියලා. There are so many Hon. Members of Parliament who say that there is no need for a PTA. How do you define "terrorism", Hon. Presiding Member? The definition of "terrorism" is, killing or massacring innocents to achieve a political or any other aim. If that is the case, terrorism is no longer something that is regional or local; it is global and transnational. Therefore, there has to be a concise and a concerted effort on the part of the international community to address this menace. ඒ නිසා තමයි 2001 සැප්තැම්බර් 11වන දා USAවලට ඇති වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පස්සේ Security Council එක, ඒ කියන්නේ, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1373 යෝජනාවට අනුව ගෝලීය ත්‍රස්තවාදය මැඩලන්න විවිධ යෝජනා ගෙනාවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලු රටවල් ඒකට සහභාගි වෙලා ඒ ගොල්ලන්ගේ අනුමැතිය ඒ යෝජනාවට ලබා දුන්නා. ඒ යෝජනාවේ තිබෙනවා, ත්‍රස්තවාදීන්ට පමණක් නොවෙයි, ත්‍රස්තවාදීන්ට මූල්‍ය පහසුකම් දෙන අයත් ත්‍රස්තවාදී ගණයට වැටෙනවා කියලා. ඒ නිසා වහාම ඔවුන්ගේ දේපළ සහ මුදල් රාජසන්තක කළ යුතුයි. ඒ වාගේම ත්‍රස්තවාදීන්ට සහාය දුන් අය, ත්‍රස්තවාදීන්ට නවාතැන් පහසුකම් සහ ආහාර පාන දෙන අය වාගේම ඒ සැලසුම්වලට සහාය දෙන අය සහ තහනම් ත්‍රස්තවාදී සංවිධානවල සම්මන්ත්‍රණවලට සහභාගි වන අයට පවා දඬුවම් කිරීමේ ප්‍රතිපාදන 1373 යෝජනාවේ තිබෙනවා.

මේ දේවල් තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අපි අන්තර්ගත කළ යුත්තේ. මොකද, මේවා මුළු ලෝකයම පිළිගන්නා දේවල්. යුරෝපා සංගමය විසින් මේ ළඟදී එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානයේ තහනම දීර්ඝ කළේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ 1373 කියන වගන්තිය ඔවුන් දිගටම උල්ලංඝනය කළ නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එංගලන්තයේ තිබෙනවා "Continuous Detention Law" කියලා එකක්. එයින් කරන්නේ, even beyond the sentence, if a person poses a threat to the country, he can be detained any further. එහෙම තමයි කියන්නේ. ඒ අනුව, නිදහස් - release - වුණාට පසුවත් ඒ පුද්ගලයාගෙන් සමාජයට යම්කිසි අනතුරක් වෙනවාය කියලා හිතෙනවා නම්, ඒ sentence එක තවදුරටත් තියා ගන්න පුළුවන්. ඒ වාගේම ඇමෙරිකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයත් නියෝග කර තිබෙනවා ත්‍රස්තවාදීන්ට විශේෂඥ උපදෙස් දෙන අය, භාණ්ඩ ලබා දෙන අයගේ කටයුතු තහනම් කරලා දමන්න කියලා. මුළු ලෝකයම ත්‍රස්තවාදීන්ට විරුද්ධව මේ වාගේ අණ පනත් සකස් කරද්දී, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතක් එපා කියන්නේ කවුද කියන එක ගැන ඇත්ත වශයෙන්ම අපට පුදුමයට පත් වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මායිම් ගම්මානවල වාගේම පාස්කු ප්‍රහාරයේදී මැරුණේ අහිංසකයන්. ඒ අන්තවාදීන් සහ ත්‍රස්තවාදීන් පාලනය කරන්න නම් මේ වාගේ පනතක් ඇත්ත වශයෙන්ම අවශ්‍ය වෙනවා. ඉදිරියේදී අපි මේ පනත සම්පූර්ණයෙන්ම සමාලෝචනය කරනකොට ප්‍රධාන කරුණු 3ක් තිබිය යුතුයි කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කර සිටිනවා. මේ පනතට සිවිල් වැසියන් ඝාතනය කිරීම අදාළ නැහැ. මොකද, 1979 වෙනකොට ත්‍රස්තවාදීන් විසින් සිවිල් වැසියන් ඝාතනය කළේ නැහැ. ඔවුන් ඝාතනය කළේ දේශපාලන ප්‍රතිවාදීන්, පොලීසියේ සාමාජිකයන්, තොරතුරු සපයන බුද්ධි නිලධාරීන් සහ හමුදාවේ අය.

ඒ නිසා ඒ දවස්වල එවැනි තත්ත්වයක් තිබුණේ නැහැ. නමුත් අපි දන්නවා, ඔවුන් දැන් වෙනකොට මහ පරිමාණයෙන් සමූල ඝාතන කරන බව. අපි දන්නවා, මායිම් ගම්මානවල මිනිසුන් ඝාතනය කළේ කොහොමද, ගෝනවල වාගේ ගම්මානවල මිනිසුන් ඝාතනය කළේ කොහොමද කියලා. ඒ වාගේම පාස්කු ප්‍රහාරයෙන් දෙසිය ගණනක් මැරුණා. ඒ නිසා නිශ්චිත පුද්ගලයන් - specified persons - කියන එකට සිවිල් වැසියන්ගේ ඝාතනත් ඇතුළත් කළ යුතුයි කියන එකයි මෙම සමාලෝචනයේදී අපි කියන්නේ.

ඊළඟට, මේ පනත් කෙටුම්පත තුළ පුනරුත්ථාපනය කිරීම කියන කාරණය ආවරණය වෙලා නැහැ. ඇත්ත වශයෙන්ම සිරභාරයේ සිටින අය එළියට ආවාට පසුව ඒ ගොල්ලන් මුලින් වාගේම සමාජයට යම් කිසි අනතුරක් ඇති කරනවා. ඒ වාගේම තරුණයන්වත් ඒවාට යොමු කරගන්න පුළුවන්. ඒ නිසා අපි ඒ අයව අනිවාර්යයෙන්ම පුනරුත්ථාපනය කළ යුතුයි. නමුත් අද වෙනකොට ඒකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සමක් ගොනු කර තිබෙනවා. එසේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබෙන පෙත්සමට stay order එකක් අරගෙන තිබෙනවා. ඒ නිසා ඒක තාවකාලිකව නවත්වා තිබෙනවා. නමුත්, මම හිතන විධියට මේක අපේ ජාතික නීති පද්ධතියට ඇතුළත් කළ යුතුයි.

තුන්වැනි කාරණය, සයිබර් අපරාධ. අපි දන්නවා, අද බොහෝ ත්‍රස්තයින් සයිබර් අවකාශයේ තමයි ත්‍රස්තවාදී ප්‍රහාර සැලසුම් කරන්නේ; ත්‍රස්තවාදී ප්‍රහාරවලට මිනිසුන්ව යොමු කරන්නේ සහ ඒ ගොල්ලන්ව brainwash කරන්නේ කියලා. ඒ නිසා මෙම පනත් කෙටුම්පතට සයිබර් අපරාධ සම්බන්ධ කාරණයත් අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතුයි කියන එකයි අපි කියන්නේ, comprehensive review එකක් තුළින්.

මේ පනත අවශ්‍ය නැහැ කියලා අද මේ සමහර අය කියනවා. ඇමෙරිකාවේ තිබෙනවා, USA Patriot Act කියලා 2001දී ගෙනාපු පනතක්. ඒකට අනුව නීතිපතිට පුළුවන් ඕනෑ තරම් කාලයක් රඳවුම්කරුවන් තබා ගන්න. ඒ පනතට අනුව වැරදිකරුවා වෙන කෙනාට ජීවිතාන්තය දක්වා දඬුවම් දෙන්න පුළුවන්. ඒ වාගේම එංගලන්තයේ තිබෙනවා Terrorism Act කියලා පනතක්. ඒකට අනුවත් වැරදිකරු වෙන අයට ජීවිතාන්තය දක්වා දඬුවම් ලබා දෙන්න පුළුවන්. ප්‍රංශයේ Code of Criminal Procedure එක තිබෙනවා. එහි තිබෙනවා, "a suspect may be held pre-trial detention after charge up to four years" කියලා. ඒ රටවල් ත්‍රස්තවාදීන් මර්දනය කරන්න, පාලනය කරන්න, deterrents සඳහා පාවිච්චි කර තිබෙන්නේ අන්න ඒ වාගේ ඒවායි. ඉන්දියාවේ Code of Criminal Procedure එක

තිබෙනවා. ඒකට අනුව දෙන්නේ මරණීය දඬුවම. එහිදී මහෙස්ත්‍රාත්වරයාට පුළුවන්, රැඳවුම්කරු දවස් 90ක් තබා ගන්න. ඒ වාගේම විශේෂ අධිකරණයට පුළුවන්, දින 180ක් තබාගන්න. මීට වඩා මම මේ ගැන කථා කරන්නේ නැහැ.

පාස්කු ප්‍රහාරය ගැනත් අද කථා කළා. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී මන්දගාමී ස්වරූපයක් තිබෙන්නේ කියලා අපට චෝදනා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2001 සැප්තැම්බර් 11 වැනි දා ඇමෙරිකාවට එල්ල වුණු ප්‍රහාරයෙන් පසුව ඒ, ඛලීඩ් ෂෙයික් මොහමඩ් කියන ප්‍රධාන මහ මොළකරුවාට විරුද්ධව නඩු දමන්න ඇමෙරිකාවට අවුරුදු 20ක් ගත වුණා. ඒ වාගේම තමයි 2015දී ප්‍රංශයට එල්ල වුණු ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසුව එම ත්‍රස්තවාදීන්ට විරුද්ධව නඩු දමන්න, සැකකරුවන්ට විරුද්ධව නඩු දමන්න අවුරුදු 6ක් ගත වුණා. ඒ වාගේම අපි දන්නවා, රජීව් ගාන්ධි ඝාතනයේදී ඒ සැකකරුවන්ට විරුද්ධව නඩු දමන්න අවුරුදු ගණනක් ගත වුණ බව. දළදා මාළිගාවට එල්ල වුණු ප්‍රහාරයට අදාළ සැකකරුවන්ට නඩු දමන්න අවුරුදු 4ක් හෝ 5ක් ගත වුණා. නමුත් අපි දන්නවා, පාස්කු ප්‍රහාරය සිදු වෙලා අවුරුදු 3ක් යන්නට මත්තෙන් 74 දෙනෙකුට විරුද්ධව මහාධිකරණ 10ක අද වනවිට නඩු පවරා තිබෙන බව. ඒ වාගේම තමයි, මෙම ප්‍රහාරයේ මහ මොළකරු හැටියට අපි හඳුනා ගෙන තිබෙන නවුෆර් මවුලවි ඇතුළු 24 දෙනෙකුට විරුද්ධව කොළඹ මහාධිකරණයේ චෝදනා ගොනු කර තිබෙනවා. චෝදනා 23,200ක් තිබෙනවා. අද වනවිට මහාධිකරණයේ විනිසුරුවරු තුන්දෙනෙක් - trial-at-bar - නිතිපතා, දිනපතා නඩු අහමින් ඉතා ඉක්මනින් වැරදිකරුවන්ට දඬුවම් දීලා ඒ වින්දිතයන්ට සාධාරණයක් කරන්න කටයුතු කරමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දවස් දෙක-තුනකට ඉස්සෙල්ලා INTERPOL ආයතනයේ ප්‍රධානියා මාව හමු වුණා. මේ ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට ඔහු මෙහාට එවා තිබෙනවා, investigation teams දෙකක්. ඕස්ට්‍රේලියාවෙන් investigation team එකක් ආවා. ඇමෙරිකාවේ FBI එකෙන් ආවා. ඒ ගොල්ලන් කියා තිබෙනවා, මේක සහරාන් විසින් කළ, ISIS කියන මතවාදය තිබෙන ත්‍රස්තවාදී ප්‍රහාරයක් කියලා. ඒ නිසා මේකට දේශපාලන කුමන්ත්‍රණයක් කියා කවුරු හෝ කියනවා නම්, ඇත්ත වශයෙන්ම ඒක හාස්‍යයට කරුණක් කියලා තමයි මම කියන්නේ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ස්තුතියි, ගරු ඇමතිතුමා. විත්තිකරුවන් නිර්වචනය කිරීම, පුනරුත්ථාපනය හා cybercrime වැනි විශේෂ කාරණා කිහිපයක් ඔබතුමා සඳහන් කිරීම වැදගත් වෙනවා.

அடுத்ததாக, கௌரவ ஜீ.ஜீ. பொன்னம்பலம் அவர்கள்! உங்களுக்கு 9 நிமிடங்கள் உண்டு.

[2.51 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, I would like to start my intervention by referring to the speech made by Hon. Minister (Prof.) G.L. Peiris, where he made quite a passionate plea, pointing out the fact that these Amendments are proposed to improve the present Act and explaining particular provisions in the Bill such as day-to -day trials, that the Magistrate can visit detainees in prisons and detention centres and if the Magistrate so feels that there are signs of torture, then, a JMO can be asked to examine the detainee and the various stipulations provided thereafter.

With regard to those two Amendments that he pointed out, trying to make out that those are fairly significant improvements which would, hopefully, lead to a significant shortening of the detention period and also, in some way, deter torture, I would like to say the whole thing lies on whether those Amendments are, in fact, practical. There are provisions already, in the law, in the Constitution. For example, if you take fundamental rights petitions, you have to bring them within one month and then, if I am not mistaken, Hon. Minister, FR matters have to be concluded under the Constitution within a year, but those would not happen. We all know that unless it is an important matter which is in the public eye and has caught the attention of the entire country, these matters get dragged on, not for a year, but for years. If we take day-to-day matters, there have even been trials-at-bar, which ideally should sit day-to-day, but those have shown to be not practical and instead, are almost always observed in the breach. Already, there are provisions for the Magistrates to visit detainees in police stations, but the fact of the matter is that they just do not do that. In reality, they do not have time to do it and even if they do visit them, let us assume that they do, then, we, once again, have to rely on whether our current system is going to be fair, whether our current system has not been corrupted to such an extent that there would not be discrimination.

Sir, the reality is, when Sri Lanka was investigated by the Human Rights Council and the OISL Report came out, the then High Commissioner for Human Rights, Prince Zeid - in fact, he presented the Report to the Human Rights Commission - had a press conference and made an observation. In recommending a hybrid accountability system for Sri Lanka and rejecting a domestic investigatory mechanism, a domestic criminal justice system, he said that because of the ethnic conflict and because law and order and the judicial mechanism in this country have been so corrupted - what he meant by “corrupted” is along ethnic lines, that there are biases and discrimination so embedded in the whole system - an internal investigation or an internal judicial justice process was not something that is going to be credible. And, that is what we are left with today.

So many Members of the Opposition also spoke. When you speak in terms of national security, what does “national” mean? Does “national” mean that it is only for the security of the Sinhalese people? Does “national” mean that it is only for a certain section or does it, in fact, mean for everybody? If it means for everybody, Sir, then surely it cannot be determined purely on majoritarian terms. Just because a majority of the Members of this House wants something, that surely cannot be “national”. If “national” means that there are several identities within that polity, as we say that Sri Lanka is a multinational country, that there are two or more nations in this

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

country, then each of those people's views must also be accepted. So, fundamentally, the question here is that you have violence against the State; no one denies that. You have violence against the State because this State excludes and consistently provides for only a section and rejects the other; there is no inclusiveness.

When we talk of mandates, the North and the East have repeatedly given mandates regarding how they want to see this country. Those mandates have not called for cessation; those mandates have not called for taking up arms. On the contrary, those mandates have consistently asked not to take up arms before. The leaders who have come to this House now and previously have asked the Tamil people to reject not only separation, but also violence and they have asked Members opposite and members from the Sinhala community to include their views also and make this inclusive. That is where you failed. You consistently failed and you are failing even today! So, you keep us out no matter how many times our people have given resounding mandates. I can tell you that the mandates that have been given by the Tamil people in the North and the East with regard to a plurinational country that we want to see, with regard to a federal country that we want to see are far greater and far stronger than the mandate that this present Government has.

When Members who are sitting here, representing such people hit their heads against a brick wall, when members on the ground, our party and our constituency on the ground, consistently get disenfranchised, when their religious places are being stolen from them, when their lands are being stolen from them, when their existence is being denied to them and when the lands they ploughed for decades and decades before the war - because of the war, they got displaced and when they returned, all of a sudden, they were told that those lands are a forest, but people from other ethnicities who do not belong to that area can, in fact, destroy the forest and plough those lands now - are stolen from them, what do you expect them to do? But, that is what is happening even now. When the Hon. Prime Minister visited Jaffna, he had a lot of opposition. That opposition, today, is non-violent; that opposition, today, is trying to get your attention. Despite the fact that they have been destroyed and despite the fact that their own relatives and they have been put behind bars under the PTA, even today, again, they are voicing their opposition. They are voicing it, but in a democratic and a non-violent way. But, how long can you expect them to keep voicing their opposition and hitting their heads on a brick wall?

Sri Lanka has to transform. If Sri Lanka does not transform, then, Sri Lanka will never recover. Today, there is a Tamil diaspora. That diaspora lives, by no stretch of the imagination, in the richest countries in the world. That diaspora together earns more than the Sri Lankan State does. If that diaspora decided to contribute in a constructive way, today, Sri Lanka would not be in this economic mess, but you would rather not have those people coming and contributing in a constructive way. Why? Because of your racist vision of what Sri Lanka ought to be. If Sri Lanka can be plural, if Sri Lanka can, in fact, say "Hey, look, we celebrate our differences!", if you can say that when you go to the North and the East and see people talk differently and behave differently, that it is something good for this country, if you can say, no matter how different the parts of the country are, that we celebrate the difference and we are also united, then, things can change.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member. Please wind up.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Sir.

I am telling the Sinhalese people that you have been lied to consistently, you have been lied to about who the Tamils are and you have been lied to with regard to your own leaders' intentions. Today, they have made this country bankrupt, not because of anything else but because of their greed.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
I am sorry, Hon. Member. I have to stop you now.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
So, for God's sake, open your eyes and transform Sri Lanka to make it inclusive. That is the only way forward.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you may be speaking something very meaningful. If you get more time from the camp of yours, I can allow you. Thank you.

அடுத்ததாக, மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன் அவர்கள்! உங்களுக்கு 7 நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.03]

**ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා**
(மாண்புமிகு சிவநேசதுரை சந்திரகாந்தன்)
(The Hon. Sivanesathurai Santhirakanthan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற பயங்கரவாதத் தடுப்பு (தற்காலிக ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் மீதான விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையிட்டு நான் மகிழ்ச்சியடைகிறேன். குறிப்பாக, நான் பிரதிநிதித்துவப் படுத்தும் மாவட்டத்திலும் இன்று மக்கள் அத்தியாவசியப் பொருட்களுக்குத் திண்டாடுகிறார்கள். முக்கியமாக, அது ஒரு

விவசாய மாவட்டம் என்ற அடிப்படையிலே, எங்களுடைய விவசாயிகளுக்கு இன்னமும் உரம் வழங்கப்படவில்லை. இன்று கிராமங்களில் இரசாயன உரம் அதிகூடிய விலைக்கு விற்கப்படுகின்றது. குறிப்பாக யூரியா ஒரு மூடை 25,000 ரூபாய்க்கு விற்கப்படுகின்றது. அதிருப்தியோடு இருக்கின்ற சூழலிலே நாங்கள் இந்தச் சட்டமூலம் பற்றிப் பேசவேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. அந்த அடிப்படையில், என்னுடைய நிலைப்பாட்டை இங்கு தெளிவாக முன்வைக்க விரும்புகின்றேன். முதலில் இதனுடைய பின்னணியைப் பற்றிப் பேசலாமென்று எண்ணுகிறேன்.

1977ஆம் ஆண்டு 2/3 பெரும்பான்மைப் பலத்துடன் ஆட்சிக்கு வந்த ஐக்கிய தேசியக் கட்சியினாலேயே இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் கொண்டுவரப்பட்டது. 1979ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட இச்சட்டத்தில் இந்நாட்டின் ஒற்றுமை, இறையாண்மை பற்றிப் பிரஸ்தாபிக்கப் பட்டிருந் தாலும்கூட, இந்த நாட்டில் மனித உரிமை மீறல்களும் மக்களின் சுதந்திரத்திற்கு எதிரான விடயங்களும் நடைபெறு வதற்கு அது காரணமாக அமைந்திருந்தது. இச்சட்டத்தினால் யுத்த காலத்தில் ஆயிரக்கணக்கான அப்பாவித் தமிழ் இளைஞர்கள் பல்லாண்டுகால சிறைக்கொடுமைகளை அனுபவிக்க நேர்ந்தது. அதிலும் குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்ந்த பலர் இச்சட்டத்தைப் பயன்படுத்தித் தான் இல்லாதொழிக்கப்பட்டார்கள். இந்த பயங்கரவாதத் தடுப்புச் சட்டமானது, பல்வேறுவிதமான அரசியல் பழிவாங்கல் களுக்கும் மனித உரிமை மீறல்களுக்கும் காரணமாக அமைந்திருக்கின்றது.

அதேபோல, இச்சட்டத்தைப் பயன்படுத்தித்தான் மக்கள் பிரதிநிதியாகிய என்னை கடந்த காலத்தில் 'நல்லாட்சி' என்று சொல்லப்பட்ட அரசாங்கமும் அதன் கூட்டாளிகளும் ஐந்தாண்டு காலத்துக்கும் மேலாகத் தடுப்புக் காவலில் வைத்தார்கள். இவை அனைத்தையும் கவனத்திற்கொண்டு என்னுடைய கருத்தை இங்கே பதிவுசெய்கின்றேன். பயங்கரவாதத் தடுப்புச் சட்டம் கொண்டுள்ள ஜனநாயக விழுமியங்களுக்கு எதிரான ஆபத்தான அம்சங்களையோ, "யுத்தம் முடிந்துவிட்டது; ஆகையால், இச்சட்டத்தை நீடிக்க வேண்டாம்" என்கின்ற வாதத்தையோ நான் முற்றாகப் புறந்தள்ளவில்லை. ஆனாலும், புதியதொரு "வஹாபிஸ" பயங்கரவாதம் இந்த மண்ணிலே முளைகொண்டுள்ளது. அது கிழக்கிலங்கையிலே காலூன்ற நினைக்கும் ஆபத்தை நாம் எதிர்கொள்ள நிர்ப்பந்திக்கப்பட்டுள்ளோம். சில வருடங்களுக்கு முன்னர் இடம்பெற்ற 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் கொடுமைகளை நாம் இலகுவில் மறந்துவிட முடியாது. அன்று பலிகொள்ளப்பட்ட மக்களுக்கு நீதி வழங்கப்பட வேண்டும். குறிப்பாக, நான் பிரதிநிதித்துவப்படுத்தும் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள சீயோன் தேவாலயத்தில் இரத்தமும் சதையுமாக மரணித்த எங்கள் குழந்தைகளுக்கு ஏற்பட்ட அவலம் இனியொருமுறை இடம்பெற்றுவிடக்கூடாது. தேசிய பாதுகாப்பென்று வருகின்றபோது, இந்தச் சட்டத்தின் தேவை முற்றாக இல்லாது போய்விடவில்லை என்பதை நாம் கவனத்திற்கொள்ளவேண்டி இருக்கின்றது.

எனவே, இச்சட்டத்திலுள்ள மனித உரிமை மீறல்களுக்கு வாய்ப்பளிக்கக்கூடிய ஆபத்தான குறைபாடுகளை நிவர்த்தி செய்வது அவசியமாகும். அந்தவகையில், பயங்கரவாதத் தடைச் சட்டத்தின் பெயரிலான தடுப்புக்காவல் உத்தரவு, கட்டுப்பாட்டு உத்தரவு, நீதித்துறை மீளாய்வு உத்தரவுகளை வெளிப்படையாக அங்கீகரித்தல் தொடர்பான பிரிவுகளில் திருத்தங்களை மேற்கொள்வது அவசியமாகின்றது. அத்துடன், நீண்டகாலம் தடுப்புக் காவலில் வைக்கப்படுவதைத் தவிர்ப்பதற்காக குற்றம் சாட்டப்பட்டவர்கள் மீதான வழக்குகளை விரைவாகத் தீர்த்தல், சுதந்திரத்திற்கு இடையூறு விளைவிக்கும் பிரிவுகளை இரத்துச் செய்தல், நீதவான்கள் மற்றும் நீதித்துறை மருத்துவ அதிகாரிகளை அணுகுவதற்கான விதிகளை வெளிப்படுத்துதல் மற்றும் அறிமுகப்படுத்துதல், தடுப்புக்காவலிலுள்ள காலத்தில் கைதிகளுக்கு இடம்பெறும் துஷ்பிரயோகங்கள் மற்றும் சித்திரவதைகளைத் தடுத்தல், குடும்பத்தினருடன் தொடர்புகொள்வதற்கான உரிமை, நீண்டகால கைதிகளுக்குப் பிணை வழங்குதல் மற்றும் வழக்குகளை நாளாந்தம் விசாரணை செய்தல் போன்ற வற்றைத் திருத்தங்களில் உள்ளடக்குவது அவசியமாகின்றது. அதேபோல, இச்சட்டத்தின்கீழ் தொடரப்பட்ட வழக்குகளின் விசாரணைகளை விரைவுபடுத்தி, அவற்றை முடிக்கவேண்டும். இந்தச் சட்டம் இன்னும் சில காலத்துக்கு நீடிக்கப்படுவதை என்னால் ஆட்சேபிக்க முடியாது என்று கூறிக்கொள்கின்றேன்.

எதிர்க்கட்சி உறுப்பினர்கள் இங்கு பல விடயங்களைக் கோடிட்டுக் காட்டியிருந்தாலும், இந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் கொண்டுவரப்பட்ட காலப்பகுதியில் அதனைப் பயன்படுத்திய விதத்திற்கும் தற்காலத்தில் அதனைப் பயன்படுத்துகின்ற விதத்திற்கும் இடையில் பல வேறுபாடுகள் இருக்கின்றன. இந்த உயரிய சபையிலே அந்த இரண்டு விதமாகவும் பேசுவதற்கான வாய்ப்புக்கள் எனக்கு இருக் கின்றன. ஏனென்றால், நானும் 1977ஆம் ஆண்டில் ஆட்சிபீடம் ஏறிய ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய ஆட்சிக் காலத்திலும் தந்தை செல்வா அவர்களுடைய காலத்திலும் கொண்டுவரப்பட்ட தீர்மானங்களின் ஊடாக பாதிக்கப்பட்ட ஒருவன். குறிப்பாக, தமிழர்கள் தங்களுக்கு விடுதலை வேண்டும் என்று போராடியபொழுது, நானும் அந்தப் போராட்டத்தில் இணைந்திருந்தேன். அதேபோன்று, 1979ஆம் ஆண்டின் 48ஆம் இலக்க, பயங்கரவாதத் தடுப்பு (தற்காலிக ஏற்பாடுகள்) சட்டத்தின்கீழ் நான் கைதுசெய்யப்பட்டு, 5 வருடங்களுக்கும் மேலாக தண்டனை அனுபவித்தேன். இவ்வாறு நான் இரண்டு விதமாகவும் நேரடியாகப் பாதிக்கப்பட்டிருக்கிறேன்; அதன் விளைவுகளை அனுபவித் திருக்கிறேன். ஆகையால், தற்போதைய சூழலிலே நீடித்த அமைதிக்கு பயங்கரவாதத் தடைச் சட்டத்தில் திருத்தம் அவசியம் என்பதை உணர்ந்ததன் அடிப்படையிலேதான் நான் இங்கு இந்தக் கருத்துக்களை முன்வைத்தேன் எனக் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.08]

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

අද, ඉතා වැදගත් පනතකට සංශෝධන ගෙන එනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ 1979 සිට තාවකාලික විධිවිධාන පනතක් වශයෙන් බල පැවැත්වෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ගෙන එන සංශෝධන පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ මුලින්ම මම මෙම උත්තරීතර සභාවට විශේෂ කාරණයක් මතක් කර දෙන්න කැමැතියි. මා ද ඇතුළුව මගේ පවුල - ගාමිණී දිසානායක මැතිතුමාගේ පවුලේ සියලුදෙනා- ත්‍රස්තවාදය නිසා බැට කෑ පිරිසක්. එවන් කෙනෙකු හැටියටත්, මේ රටේ ඉන්න පුරවැසියකු හැටියටත් මම මේ කාරණය කියනවා.

[ගරු මයන්ත දිසානායක මහතා]

මට මේ වෙලාවේ මතක් වෙනවා මගේ මව වන ශ්‍රීමා දිසානායක මැතිනිය. මගේ පියා වන ගාමිණී දිසානායක මැතිතුමා ගැන අප මතක් කරන කොට රෝගාතුරව සිටියදීත් -අවසාන කාලයේදී පවා - හැඬූ කඳුළින් තමයි එතුමිය සිටියේ. මම මේ වෙලාවේ ඒ ගැනත් මතක් කරනවා. හැබැයි ඒ පනත සම්බන්ධයෙන් අප දැන් ඉන්න ස්ථාවරය සම්පූර්ණයෙන් වෙනස්. මක් නිසාද යත්, "වෛරයෙන් වෛරය නොසන්සිඳේ" කියන එක බුද්ධාගම අදහන අය හැටියට - බෞද්ධයන් හැටියට- අප පිළිගන්නවා නම්, Prevention of Terrorism Act එක සම්පූර්ණයෙන් අහෝසි කරන්න ඕනෑ කියන තැන අපි ඉන්න ඕනෑ. අප එතැන ඉන්න තවත් හේතුවක් තිබෙනවා. දරදඬු ආණ්ඩුවක් තිබෙනවා නම්, ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුවක් තිබෙනවා නම්, මේ රටේ සිටින දේශපාලනඥයන්ට වෙන්න පුළුවන්, මාධ්‍යවේදීන්ට වෙන්න පුළුවන්, වෙනත් කෙනෙකුට වෙන්න පුළුවන් ඒ පනත පාවිච්චි කරලා -ඒ පනත මඟින්- ගහන්න පුළුවන්, ඒ ගොල්ලන්ගෙන් දේශපාලනික වශයෙන් පළිගන්න පුළුවන් කියන තැන ඉඳන් තමයි අප මේ සාකච්ඡාව ආරම්භ කරන්නේ. අප කියන්නේ ඒ පනත සම්පූර්ණයෙන් අහෝසි කරන්න ඕනෑ, සම්පූර්ණයෙන් වෙනස් කරන්න ඕනෑ කියලායි.

මේ රටේ ඉතිහාසය දිහා බැලුවත්, ජාත්‍යන්තර තත්ත්වය දෙස බැලුවත් තවමත් අපට කනගාටුවෙන් වුණත් සිහිපත් වෙනවා, ත්‍රස්තවාදය නිසා සිදු වූ මිනිස් ඝාතන ගැන. රජීව් ගාන්ධි මැතිතුමා ඝාතනය වුණා, ත්‍රස්තවාදය නිසා. ගාමිණී දිසානායක මැතිතුමා ඝාතනය වුණා, ත්‍රස්තවාදය නිසා. රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඝාතනය වුණා, ත්‍රස්තවාදය නිසා. මේ රටේ හිටපු ශ්‍රේෂ්ඨ නායකයන් වන ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා, ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා, විජය විමලරත්න සෙන්පතිතුමා, ඩෙන්සිල් කොබ්බෑකඩුව මැතිතුමා ඝාතනය වුණා, ත්‍රස්තවාදය නිසා. ඒ වාගේම, ත්‍රස්තවාදී ප්‍රහාරවලින් අනුනවයෙන් බේරුණු දේශපාලන නායකයෝ බොහෝදෙනෙකුත් -පක්ෂ භේදයකින් තොරව- මේ පාර්ලිමේන්තුව තුළ ඉන්නවා. ත්‍රස්තවාදී ප්‍රහාරවලින් එතුමන්ලා අනුනවයෙන් බේරුණේ. ඒ වාගේම, රාජිත සේනාරත්න මැතිතුමාත් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. බෝම්බය පිපිරිලා මගේ පියා ඝාතනය වූ අවස්ථාවේ රාජිත සේනාරත්න මැතිතුමා ඒ වේදිකාවේ සිටියා. ඒ වාගේමයි, කරුණාසේන කොඩිතුවක්කු මැතිතුමාත්. එතුමන්ලා අද ජීවතුන් අතර ඉන්නවා. සරත් ෆොන්සේකා මැතිතුමාගේ කම්සය ගලවා බැලුවාම, එතුමා යුද්ධ හමුදාපති හැටියට සිටියදී ත්‍රස්තවාදීන් නිසා බැට කෑ ආකාරය අපට දැක ගන්න පුළුවන්. ත්‍රස්තවාදය කියන එක බොහොම දරුණුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, අපට ඔය ලැයිස්තුවට එකතු කරන්න වෙනවා, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගේ නමත්. එතුමාත් යාපනයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් බේරිලා අප අතර තවමත් ජීවත් වෙමින් තම දායකත්වය රටට ලබා දෙන බව මතක් කළ යුතුයි.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ඒ වාගේ නායකයෝ බොහෝදෙනෙක් පක්ෂ භේදයෙන් තොරව ත්‍රස්තවාදය නිසා බැට කාලා තිබෙනවා. අප තවමත් ඒ මතකය තියාගෙන ඉන්නවා නම්, ඒ වෛරය හිතේ තියාගෙන ඉන්නවා නම්, ත්‍රස්තවාදයට අබමල් රේණුවක තරමින්වත් ගැච්චුව කෙනෙකුට පවා එක්කෝ මරණීය දණ්ඩනය නියම කරන්න ඕනෑ, එහෙම නැත්නම් ජීවිතාන්තය දක්වා හිර ගෙට දමන්න ඕනෑ කියන තැන අපි අනිවාර්යයෙන් ඉන්න ඕනෑ. As we get older and more mature, we must get into a position that we practise forgiveness. මා ඉහතින් පැවසූ පරිදි, "වෛරයෙන් වෛරය නොසන්සිඳේ" කියන තැන ඉඳන් තමයි අපි මේ සාකච්ඡාව - debate එක- ආරම්භ කරන්න ඕනෑ.

At the Ministerial Consultative Committee Meeting chaired by the Hon. (Prof.) G.L. Peiris also, we raised a certain number of points and one of the most contentious points of this amendment is that 18 months of detention has only been reduced to 12 months, but what we ask for is a one month period so as not to let someone who comes into power abuses this Act. මෙය පාවිච්චි කරලා දේශපාලන අධිකාරියෙන්, දේශපාලන නායකයන්ගෙන්, ඒ වාගේම මාධ්‍යවලින් පවා පළිගන්න පුළුවන් බව තමයි විපක්ෂය වෙනුවෙන් මම මේ අවස්ථාවේ විශේෂයෙන් සඳහන් කරන්නේ.

ඒ වාගේම මා කිව යුතුයි, confessions පිළිබඳ කාරණය ගැනත්. පනත අනුව, confessions ගත යුතු ආකාරය සහ confessions අරගෙන පාවිච්චි කරන්නේ කොහොමද කියන එක පිළිබඳත් දැන් තර්කයක් ගොඩ නැඟිලා තිබෙනවා. ඒ වාගේම detention centres පිළිබඳත් යම්කිසි තර්කයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න ඉස්සෙල්ලා පුළුවන් නම් ඒවාට අදාළ සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරන්න. එතකොට පක්ෂ භේදයකින් තොරව මේ පනත් කෙටුම්පත සම්මත කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. එහෙම කළේ නැත්නම් අනිවාර්යයෙන් ඡන්දයකට යන්න වෙයි.

අද ගජේන්තිරකුමාර් මන්ත්‍රීතුමා විශේෂයෙන් කරුණු කිහිපයක් සඳහන් කළා. මම සාමාන්‍යයෙන් එතුමාගේ කථාවලට එකඟ වෙන්නේ නැහැ. මම මූලාසනයේ සිටි දවසක එතුමා කථා කරන කොට "වෙලාව ඉවරයි" කියලා එතුමාගේ කථාව අවසන් කරන්න මට ලෙහෙසියෙන්ම හැකියාව තිබුණා. ඒත් මම එතුමාගේ කථාව එහෙම නතර කළේ නැහැ. මක්නිසාද, එතුමාගේ කථා කිරීමේ අයිතිය, පාර්ලිමේන්තුවේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය රැක ගනිමින් තමයි මම එදා මූලාසනයේ කටයුතු කළේ. එතුමා ඒ සම්බන්ධයෙන් මට ස්තුති කරලා ලිපියකුත් එවා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. මේ රටේ ඉතිහාසය දෙස, විශේෂයෙන් නිදහසින් පසු ගත වූ අවුරුදු 74 දෙස බැලුවාම අපට පෙනෙන දෙයක් තිබෙනවා. 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ගෙනාවට පසුව මේ වන කල් ත්‍රස්තවාදය මේ රටෙන් අතුගා දමන්න ඇත්තෙන්ම අපට පුළුවන් වුණාද? මා තමුන්නාන්සේලාගෙන් අහන්නේ එයයි. අවුරුදු 42ක් තිස්සේ ඒ පනත ක්‍රියාත්මක වුණා. හැබැයි, මේ රටේ ත්‍රස්තවාදය අතුගා දමන්න අපට පුළුවන් වුණාද? ඒ පනත තිබුණාට එය ත්‍රස්තවාදය මර්දනය කරන්න අපේ හමුදාවට, අපේ පොලීසියට මොන ආකාරයටද ශක්තියක් වුණේ කියා අපි ප්‍රශ්න කරන්න ඕනෑ. දැන් ලෝකය ගමන් කරන්නේ වෙනස් ආකාරයකට.

The world is completely different today. It is different even from five years ago; it is different from the time we wanted to bring in the Counter Terrorism Bill up until today. Things have dramatically changed for the last two-and-a-half years. People want their rights.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over. Please wind up.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
People are fighting for their rights; people do want to safeguard their democratic values. Therefore, I urge the Government to look at the history of this country. Hon. Minister, you are a Minister of integrity. So, I would like to conclude my speech asking you and appealing to you to make certain changes. I think everyone who is here is asking for four fundamental changes to this Bill. If the Hon. Minister and the Government are ready to accept those changes, I think we can move forward.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much for your contribution.

**ගරු මයන්ත දිසානායක මහතා**
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
Sir, please give me one final second. What we really need is a completely different Bill, Sir. So, I hope you can do that in the future.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. அடுத்து, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள்! உங்களுக்கு 8 நிமிடங்கள் உண்டு. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි.

අද ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත ගැන තමයි අපි කථා කරන්නේ. මේ වෙලාවේ, රටට වැදගත් කාරණයක් ගැන මට කියන්න තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට ඉදිරිපත් කළා, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තා පොත. බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා දන්වා තිබෙනවා, "වාර විභාග කල් දමන්න වෙනවා. ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන්න කඩදාසි නැහැ" කියලා. නමුත් මේ අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා පොත දැක්කාම මට හිතෙනවා, මෙය මුද්‍රණය කර තිබෙන්නේ art papersවල කියලා. අඩුම ගණනේ මේ එක පොතක් මුද්‍රණය කරන්න රුපියල් 5,000ක් විතර වැය කරලා ඇති. Emboss කරලාත් තිබෙනවා. ජනාධිපතිතුමා කියනවා cost-cutting කරන්න කියලා; කැප කිරීම් කරන්න කියලා. එහෙම කිව්වත්, අමාත්‍යාංශවල වාර්ෂික වාර්තා තවම මුද්‍රණය වෙන්නේ ඉතාම අධික මුදලට ලබා ගන්නා කඩදාසිවල, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මම අද දවසේ මාතෘකාවට එන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රජය අද ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට සංශෝධන කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා.

මේ පනත් කෙටුම්පත දිහා බැලුවාම අපට පෙනෙන දෙයක් තමයි, මේ සංශෝධන ටිකක් ඇස් බැන්දුමක් වාගෙයි කියන එක. ජාත්‍යන්තර වශයෙන් අද ආණ්ඩුවට එල්ල වෙලා තිබෙන මානව හිමිකම් චෝදනා සහ යුරෝපා කවුන්සලය මඟින් එල්ල වෙලා තිබෙන චෝදනා වැනි දේවල් මේ සංශෝධන ගෙනෙන්න මූලිකව හේතු වෙලා තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් යම්කිසි ආකාරයක සහනයක් ලබා ගන්නා චේතනාව මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිටුපස තිබෙනවා. ඒක වඩාත්ම පැහැදිලි වෙන කාරණය මේකයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත අයත් වෙන්නේ අපේ අධිකරණ ඇමතිතුමාගේ විෂයට. නමුත්, අධිකරණ ඇමතිතුමා යටතේ තිබෙන විෂයට අයත් පනතකට සංශෝධන ගෙනෙනවා, විදේශ ඇමතිතුමා. ඒක තමයි මම කිව්වේ, මේක ජාත්‍යන්තරය සනසන්න ගෙනෙන සංශෝධනයක් කියලා. ඇත්තටම මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, ඒ වාගේම ඒ මූලික අයිතිවාසිකම්වලට හානියක් සිදු වෙනවා නම් ඒ හානිය නැවැත්වීමේ අදහසකින් නොවෙයි මේ පනත ගෙනෙන්නේ. මොකද, අධිකරණ ඇමතිතුමාගේ විෂයට අයත් පනතකට විදේශ ඇමතිතුමා සංශෝධන ඉදිරිපත් කරනවා. ඒකෙන්ම පෙනෙනවා ඔබතුමන්ලා මේ පණිවුඩය දෙන්නේ ජාත්‍යන්තරයට බව. ජාත්‍යන්තරයට කියනවා, අපි මේක වෙනස් කරන්න ලැහැස්තියි, අපි යම් යම් සංශෝධන ගෙනෙනවා කියලා. ඒ අනුව, ජාත්‍යන්තරයෙන් එල්ල වෙන පීඩනය නවත්වා ගන්න කරන දෙයක් හැටියට තමයි අපට මූලිකව මෙය පෙනෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධන තුළින් මේ පනතේ හරය වෙනස් වෙලා නැහැ. ත්‍රස්තවාදී කටයුත්තක් සම්බන්ධව කවුරු හරි ගැන සැකයක් ඇති වෙනවා නම්, එම සැකය මත පදනම් වෙලා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ ඔහුව අත්අඩංගුවට ගන්න පුළුවන්. කිසිදු ආකාරයක පරීක්ෂණයක් කරන්න ඕනෑ නැහැ; විමර්ශනයක් කරන්න ඕනෑ නැහැ. ඇමතිවරයාට සැකයක් තිබෙනවා නම් ඒ ඕනෑම පුද්ගලයකු අත්අඩංගුවට අරගෙන මාස 18ක් රැඳවුම් භාරයේ තබාගන්න මේ පනත යටතේ හැකියාව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් පෙනෙන දේ තමයි ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ මූලික හරය වෙනස් වෙලා නැහැ කියන එක. ඒ හරය එහෙමම මේකේ තිබෙනවා. කෙනෙකු අත්අඩංගුවට අරගෙන මාස 18ක් යනතුරු නිවාස අඩස්සියේ තියා ගන්න පුළුවන්. කෙනෙකු නිවාස අඩස්සියේ තියා ගන්න පුළුවන් ඒ හැකියාව මේ සංශෝධන හරහා ඉවත් වෙලා නැහැ. කවුරු හරි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මේ ආණ්ඩුවට හිසරදයක් කියලා හිතෙනවා නම්, ත්‍රස්තවාදී කටයුතුවලට සැක කරනවා කියලා එතුමාව නිවාස අඩස්සියේ තියන්න පුළුවන්. අපි දන්නවා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ සිරිසේන කුරේ මැතිතුමා ඒ විධියට නිවාස අඩස්සියේ තබා ගත්තා; යම්කිසි කාල වකවානුවක් නිවාස අඩස්සියේ තබා ගත්තා. ඒ කාරණා මේ සංශෝධන පනත් කෙටුම්පත හරහාත් අයින් වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි රඳවා තබා ගැනීම ගැන මහෙස්ත්‍රාත්වරයාට දැනුම් දෙන්න ඕනෑ කියන

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කාරණය. ඒක හොඳයි. ඒ දැනුම් දෙන ගමන්ම මහෙස්ත්‍රාත්වරයාට ඇවිල්ලා ඒ සැකකාර පුද්ගලයා පරීක්ෂා කරන්න පුළුවන්. සැකකරුට වධ හිංසා කරලා තිබෙනවා නම් ප්‍රතිකාර ලබා දෙන්න කියලා නියෝග කරන්න පුළුවන්. ඒ වධ හිංසා කළ පුද්ගලයාට විරුද්ධව නීතිමය කටයුතු කරන්න කියලා නීතිපතිවරයාට දන්වන්න පුළුවන්. නමුත් මහෙස්ත්‍රාත්වරයාට බැහැ, ඒ පුද්ගලයා රඳවාගෙන තිබෙන ස්ථානය මාරු කරන්න. ඒ බලය ලබා දීලා නැහැ. ඉතින් මොන සැක කටයුතු පුද්ගලයා ද- *[බාධා කිරීමක්]* මොකක්ද, ගරු ඇමතිතුමා?

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
මහෙස්ත්‍රාත්වරයාට ඒ බලය පවරමින් අපි සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා කිව්වා ඒ බලය පවරනවා කියලා. ඒක හොඳ දෙයක්. ඒ බලය මහෙස්ත්‍රාත්වරයාට පවරන්න ඕනෑ. විශේෂයෙන්ම එතැනදී ඒ පුද්ගලයාට වධ හිංසා පමුණුවා තිබෙනවා නම් ඒ පුද්ගලයා එතැනින් මාරු කරන්න බලය ලබා දීම ඉතාම හොඳ දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අත්අඩංගුවට ගන්නා පුද්ගලයන් පොලීසිවල රඳවා ගන්නේ නැහැ. මේ අය ඇමතිවරයාට ඕනෑ තැනකට යවන්න පුළුවන්. ඒ පුද්ගලයා අරගෙන ගිහින් තමන් කැමති තැනක තියා ගන්න ඇමතිවරයාට පුළුවන්. යාපනයට ගිහින් තියා ගන්න පුළුවන්; තංගල්ලට ගිහින් තියා ගන්න පුළුවන්; මඩකළපුවට ගිහින් තියා ගන්න පුළුවන්. ඔහු රඳවා තබන්න නියමිත ස්ථානයක් නැහැ. මොකද, ඒ පුද්ගලයාව තමන්ට ඕනෑ තැනකට මාරු කරන්න ඇමතිවරයාට බලය තිබෙනවා. ඒකත් ප්‍රධාන ගැටලුවක්. මේක ඒ පුද්ගලයා මානසිකව වට්ටන දෙයක්; ඒ පවුලේ උදවිය මානසිකව වට්ටන තත්ත්වයක්. මොකද, ඒ පුද්ගලයා මාරු කරන්න ඇමතිවරයාට අසීමිත බලතල තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි වැදගත්ම දේ. අත්අඩංගුවට ගත් සැකකාරයෙක් කරන පාපොච්චාරණයකදී කාගේ හෝ නමක් සඳහන් කරනවා නම්, ඒ පුද්ගලයාත් අත්අඩංගුවට අරගෙන රඳවා තබා ගන්නත් පුළුවන්. ගරු ඇමතිතුමනි, කවුරු හරි පුද්ගලයෙක් අත්අඩංගුවට ගත්තාම ඔහු පොපොච්චාරණය කළා නම් ඒ ත්‍රස්තවාදී කටයුත්තට ඔබතුමාත් ඔහුට උදව් කළා කියලා, ඔබතුමාත් අල්ලාගෙන ගිහින් මාස 12කට රඳවා ගැනීමේ නියෝගය ගහන්න පුළුවන්. ඒ කාරණයත් මේ සංශෝධනවලදී වෙනස් කරලා නැහැ. ඒ කාරණය උඩ තමයි හිජාස් හිස්බුල්ලා අත්අඩංගුවට ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිජාස් හිස්බුල්ලා අත්අඩංගුවට ගන්න වෙලාවේ, ඒ බව මට ආරංචි වුණාම මම ඔහුගේ නිවසට ගියා. ඔහු මගේ ළඟම මිතුරෙක්.

එදා CID එකෙන් ඇවිල්ලා හිටියා. මම CID එකේ නිලධාරින්ගෙන් ඇහුවා, ඇයි හිජාස් අත් අඩංගුවට ගන්නේ කියලා. "මන්ත්‍රීතුමා, අපි මෙතුමා කට උත්තරයක් ගන්න එක්ක යන්නේ" කියලා කිව්වා. කට උත්තරය අරගෙන එදාම එවනවා කියලාත් කිව්වා. නමුත් අපි දන්නවා, එතුමා අරගෙන ගිහිල්ලා මාස 18කට ආසන්න කාලයක් රඳවාගෙන සිටි බව. හැබැයි, එතුමා රඳවාගෙන ඉඳලා කිසි දෙයක් සොයා ගත්තේ නැහැ. අන්තිමට මොකක්ද කළේ? අත් අඩංගුවට ගත්ත අර කවියාට, අහ්නාෆ් ජසීම් කියන පුද්ගලයාට අපරාධ විමර්ශන කොට්ඨාසයේ, ත්‍රස්ත විරෝධී කොට්ඨාසයේ නිලධාරින් බලපෑම් කළා, හිජාස් හිස්බුල්ලාට විරුද්ධව කටඋත්තරයක් දෙන්න කියලා. ඇයි, එහෙම කළේ? ඔහු විතරක් නොවෙයි, අත් අඩංගුවට ගත්ත තව පුද්ගලයෙක් උසාවියේදී කියා තිබෙනවා,"මට වද හිංසා කළා, හිජාස් හිස්බුල්ලාට විරුද්ධව කට උත්තරයක් දෙන්න" කියලා. ඇයි එහෙම කළේ? හිජාස්ව රඳවා ගන්න; හිජාස්ට විරුද්ධව නඩු දමන්න.

මේකෙදි වැදගත්ම දේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ "පාපොච්චාරණය" කියන එක සාමාන්‍ය නීතිය යටතේ නැහැ. සාක්ෂි (සංශෝධන) පනත යටතේත් මේක නැහැ. නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ත්‍රස්තවාදී සැකකරුවෙක් අත් අඩංගුවට අරගෙන ඔහු කාගේ හරි නමක් සඳහන් කරනවා නම්, ඒ නම සඳහන් කරන පුද්ගලයාත් අරගෙන ගිහිල්ලා detention orders ගහලා රඳවා තබා ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතේ මෙන්න මේ මූලික හරයන් වෙනස් වෙලා නැහැ. මේ හරය වෙනස් වෙලා නැත්තේ ඇයි කියන එක තමයි අපිට තිබෙන ප්‍රශ්නය. ඒ වාගේම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මේක පාවිච්චි වෙනවා, පුද්ගලයන්ගෙන් පළි ගැනීම සඳහා ඔවුන් අත් අඩංගුවට ගැනීමට. ඒකයි මම අහන්නේ, හිජාස් හිස්බුල්ලාගෙන් පළි ගන්න කාටද වුවමනා වුණේ කියලා. හිජාස් හිස්බුල්ලා මේකට පටලවන්න තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කාටද වුවමනාව තිබුණේ? මෙය පිටුපස්සේ ඉඳගෙන, හිජාස් හිස්බුල්ලා ගැන සැකකාරයකුගෙන් කට උත්තරයක් ගන්න කියලා ආරක්ෂක අංශයේ නිලධාරින්ට බලපෑම් කළේ කවුද? ඒ දේ කළේ කවුද? එහෙම නම්, දේශපාලනය වෙනුවෙන් තමුන්නාන්සේලා මේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත පාවිච්චි කරලා තිබෙනවා. ඒකයි අපි කියන්නේ, මේ පනත ඕනෑම ආණ්ඩුවක් යටතේ කාට හරි විරුද්ධව පාවිච්චි කරන්න පුළුවන් කියලා.

ගරු අධිකරණ ඇමතිතුමනි, අද විශාල තරුණ ප්‍රජාවක් තවම අත් අඩංගුවේ ඉන්නවා. ඔවුන්ට කිසිදු ආකාරයේ චෝදනා එල්ල වෙලා නැහැ. අනෙක් පැත්තෙන්, සහරාන් එක්ක වැඩ කරපු, චෝදනාවන් තිබෙන අය නිදොස්කොට නිදහස් කරලා තිබෙනවා. ඒ වාගේ පුද්ගලයන් කිහිප දෙනෙක් නිදහස් වෙලා ගිහිල්ලාත් තිබෙනවා. ඒ ගොල්ලන් ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ රැඳවුම් නියෝග මත හිටපු අය. ඒ අය නිදහස් කළේ කවුද? ඒකත් අපට අහන්න වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජාතික ආරක්ෂාව නාමයෙන් සිවිල් නිදහස සීමා කිරීමට දරන උත්සාහය මඟින් සියලු ප්‍රජාවගේ අරාජික බව වැඩිවන අතරේ, නීතියේ පාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය යටපත් වෙනවාය කියන කාරණයත් මම අවසාන වශයෙන් මතක් කරනවා.

ස්තුතියි.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කළ දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව, නිලූකා ඒකනායක මැතිනිය සභාපතිත්වය දරන කාලයේ කරපු එකක්. අපේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ඒක ඊයේ පෙරේදා මුද්‍රණය වෙච්ච එකක් කියලා. එම කාරණය නිවැරදි විය යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉසුරු දොඩන්ගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.*
*அதன்பிறகு, மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. (DR.) SUREN RAGHAVAN *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

[අ.භා. 3.27]

**ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා**
(மாண்புமிகு இசுரு தொடன்கொட)
(The Hon. Isuru Dodangoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතට සංශෝධන කිහිපයක් ගෙන එන අද දිනයේ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මාහට කාලය ලබාදීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අලුත් පනතක් නොවුණත් මේ පනත වඩාත් විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංශෝධන කිහිපයක් අද දිනයේ මේ ගරු සභාවට යෝජනා කර තිබෙන බව අපි සඳහන් කළ යුතුයි. මෙම පනත ඉදිරිපත් කරලා දැනට වසර 43ක් පමණ වෙනවා. මේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා යම් පුද්ගලයන් සම්බන්ධයෙන් වඩාත් විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය සංශෝධන කිහිපයක් මේ පනත් කෙටුම්පත තුළ අන්තර්ගත වෙනවා.

අපේ රට ත්‍රස්තවාදය නිසා උපරිමයෙන්ම බැට කාපු රටක්. ඒ ගැන අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය නැහැ. තිස් අවුරුද්දක් පුරා පැවති යුද්ධයත්, ඉන් අනතුරුව ඇති වූ ත්‍රස්ත ප්‍රහාරත් නිසා අපේ රටේ ආර්ථිකයට වාගේම ජනතාවට එල්ල වූ බලපෑම සුවිශාලයි කියලා අපි දන්නවා. දශක ගණනාවක් පුරා කිරි දරුවාගේ ඉඳලා වැඩිහිටියා දක්වා වූ අහිංසක ජනතාව වාගේම මේ රටේ ආරක්ෂක අංශවල විශාල පිරිසකුත් ත්‍රස්තවාදී ක්‍රියා නිසා තමන්ගේ ජීවිත අහිමි කර ගත් බව අපි දන්නවා. ඒ වාගේම දශක ගණනාවක් පුරාවට සිදු වූ දේපළ හා ආර්ථික හානි සුළුපටු නොවන බවත් අපි සියලු දෙනාම දන්නවා. අපේ රටේ යම් ආර්ථික අර්බුද නිර්මාණය වෙනවා නම්, ඊට දීර්ඝ කාලීනව පැවති යුද්ධය සහ ත්‍රස්ත ක්‍රියා නිසා එල්ල වූ බලපෑමත් හේතු වන බව අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක තබා ගත යුතුයි. දේපළවලට, ජීවිතවලට වූ හානිය හා සමානව සංචාරක කර්මාන්තයටත් මේ නිසා හානි සිදු වුණා. මේ තත්ත්වය නිසා රටේ ආයෝජන කිරීම්වලට එල්ල වූ බලපෑම සුවිශාල බව අපි සියලු දෙනාම දන්නා කාරණයක්. ත්‍රස්තවාදය නිසා අපේ මව් රටට අත්වූ ඉරණම මෙයයි. අද මෙවැනි සංශෝධන සිදු කළත් රජය විධියට රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් සිදු කරන කැපවීම අංශු මාත්‍රයකින්වත් අඩු නොකරන බවත් අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක් කරනවා. කුමන තත්ත්වයක් මත වුණත් අපි විශ්වාස කරනවා, ජනතාවගේ ජීවත්වීමේ නිදහස සහ මව් බිමේ ආරක්ෂාව අපි ප්‍රමුඛකොට සලකා කටයුතු කළ යුතුයි කියලා.

Mr. Deputy Speaker, we have had a rich and rewarding Debate throughout the day in which various points of view have been expressed by Hon. Members on both sides of the House. I would like to express my genuine appreciation to all of them and also to the Ministers and the officials who worked very hard on this legislation in the Ministry of Justice, the Ministry of Foreign Affairs, the Ministry of Defence and the Attorney -General's Department.

The Hon. Leader of the Opposition used strong language to denounce the present Prevention of Terrorism Act. I agree with him. He used words like, "outdated" and "draconian". He said that there are many serious weaknesses. I am quoting the exact phrase that he used; he said, "There are many serious weaknesses in this legislation." And that is why, Mr. Deputy Speaker, we have brought in these immediate amendments, urgent amendments, to rectify the situation to a large extent. I have indicated succinctly the main areas in which these amendments will have operation: the increased authority of Magistrates and Judicial Medical Officers, day-to-day trials, access to counsel, communication with the next of kin or other close relative, the virtual repeal of Section 15 (2) of the PTA which denies bail in all circumstances - "shall remand" - the court is forced to remand. That is no longer the case. That itself is a very significant amendment. Then, Section 9, which says that the Detention Order shall not be called in question in any proceedings whatsoever. We are making an explicit exception in respect of fundamental rights jurisdiction of the Supreme Court, the writ jurisdiction of the Court of Appeal and habeas corpus applications. So, all of these represent significant changes in the law.

I would like to reiterate what my Colleague, the Hon. Minister of Justice said. These are urgent amendments. We do not want to postpone these until the overall exercise is completed. The House will agree that that is a complex exercise. It is going to take some time but I can assure the Hon. Members of the House that the suggestions that you made will be taken fully into account when we bring before this House a complete legislation dealing with national security in the country. That will be a fresh point of departure, that will completely be a new Statute and it will not take the form of amendments to existing legislation.

The Hon. Lakshman Kiriella, the Chief Opposition Whip, has submitted a series of amendments. I was just saying that we have received the amendments that you have presented. I would like to tell my Friend that we are not in a position to accept those amendments right now. But, I assure you that we will study these very carefully, genuinely, not superficially and we will do our best to extract from those amendments, the substance that you are proposing and all of that will be taken into account when we complete the exercise that we have already embarked upon: that is the comprehensive legislation.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
The amendments I submitted are not only the amendments of the SJB. We have had discussions with all parties and with human rights organizations and those are in line with committee headed by President's Counsel Romesh De Silva.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
So, all the more reason, Hon. Kiriella, to reflect seriously on the content of those amendments, we are certainly happy to do that when we bring before you the complete overall legislation. So, may I thank the House for the cooperation that was extended to us. I have no doubt that this is going to make a definite change in the law. It is going to make a difference on the ground. If the law remains exactly as it is, the position will be far worse than what it would be. These amendments will have be enacted into law and I, therefore, ask all Members of the House, irrespective of party affiliation, to extend their unqualified support to these amendments.

I thank you, Mr. Deputy Speaker.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම. සභාව එකඟද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත සංශෝධනය කළ යුතුයි කියන ස්ථාවරයේ අපි හැම දාම හිටියා. එය ඉවත් කළ යුතුයි කියන ස්ථාවරයේත් අපි හිටියා. නමුත් මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් නැහැ.

ඒ නිසා අපි මේ සංශෝධනවලට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එම නිසා ඒ සඳහා Vote එකක් අවශ්‍යයි.

*බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -*
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the division bells -*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර තමන්ගේ ආසනවල වාඩිවෙන්න. පනත් කෙටුම්පත දෙවන වර කියවීමට පක්ෂ මන්ත්‍රීවරු කොළ පාටත්, විපක්ෂ මන්ත්‍රීවරු රතු පාටත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

ගරු ජගත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා?

**ගරු ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஜகத் புஷ்பகுமார)
(The Hon. Jagath Pushpakumara)
පක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.බී. දිසානායක ඇමතිතුමා?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
පක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා?

**ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා**
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)
පක්ෂයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
විරුද්ධයි.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
විරුද්ධයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

ගරු එච්. නන්දසේන මන්ත්‍රීතුමා, ඔබතුමා ඡන්දය පාවිච්චි කළාද?

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
ඡන්දය පාවිච්චි කළා.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 83: විරුද්ධව 33: වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 83; எதிராக 33; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 83: Noes 33: Abstain 0.*

| | |
|---|---|
| G 003. Nimal Siripala De Silva | Yes |
| G 004. Chamal Rajapaksa | Yes |
| G 005. Johnston Fernando | Yes |
| G 006. Dinesh Gunawardena | Yes |
| G 009. Basil Rohana Rajapaksa | Yes |
| G 010. G.L. Peiris | Yes |

| | |
|---|---|
| G 011. Pavithradevi Wanniarachchi | Yes |
| G 013. Gamini Lokuge | Yes |
| G 016. C. B. Rathnayake | Yes |
| G 017. Keheliya Rambukwella | Yes |
| G 020. Vasudeva Nanayakkara | Yes |
| G 023. Mahindananda Aluthgamage | Yes |
| G 024. Ramesh Pathirana | Yes |
| G 026. Rohitha Abeygunawardhana | Yes |
| G 027. Namal Rajapaksa | Yes |
| G 028. M.U.M. Ali Sabry | Yes |
| G 029. Sarath Weerasekera | Yes |
| G 032. Duminda Dissanayake | Yes |
| G 033. Dayasiri Jayasekara | Yes |
| G 034. Lasantha Alagiyawanna | Yes |
| G 035. Sudarshini Fernandopulle | Yes |
| G 039. Mohan Priyadarshana De Silva | Yes |
| G 044. Janaka Wakkumbura | Yes |
| G 049. Tharaka Balasuriya | Yes |
| G 050. Kanchana Wijesekera | Yes |
| G 051. Indika Anuruddha Herath | Yes |
| G 052. Siripala Gamalath | Yes |
| G 055. Thenuka Vidanagamage | Yes |
| G 056. D. V. Chanaka | Yes |
| G 057. Sisira Jayakody | Yes |
| G 059. Prasanna Ranaweera | Yes |
| G 060. D. B. Herath | Yes |
| G 061. Nalaka Godahewa | Yes |
| G 062. Channa Jayasumana | Yes |
| G 066. John Seneviratne | Yes |
| G 070. Tissa Vitharana | Yes |
| G 071. Dilan Perera | Yes |
| G 078. Rohana Dissanayaka | Yes |
| G 079. Premalal Jayasekara | Yes |
| G 083. K. Kader Masthan | Yes |
| G 084. Ashoka Priyantha | Yes |
| G 085. Jayantha Ketagoda | Yes |
| G 089. Amarakeerthi Athukorala | Yes |
| G 092. Thisakutti Arachchi | Yes |
| G 093. U. K. Sumith Udukumbura | Yes |
| G 094. Pradeep Undugoda | Yes |
| G 095. Sanjeeva Edirimanna | Yes |
| G 096. Akila Ellawala | Yes |
| G 098. Udayana Kirindigoda | Yes |
| G 104. Upul Galappaththi | Yes |
| G 105. Udayakantha Gunathilaka | Yes |
| G 106. Kokila Gunawardene | Yes |
| G 107. Sivanesathurai Santhirakanthan | Yes |
| G 108. Milan Jayathilake | Yes |
| G 109. Kulasingam Dhileeban | Yes |
| G 110. Premitha Bandara Tennakoon | Yes |
| G 112. Chamara Sampath Dasanayake | Yes |
| G 113. Sudarshana Denipitiya | Yes |
| G 114. Isuru Dodangoda | Yes |
| G 115. H. Nandasena | Yes |
| G 116. Sagara Kariyawasam | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 003. Imthiaz Bakeer Markar | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 007. Lakshman Kiriella | No |
| O 015. Selvam Adaikkalanathan | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. G. G. Ponnambalam | No |
| O 018. Ali Sabri Raheem | Yes |
| O 023. Abdul Haleem | No |
| O 026. Harsha De Silva | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 031. Eran Wickramaratne | No |
| O 033. Govindan Karunakaram | No |
| O 034. Dharmalingam Sithadthan | No |
| O 035. Vijitha Herath | No |
| O 036. Harini Amarasuriya | No |
| O 037. Selvarajah Kajendren | No |
| O 039. Sivagnanam Shritharan | No |
| O 040. M. A. Sumanthiran | No |
| O 044. Buddhika Pathirana | No |
| O 046. Nalin Bandara Jayamaha | No |
| O 049. Velu Kumar | No |
| O 052. K. Sujith Sanjaya Perera | No |
| O 054. Imran Maharoof | No |
| O 055. Mujibur Rahuman | No |
| O 058. Charles Nirmalanathan | No |
| O 060. Thavaraja Kalai Arasan | No |
| O 062. Chaminda Wijesiri | No |
| O 063. Hesha Withanage | No |
| O 064. Waruna Liyanage | No |
| O 065. M. Udayakumar | No |
| O 066. W. H. M. Dharmasena | No |
| O 068. Rohana Bandara | No |
| O 082. Gayashan Nawananda | Yes |
| O 084. Anupa Pasqual | Yes |
| O 086. Muditha Prishanthi | Yes |
| O 087. Uddika Premarathne | Yes |
| O 089. Sudath Manjula | Yes |
| O 090. Mayadunna Chinthaka Amal | Yes |
| O 091. Wasantha Yapabandara | Yes |
| O 093. B. Y. G. Rathnasekara | Yes |
| O 094. Kumarasiri Rathnayaka | Yes |
| O 095. Ajith Rajapakse | Yes |
| O 096. Gunathilaka Rajapaksha | Yes |
| O 097. Thilak Rajapakshe | Yes |
| O 098. Upul Mahendra Rajapaksha | Yes |
| O 103. Madhura Withanage | Yes |
| O 104. D. Weerasingha | Yes |
| O 106. Samanpriya Herath | Yes |
| O 108. Yadamini Gunawardena | Yes |
| O 109. Manjula Dissanayake | Yes |
| O 110. Ranjith Bandara | Yes |
| O 113. Charitha Herath | Yes |
| O 114. Marjan Faleel | Yes |

Electronic Voting Results:

| | |
|---|---|
| YES | 83 |
| NO | 33 |
| ABSTAIN | 00 |

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 83යි; නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 03යි. ඒ අනුව, පක්ෂව මුළු ඡන්ද සංඛ්‍යාව 86යි.

විද්‍යුත් ඡන්ද විමසීම අනුව විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 33යි; නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, විරුද්ධව මුළු ඡන්ද සංඛ්‍යාව 35යි.

මේ අනුව, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මතයි.

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Prof.) G.L. Peiris.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

2 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා උදේ වරුවේ මේ සංශෝධන ගැන කියනකොට ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා කිව්වා, මේ සංශෝධන භාර ගන්න බැහැ කියලා. ඒ නිසා මා මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ නැහැ, **table*** කරනවා.

***2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2 ordered to stand part of the Bill.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ සහ 9ආ වගන්ති ඇතුළත් කිරීම)**
வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தில் 9அ மற்றும் 9ஆ என்னும் பிரிவுகளை உட்புகுத்துதல்)
CLAUSE 3. (*Insertion of sections 9A and 9B in the principal enactment*)

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ 18 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'කොට්ඨාසයක් තුළ ද, 9 ආ වගන්තිය ප්‍රකාරව එම රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම සඳහා එම මහෙස්ත්‍රාත්වරයා වෙත, ඒ නියමයේ සහතික කළ පිටපතක්, රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයා විසින්, 9 වන වගන්තිය යටතේ නියමයක් නිකුත් කළ වහාම සහ කවර අවස්ථාවක දී වුව ද, එම නියමය නිකුත් කරනු ලැබූ වේලාවේ සිට පැය හතළිස් අටක් නොඉක්මවීමට පෙර ලැබීමට' "

(2) "2 වන පිටුවේ 30 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) එම සැකකරු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලෙසට සහ එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට විධාන කිරීම; සහ

(ආ) සැකකරුගේ රඳවා තැබීමේ ස්ථානය වෙනස් කරන ලෙසට ආඥාවක් කිරීම,

කරනු ලැබිය හැකි ය.' "

(3) "3 වන පිටුවේ 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කරන්න."

(4) "3 වන පිටුවේ 14 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'යුතු ය.'."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)

### வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 10ஆம் பிரிவை மாற்றீடு செய்தல்)

CLAUSE 4. (*Replacement of section 10 of the principal enactment*)

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ 19 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 11ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 6. (*Amendment of section 11 of the principal enactment*)

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "4 වන පිටුවේ 29 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'වන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) ඒ තැනැත්තාට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා උචිත ආඥාවක් කිරීම; සහ

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් එම තැනැත්තාට භාර දෙනු ලබන අවස්ථාවේ, ඒ තැනැත්තා සම්බන්ධයෙන් වන රඳවා තබාගැනීමේ නියමයක් ද බලාත්මකව පවතී නම්, එම තැනැත්තාගේ රඳවා තැබීමේ ස්ථානය වෙනස් කරන ලෙස ආඥාවක් කිරීම,

කරනු ලැබිය යුතු ය.' "

(2) "5 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය යුතුය.' "

(3) "5 වන පිටුවේ, 11 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන ව්‍යවස්ථාව යටතේ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සිට 9 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகத்திலிருந்து 9ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 7to 9 ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 15ආ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)

### வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தில் 15ஆ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

CLAUSE 10. (*Insertion of new section 15B in the principal enactment*)

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 11 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'එසේ වුව ද, මහාධිකරණය විසින්, සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන්හි දී, 15 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහාධිකරණය විසින් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, සැකකරු ඇප මත නිදහස් කරනු ලැබිය හැකි ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10, as amended, ordered to stand part of the Bill.*

***11 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11 ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
## வாசகம் 12.- (முதன்மைச் சட்டவாக்கத்தின் 26ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 12. (*Replacement of section 26 of the principal enactment*)

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 10 වන පේළිය සහ 11 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන ව්‍යවස්ථාව යටතේ නීති කෘත්‍යයක දී ප්‍රශ්න' "

(2) "7 වන පිටුවේ, 15 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'දෙන ලද යම් විධානයක් අනුව සද්භාවයෙන් කරනලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 12, as amended, ordered to stand part of the Bill.*

***13 සහ 14 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*13ஆம், 14ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 13 and 14 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම ප්‍රශ්නය අහන්නේ බලශක්ති අමාත්‍යතුමාගෙන්.

අද වන විට ඉන්ධන ගෙන්වීම, ඉන්ධන සඳහා මුදල් ගෙවීම, ඉන්ධන බෙදා හැරීම සම්බන්ධයෙන් සමාජයේ විශාල වශයෙන් ගැටලු තත්ත්වයක් මතු වී තිබේ. එම සිදුවීම් අතර මෙරටට ගෙන්වන ලද ඉන්ධනවල ප්‍රමිතිය පිළිබඳව විවිධ මාධ්‍ය වාර්තාවල ප්‍රශ්නසහගත පුවත් පළ වන බැවින්, මෙරටට ගෙන්වන ඉන්ධනවල ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න මම විමසා සිටිමි.

විශේෂයෙන්ම, මේ රටේ බලශක්තිය සම්බන්ධයෙන් ඉතාම ගැටලුසහගත තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන වෙලාවක මෙවැනි ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා අමාත්‍යාංශය භාරගත්තාට පස්සේ, මේ රටේ තෙල් පෝලිම්වල ඉන්න අහිංසක ජනතාව පත් වෙලා තිබෙන ඒ අපහසුතාවෙන් මිදෙන්න, තෙල් ලබා දීම සම්බන්ධව කිහිප වරක්ම දින, වකවානු කිව්වා. අපි සතුටු වුණා, උදය ගම්මන්පිල අමාත්‍යවරයා අමාත්‍යාංශය දාලා යන කොට අපේ නව ඇමතිතුමා එම අමාත්‍යාංශය භාරගෙන ඒ කරපු ප්‍රකාශ සියල්ල මහ පොළොව තුළ යථාර්ථයක් බවට කරයි කියලා. නමුත්, අද මේ මොහොත වන විටත් ඒ ප්‍රශ්නයේ පොඩි අඩුවීමක්වත් වෙලා නැහැ. අඩු වෙලා තිබෙනවා කියලා කවුරු හෝ කියනවා නම්, ඒක අසත්‍යයක්. මේ ප්‍රශ්නය මේ රටේ අහිංසක ජනතාවගේ ජීවිතවලට කොච්චර බලපා තිබෙනවාද කිව්වොත්, ඔවුන්ගේ ජීවිත පවා අහිමි වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

[ගරු හේෂා විතානගේ මහතා]

මේ වෙනකොට ජීවිත හතරක් අහිමි වෙලා තිබෙනවා. මේ වෙනකොට දෛනික කටයුතුවල නිරත වෙන සාමාන්‍ය ජනතාවගේ ජීවිතය සම්පූර්ණයෙන්ම වෙනස් පැත්තකට ගිහිල්ලා තිබෙනවා. තෙල් පෝලිමේ ඉන්න සිදුවීම නිසා තමන්ගේ රැකියාව කර ගන්න බැහැ. තමන්ගේ වෘත්තීය තුළ පැවරිලා තිබෙන වැඩ කටයුතු කර ගන්න කාලයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ පාරිභෝගිකයාට -රටේ ජනතාවට- සල්ලි දීලා තෙල් ටික ගන්න වෙලා තිබෙන්නේ මොන වාගේ ප්‍රශ්න රාශියක් මැද්දේ ද කියන කාරණාව ගැන අපි කථා කරන්න ඕනෑ. ඒක එක කාරණයක්.

අනෙක් කාරණාව, මේ රටේ තෙල් මිල වැඩි වෙනකොට එක පාරටම වැඩි කරගෙන යනවා. හැබැයි, අඩු වෙනකොට කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ හරහා රටේ සමස්ත ජාලයටම, හැම පද්ධතියකටම -ගමනාගමන, ඉදි කිරීම්, නිෂ්පාදන ක්‍රියාවලිය- බලපානවා. ඒ ගැන තැකීමක් නැහැ. හැබැයි, මේ හරහා ආණ්ඩුවේ බදු අය කර ගැනීම -හැම තෙල් ලීටරයකටම ආණ්ඩුව ගහන බදු ටික අය කර ගැනීම- හරියටම පිළිවෙළට කරගෙන යන බව අපට පෙනෙනවා. මම මේ ප්‍රශ්නය යොමු කරනකොට රටේ තිබුණේ වෙන ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තෙල් නිසා අද මිනිස්සුන්ට ජීවිත පැත්තකට දාලා කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ගෙනෙන තෙල්වල ප්‍රමිතිය අහන්නවත්, හිතන්නවත්, කියන්නවත් විධියක් නැහැ. මේවා ඔක්ටේන් 92ද නැත්නම් ඊට වැඩිය හොඳ එකක්ද කියලා දැන ගන්න විධියක් නැහැ. මිනිස්සු පෝලිමේ ඉඳලා ලාම්පුතෙල් හෝ වාහනවලට ගහගෙන යනවා. මිනිස්සුන්ට ඒ තරම්ම තිබෙන්නේ මහා විශාල පීඩනයක්. කාගේ වරදින් හෝ අපි අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේවාට උත්තරයක් හොයා ගන්න බැරි තැනක හිරවෙලා තිබෙනවා. මේ ලබා දෙන තෙල්වල ප්‍රමිතිය ගැන ඇමතිතුමාට සහතිකයක් දෙන්න පුළුවන්ද?

මේ ගැටලුව සමනය වෙන්න, මේ රටේ ජනතාව පෝලිම්වල ඉඳලා මැරෙන එක නවතින්න, මේ රටේ ජනතාවට තෙල් ටික සපයන්න පුළුවන් නිවැරදි ක්‍රමයක් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන්නේ කවදාද කියන කාරණය දැනගන්න කැමැතියි. මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව ප්‍රකාශයක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - வலுசக்தி அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙරටට ගෙන්වන ඉන්ධනවල ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳවයි එතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම මුලින්ම කියන්න ඕනෑ, මම මේ අමාත්‍යාංශය භාර ගන්නකොට විශාල තෙල් අර්බුදයක් තිබුණු බව. පසුගිය කාලයේ තෙල් නියම වෙලාවට ඇණවුම් නොකිරීම නිසා, crude oil ඇණවුම් නොකිරීම නිසා refinery 20 වෙනි දා වෙනකම් පමණයි තිබුණේ. ඒ වාගේම ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් සහ දැව්තෙල්වල හිඟයක් තිබුණා. මේ මොහොත වෙනකොට අපට පුළුවන්කමක් ලැබී තිබෙනවා ටොන් 20,000ක තොගයක් අප අතේ තබා ගෙන බෙදීම් කටයුතු කරන්න. ශ්‍රී ලංකාවේ හැම පිරවුම්හලකටම දවසකට ඩීසල්, පෙට්‍රල් බවුසර් දෙකක් නැත්නම් තුනක් බෙදා හරින තත්ත්වයට දැන් පත් වෙලා තිබෙනවා. අද උදේ පෝලිම් තිබුණත් මේ මොහොත වෙනකොට හුඟක් දුරට පෝලිම් අඩු වෙලා තිබෙනවා. පාරිභෝගිකයන් සඳහා ටොන් 7,000ක තෙල් ප්‍රමාණයක් තමයි අපි දවසකට බෙදා හැරියේ. නමුත් පසුගිය දවස්වල ඒ ප්‍රමාණය ටොන් 10,000ක් බවට පත් වෙලා තිබුණා. වාහනවලට තෙල් ගන්නවා වාගේම කෑන්වලට තෙල් ගැනීමත් විශාල වශයෙන් වැඩි වෙලා තිබුණා. අපි ඒ කටයුත්ත නවත්වන්න නොගියේ, සමහර වෙලාවට ඒ ආකාරයට තෙල් ගෙන යන්නේ ඔවුන්ගේ generator එකට වෙන්න පුළුවන්, කුඹුරු කපන මැෂිමකට වෙන්න පුළුවන්, කර්මාන්තශාලාවකට වෙන්න පුළුවන් නිසා. ඒ නිසා අපි ඒකට තදින් මැදිහත් වුණේ නැහැ. ඒකත් කරගෙන යන්න දුන්නා. දැනට බෙදා හැරීමේ කටයුතු කරගෙන යන නිසා මේ සතිය අවසන් වෙනකොට තෙල් අර්බුදය ගොඩක් දුරට සමනය වෙයි කියලා අපි හිතනවා.

ඒත් එක්කම ඉන්ධනවල ප්‍රමිතිය පිළිබඳව ඔබතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු මෙයයි.

තෙල් තොග පැටවුම් වරායේදී නැව්ගත කිරීමේදී හා පැටවුම් වරායේ සිට ගොඩබෑමේ ස්ථානය දක්වා ප්‍රවාහනයේදී -

I. පිරිපහදු කරන ලද තෙල් ඇණවුම් කිරීමෙන් පසුව සැපයුම්කරුගේ තෙල් ප්‍රවාහන යාත්‍රාව පිළිගැනීම සිදු කරනු ලබන්නේ අදාළ යාත්‍රාව අවසාන වරට ප්‍රවාහනය කරන ලද තෙල් තොග, පිරිපහදු කරන ලද පිරිසිදු පෙට්‍රෝලියම් තෙල් වර්ගදැයි තහවුරු කර ගැනීමෙන් පසුව පමණි. තවද, තෝරාගත් යාත්‍රාවට භාණ්ඩ පැටවීමට පෙර යාත්‍රාවේ ටැංකියේ පිරිසිදු බව සහ වියළි බව පිළිබඳ සහතිකයක් ස්වාධීන තත්ත්ව පරීක්ෂකවරයෙකුගෙන් ලබා ගනු ලැබේ.

II. ඇණවුම් කළ තෙල් තොගය පැටවුම් වරායේදී නැව්ගත කිරීමට පෙර, ගොඩබිමේ ගබඩා කර ඇති ටැංකිවලින් ජාත්‍යන්තර සම්මත ක්‍රමවලට අනුකූලව වෙන වෙනම ලබා ගන්නා සාම්පල, නැව්ගත කරන වරායට ආසන්නයේ ඇති ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාරයක් මඟින් ස්වාධීන තත්ත්ව පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය සහ අනුමැතිය මත පරීක්ෂා කිරීම කරනු ලබයි. CPC ආයතනය විසින් ලබා දී ඇති පිරිවිතරවල ඇති සියලු පරාමිතිවලට අනුකූලව මෙම පරීක්ෂණය සිදු කළ යුතුයි.

III. අදාළ පිරිවිතර ස්වාධීන තත්ත්ව පරීක්ෂකවරු අනුමත කළ පසුව, තෙල් පැටවීමට පෙර අදාළ යාත්‍රාවේ ඇති තෙල් පටවනු ලබන සියලු ටැංකි වෙන් වෙන් වශයෙන් භෞතිකව පරීක්ෂාවකට ද භාජන වේ. මෙමඟින් නැවට තෙල් පැටවීමෙන් පසුව නැව තුළදී තෙල් තොගවලට අහිතකර සංඝටක එක් වීමක් නොවන බව තහවුරු වේ.

තෙල් තොග මෙරට වරායට පැමිණීමෙන් පසු -

IV. තෙල් පැටවූ නෞකාව කොළඹ වරායට පැමිණීමෙන් පසුව ද ගොඩබෑමට පෙර ගොඩබෑමේ වරායේදී පත් කරන ලද පිළිගත් ස්වාධීන තත්ත්ව පරීක්ෂකවරු හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ රසායනාගාර පරීක්ෂකවරු විසින් නැවේ ඇති සෑම ටැංකියකින්ම ජාත්‍යන්තරව පිළිගත් ක්‍රම අනුගමනය කරමින් නියැදි ලබා ගන්නා අතර, එම නියැදි පිරිපහදුව තුළ ඇති රසායනාගාරයේ සහ CPSTL රසායනාගාරයේ දී පරීක්ෂාවට ලක් කරනු ලබයි. තෙල් තොග කොලොන්නාව නිමාවට හා මුතුරාජවෙල පර්යන්තයට ගොඩබෑම සිදු කරනු ලබන්නේ එම රසායනාගාර පරීක්ෂණවලින් තෙල් තොග නියමිත ප්‍රමිතියට ඇති බව තහවුරු කළ පසුව ය. එම ක්‍රමය අනුගමනය කිරීම මඟින් රට තුළට ප්‍රමිතියෙන් තොර තෙල් තොග ඇතුළු වීම වළක්වා ඇත.

V. තවද, මෙම තෙල් මිලදී ගැනීම සිදු කරනු ලබන්නේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩල -ICC- මඟින් ප්‍රකාශිත DAP - Delivery At Place- මත 2010 වසරේදී යාවත්කාලීන Incoterms මඟින් වන අතර මෙහිදී ඇණවුම් කරනු ලැබූ භාණ්ඩවල අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හුවමාරු වන්නේ ගොඩබෑමේ වරායේදී අදාළ සාම්පලවල ප්‍රමිතිය CPC ආයතනයේ පිරිවිතරවලට අනුකූල වන්නේ

නම් පමණි. යම් හෙයකින් මෙම තෙල් තොග පිරිවිතරවලට අදාළව නොපැවතියහොත් නැවේ ඇති තෙල් තොගය භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. එලෙස නැව් තොග ප්‍රතික්ෂේප වුවහොත් කිසිදු මූල්‍ය පාඩුවක් නොවන අතර, මෙමඟින් සිදුවන පාඩුව වන්නේ එම ප්‍රමාණයෙන් තෙල් සංචිත අඩු වීම වන අතර තෙල් තොග ප්‍රතික්ෂේප කිරීම මඟින් කිසිදු වගකීමකට සංස්ථාව නොබැඳේ.

VI. තෙල් තොග ගොඩබෑමෙන් පසුව තොග ගබඩා සංකීර්ණවල ඇති ටැංකිවලින් පරිභෝජනය සඳහා නිකුත් කිරීමට පෙර නැවතත් අදාළ ජාත්‍යන්තර ක්‍රම අනුගමනය කිරීමෙන් අදාළ ටැංකිවලින් නියැදි ලබා ගන්නා අතර, එම නියැදි කොලොන්නාවේ රසායනාගාර මඟින් පරීක්ෂා කරන අතර එම පිරිවිතර ලංකාව තුළ අළෙවි කරන තෙල්වලට අදාළ ප්‍රමිතිවලට අනුකූල නම් පමණක් නිකුත් කරනු ලබයි.

VII. මෙම ගබඩා සංකීර්ණයේ ඇති ටැංකිවලින් පටවන සෑම බවුසරයකටම අදාළ තත්ත්ව පරීක්ෂණ වාර්තාවේ ඡායා පිටපතක් ලබා දෙන අතර, තෙල් තොගය පර්යන්තවලින් පිටවන තෙක් තත්ත්වය ආරක්ෂාකාරීව තහවුරු කර ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තමයි ලංකාවට තෙල් ගෙනෙනකොට ගන්නා ක්‍රියා මාර්ගය. මේ මොහොත වන විට අපි ළඟ දවස් තුනකට, හතරකට අවශ්‍ය තෙල් තොග -ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්- තිබෙනවා. ඒ වාගේම සෑම දවස් හතරකටම සැරයක් ඩීසල් හා පෙට්‍රල් නැවක් එන්න තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලැස්වීම පිළිබඳව අපි ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අද ආපු නැව් ඔක්කොම ඉන්දියානු ණය ආධාර යටතේ ආපු තෙල් නැව්. මේ අතරේ අපි ඇණවුම් කරපු තෙල් නැව් ටිකත් එනවා. එයින් අඩු පාඩුව පිරිමැහෙනවා. ඒ නිසා සිංහල අලුත් අවුරුද්ද වෙනකොට ලංකාවේ තදබල තෙල් හිඟයක් නැතිව පාරිභෝගිකයාට තෙල් ලබා ගන්න පුළුවන් කියන එක ඇමතිවරයා හැටියට මම කියන්න කැමැතියි.

ඊත් එක්කම refinery එක 20වන දා අපට වහන්න සිදු වුණා. අපි දැන් සාකච්ඡා කරගෙන යනවා, මේ මාසය අවසන් වෙනකොට කොහොම හරි crude oil ලංකාවට ගෙන්වා ගන්න. අපට පිරිපහදුවේ තෙල් ටොන් 225,000ක තොගයක් තබා ගන්න පුළුවන්. ඒ ප්‍රමාණයෙන් අඩක්වත් ගෙන්වා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු කිරීමට අපි දැන් සාකච්ඡා කරගෙන යනවා. මම විශ්වාස කරනවා, හෙට නැත්නම් අනිද්දා වනකොට ගිවිසුම් අත්සන් කරලා, දවස් 14ක් ඇතුළත අපට ටොන් 90,000ක නැවක් නැත්නම් නැව් දෙකක් ලංකාවට ගෙන්වා ගන්න පුළුවන් වෙයි කියලා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව නැහැ, ගරු මන්ත්‍රීතුමා. නමුත්, ඉතා කෙටියෙන් අහන්න.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු ඇමතිතුමනි, ඔබතුමා crude oil ගෙනැල්ලා ආපහු සැරයක් පිරිපහදු කටයුතු පටන් ගන්න හදනවා නේ. ඒ අදහසේ ඉන්නවා නම්, දැන් තෙල් මිල අඩු වෙලා තිබෙන නිසා ඒ සහනය ජනතාවට දෙන්න පුළුවන්කමක් තිබෙනවාද? නැත්නම් මේ විදියටම ද අපට ඉස්සරහට යන්න වෙන්නේ?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

තෙල් මිල අඩු වෙලා නැහැ. අපි තෙල් මිල වැඩි කළේ, පෙබරවාරි මාසයේ තිබුණු මිල ගණන් අනුව ගණනය කරලායි. රුසියාවේ යුද්ධය නිසා තමයි මාර්තු මාසයේ තෙල් බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 130 දක්වා වැඩි වුණේ. ඇමෙරිකානු ඩොලර් 130ට තිබුණු තෙල් බැරලයක මිල අද ඇමෙරිකානු ඩොලර් 98ට, 100ට විතර අඩු වෙලා තිබෙනවා. නමුත්, අපි ඊටත් වඩා අඩු ගණනක තිබියදියි, එනම් පෙබරවාරි මාසයේ මිල ගණන් අනුවයි තෙල් මිල වැඩි කළේ. නමුත්, ඉදිරියේදී තෙල් මිල විශාල වශයෙන් අඩු වුණොත් අපි මිල අඩු කරන්න ලෑස්තියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න අංක 2, ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු කරන්නේ නාගරික සංවර්ධනය හා නිවාස අමාත්‍යතුමාටයි.

ඇත්තටම මේ ප්‍රශ්නය ඉතාම බරපතළ ප්‍රශ්නයක්. විශේෂයෙන් නාගරික ප්‍රදේශවල සහ ග්‍රාමීය ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් කරන්නේ බොහෝ වෙලාවට අධිකරණය ක්‍රියාත්මක නොවන අවස්ථාවලදී නීතියට පටහැනිව.

i. නාගරික සංවර්ධන පනතේ පවතින්නේ වර්ග අඩි 3,500ට වැඩි අනවසර ඉදිකිරීම් බාධක ඉවත් කිරීම පිළිබඳවයි. නමුත්, වැව් රක්ෂිතවල, ගංගා ඉවුරුවල, ගංගාවල අනවසරෙන් කරන ඉදිකිරීම් පිළිබඳව පළාත් පාලන ආයතනවලට බලතල ලබාදී නැහැ. මේ නිසා අනවසර ඉදිකිරීම් සිදු කරන මුල් අවස්ථාවේදීම ඒවා නතර කිරීමට මහේස්ත්‍රාත් අධිකරණවලට පිවිසීමට එම ආයතනවලට බලතල ලබාදී නොමැත්තේ මන්ද?

ඒ වාගේම, 1987 පළාත් පාලන පනත සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සඳහා අපි යෝජනා කරනවා.

හේතුව මෙකයි. මේ පවතින බලතල ප්‍රමාණය අනුව, පළාත් පාලන ආයතනවලට මෙවැනි ඉදි කිරීම් මුල් අවස්ථාවේදීම නතර කිරීමට හැකියාවක් නොමැති බවටයි බොහෝ විට කරුණු දක්වන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2. දැනට පෞද්ගලික පාර්ශ්ව දිසා අධිකරණයේ නඩු පැවරීම් කළත්, එසේ නඩු කටයුතුවලට පිවිසීමේදී පෞද්ගලික පාර්ශ්වයන්ට ඒ සඳහා විශාල පිරිවැයක් යනවා. මේ නිසා පෞද්ගලික පාර්ශ්ව මේ සඳහා ඉදිරිපත් වන්නේ නැහැ. පළාත් පාලන ආයතනවලට මෙම බලතල ලබා දීමට පළාත් පාලන පනත වැනි පනත් සංශෝධනය නොකරන්නේ මන්ද?

3. දැනට මහවැලි ගඟේ මෙවැනි ඉදි කිරීම් කරනවා. විශේෂයෙන්ම මහනුවර ප්‍රදේශය ගත්තාම, මහවැලි ගඟ ආක්‍රමණය කරලා විවිධ පුද්ගලයන් හෝටල්, නිවාස සහ විවිධ ඉදි කිරීම් කටයුතු කරනවා. නමුත් මහවැලි අධිකාරිය පිහිටු වූ ඒ පනතේම තිබෙන්නේ රුපියල් 500ක දඩයක් ගෙවා නැවත ඒ නීති විරෝධී ඉදි කිරීම පවත්වා ගෙන යන්න පුළුවන් බවයි. නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ ප්‍රකාශ වන්නේ යම්කිසි අවස්ථාවක මෙවැනි ඉදි

[ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා]

කිරීමක් කළාට පසුව ඒ අනවසර ඉදි කිරීම එසේම තිබියදී දඩයක් ගෙවා ඒ අනීතික ඉදි කිරීම නැවත පවත්වාගෙන යන්න පුළුවන් කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්නේ මේකයි. නාගරික සංවර්ධන අධිකාරියට, ඒ වාගේම පළාත් පාලන ආයතනවලට අයත් බල ප්‍රදේශවල එවැනි අනවසර ඉදි කිරීම් සිදු කරන මුල් අවස්ථාවේදීම ඒවා නැවැත්වීමට මහෙස්ත්‍රාත්වරයෙකුට බලතල ලබා දීමට නොහැකි ඇයි? මේවා නතර කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට බලය ලබා දීමට මේ නීතිය සංශෝධනය නොකරන්නේ මන්ද?

එම ප්‍රශ්නයි මා අහන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා (නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா - நகர அபிவிருத்தி, கழிவுப்பொருள் அகற்றுகை மற்றும் சமுதாயத் துப்புரவேற்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. (Dr.) Nalaka Godahewa - State Minister of Urban Development, Waste Disposal and Community Cleanliness)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ඇත්ත වශයෙන්ම කියනවා නම්, මේ ප්‍රශ්නය අමාත්‍යාංශ කිහිපයකටම අදාළ වෙනවා. නමුත් මම මේ අවස්ථාවේ ඒ අමාත්‍යාංශ සියල්ල වෙනුවෙන් පොදුවේ මේ ප්‍රශ්නයට උත්තර දෙනවා.

1. වැව් රක්ෂිතවල, ගංගා ඉවුරුවල, ගංගාවල අනවසරයෙන් කරන ඉදි කිරීම් සහ ඕනෑම අනවසර කටයුත්තක් පාලනය කිරීමේ නීතිමය බලය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන හා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු වෙනවා.

   ඒ අතර නාගරික සංවර්ධන අධිකාරි පනත අනුව නාගරික බල ප්‍රදේශයකට අයත් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පවතින වැව් රක්ෂිතවල, ගංගා ඉවුරුවල, ගංගාවල අනවසරයෙන් කරන ඉදි කිරීම් ඉවත් කිරීමේ බලතල නාගරික සංවර්ධන අධිකාරියට තිබෙනවා.

   ඉහත ප්‍රශ්නයේ සඳහන් පරිදි නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ වර්ග අඩි 3,500ට වැඩි අනවසර ඉදි කිරීමක් සඳහා පමණක් බාධක ඉවත් කළ හැකියි කියන කතන්දරය වැරැදියි. මොකද, නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ බලපත්‍රයක් රහිතව ඉදි කර ඇති සියලු ඉදි කිරීම් අනවසර ඉදි කිරීම් ලෙස සලකනවා. ඒ අනුව පනත ප්‍රකාරව ඕනෑම අනවසර ඉදි කිරීමකට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරා නියෝගයක් ගන්න පුළුවන්.

   නාගරික බල ප්‍රදේශයට අයත් ලෙස ප්‍රකාශ කර ඇති ප්‍රදේශවල එම බලතල ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරියට සෘජුව වාගේම නාගරික සංවර්ධන අධිකාරි පනතේ බලතල අභිනියෝජනය කර ඇති පළාත් පාලන ආයතනවලට නෛතිකව හැකියාව තිබෙනවා. සමහර විට නොදැනුවත්කම නිසා මෙය ක්‍රියාත්මක නොවනවා වන්නට පුළුවන්. මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවලට, වැව් රක්ෂිතවල, ගංගා ඉවුරුවල හා ගංගාවල අනාරක්ෂිත හා අන්තරායදායක යම් අනවසර ඉදි කිරීමක් හෝ සිද්ධියක් වෙයි නම්, මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමකින් තොරව ලිඛිත දැනුම් දීමක් මඟින් ඉවත් කිරීමට දැනටමත් ප්‍රතිපාදන තිබෙනවා.

2. පළාත් පාලන ආයතන සම්බන්ධ පනත් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වෙනවා. අපි ඔබතුමාගේ ප්‍රශ්නය ඒ අයට දැනටමත් යොමු කර තිබෙනවා.

   ඒ කෙසේ වෙතත්, නාගරික සංවර්ධන අධිකාරි පනතේ 23 (5) වගන්තිය අනුව නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර තිබෙන පළාත් පාලන බල ප්‍රදේශවලට බලතල දැනටමත් අභිනියෝජනය කර තිබෙනවා. ඒ අනුව පළාත් පාලන ආයතනවලට නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ අනවසර ඉදි කිරීම්වලට නඩු පවරා එකී අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමට දැනටමත් හැකියාව තිබෙනවා. මේ නඩු පැවරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය නීතිමය දැනුවත් කිරීම සිදු කරනවා.

3. මෙම ප්‍රශ්නයේ සඳහන් වෙනවා, "මහවැලි ගඟේ මෙවැනි ඉදි කිරීමක් කළොත් නඩු තීන්දුව ලැබෙන්නේ රුපියල් 500ක දඩයක් පමණි." කියලා. මේ කරුණත් සෘජුවම නාගරික සංවර්ධන අධිකාරියේ විෂය පථයට අදාළ වන්නේ නැහැ. නමුත් අපට වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුම් දී තිබෙනවා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය රෙගුලාසි යාවත්කාලීන කිරීම සඳහා දැනටමත් ගැසට් පත්‍රයක් කෙටුම්පත් කර තිබෙන බවත්, එය නුදුරු කාලයේදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිත බවත්.

නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට පටහැනිව කර ඇති අනවසර ඉදි කිරීම් සඳහා කිසිම අවස්ථාවක අනුමැතිය ලබා දීමට කටයුතු කරන්නේ නැහැ. ඒ වාගේම අනුමත සැලැස්මක් නැතිව කරනු ලබන සියලු ඉදි කිරීම්, අනවසර ඉදි කිරීම් ලෙසයි අප සලකන්නේ. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරි පනත ප්‍රකාරව එවැනි කරුණක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන්න පුළුවන්.

හැබැයි, යම් අනවසර ඉදි කිරීමක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වන අවස්ථාවකදී, අධිකරණයේ අවසරයට යටත්ව අදාළ විත්ති පාර්ශ්වයට සංශෝධිත සැලැස්මක් ඉදිරිපත් කර අනුමත කර ගැනීමේ නීතිමය අයිතියක් තිබෙනවා. එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන රෙගුලාසිවලට අනුකූල වනවා නම් පමණයි සේවා ගාස්තු අය කිරීමට යටත්ව විෂයගත කටයුත්තට අනුමැතිය ලබා ගැනීමේ හැකියාව තිබෙන්නේ. ඉදි කිරීම රෙගුලාසිවලට අනුකූල වන්නේ නැත්නම්, ඒ ඉදි කිරීම මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාව අනුව ඉවත් කරන්න පුළුවන්. ඒ අනුව ඉහත කරුණු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය පනතේ දැනටමත් ප්‍රතිපාදන තිබෙන අතර, ඉදිරියේදී මේ කටයුතු තවදුරටත් විධිමත් කිරීම සඳහා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමට අපි සූදානම්ව සිටිනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා.5.10ට, 2022 මාර්තු 23 වන බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.10 மணிக்கு பாராளுமன்றம், 2022 மார்ச் 23, புதன்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.10 p.m. until 10.00 a.m. on Wednesday, 23rd March, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.